# සංස්කෘත භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

## 13 වැනි ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

**සංස්කෘත භාෂාව**

**ගුරු මාර්ගෝපදේශය**

**13 වැනි ශ්‍රේණිය**

**ප්‍රථම මුද්‍රණය 2018**

**© ජාතික අධ්‍යාපන ආයතනය**

ISBN

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk

**විද්‍යුත් තැපෑල** : info@nie.lk

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කිකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කිකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූලව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකි තාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිත්‍ර විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදාගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරාගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ්‍ය ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ්‍ය ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කිකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ්‍ය ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුශලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම යි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී රචනයෙන් දායකත්වය ලබා දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද ආයතන සභාවේ ද සියලු ම සම්පත් දායකයන් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කරගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර,**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ඕම්! ගුරුර්බ්‍රහ්මා, ගුරුර්විෂ්ණුඃ - ගුරුර්දේවෝ මහේශ්වරඃ,
ගුරුඃ සාක්ෂාත් පරං බ්‍රහ්මා - තස්මෛ ශ්‍රී ගුරවේ නමඃ

ගුරු අබිමුවෙහි හිඳ ගුරු මුඛයෙන් සිප් සතර හදාරන්නට සැරසෙන මානවකයා තම ගුරු දෙවි නමස්කාර කරනු වස් සජ්ඣායනය කරනු ලබන ඉහත ගුරු වන්දනා ස්තෝත්‍රය අප උගත්තේ සංගීත ශිල්පය හා සබැඳිව ය. එහි බස සංස්කෘතය යි. උච්චාරණය අති ගාම්භීරයි. එම නිසා ම ගුරුවරයා හා ශිල්පය කෙරෙහි අත්‍යන්ත භක්තියක්, විශ්වාසයක් හා ගෞරවයක් සිසු හද නිරායාසයෙන් ජනිත කරයි.

එනයින් බලන කල සංස්කෘත භාෂාව සංගීතය, නර්තනය, චිත්‍ර, නාට්‍ය යන ලලිතකලාවන්හි සම්භාව්‍යමය, ගැඹුරු ආශ්වාදනීය හා අධ්‍යාත්මික ගුණය පළ කරන්නට සපයා ඇත්තේ ඉමහත් පිටිවහලකි. උතුම් මානව ගුණ විදු පියසෙහි අප දරුවන් හදාරන සෑම විෂයයක් තුළින්ම අත්පත් කර ගෙන යහගුණ සපිරි ගුරු සිසු සබඳතාවක් ගොඩනගන්නට වසර තුන් හාර දහසක් ඉපැරණි මෙවන් වටිනා ශ්ලෝක පාසලේ පොදු ඉගෙනුම් සම්පත් බවට පත්විය යුතු යැයි හඟිමි.

එබැවින් අවසන් විභාගයක අගැයීමකට විෂයයක් වශයෙන් හදාරන්නට පෙරාතුව, වටිනා සංස්කෘත ශ්ලෝක පාඨ කිහිපයක් වත් පොදුවේ දරුවන්ට පාසල තුළින් ලැබුණහොත්, එය ශික්ෂාකාමී, විනයගරුක බව තැන්පත් බව එම ජීවිතවලට එකතු කරගන්නට ඔවුනට අවස්ථාව උදා කර දෙනු ඇත. වර්තමානයේ මෙවැනි සම්භාව්‍යය භාෂා මළභාෂා ලෙස හඳුන්වන්නේ මෙබස යුරෝපීයන් පවා පිළිගන්නා බැව් නොදන්නා පිරිස විය හැකිය.

"Sanskrit is the greatest language of the world"
-Friedrich Max Muller (Philologist & Orientalist)-

සංස්කෘතය ලෝකයේ ඉහළ ම ප්‍රාචීන සම්භාව්‍යය භාෂාවක් ලෙස ජර්මන් ජාතිකයෙකු වූ මෙවන් පඬිවරුන් පවා පිළිගනිත් දී සංස්කෘතය අසලින් ම ඇති හෙළ බස වහරන අප ඉන් කොතරම් ආලෝකයක් ලැබිය යුතු ද? එම නිසා හෙළ බසෙහි අගය තව තවත් අපේ දරුවන්ට දැනෙන්නට මෙන් ම, හෙළ බස වඩාත් නිවැරදිව හා ශක්තිමත්ව වහරන්නට, යොදන්නට සංස්කෘත භාෂාව ඉගෙනුමෙහි උනන්දුව වැඩි දියුණු කිරීම අප විසින් කළ යුතු ය.

ඒ අනුව ජාතික අධ්‍යාපන ආයතනයේ සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය, සංස්කෘත භාෂා විෂයය සඳහා සකසන ලද උසස් පෙළ විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශය, අප සතුව ඇති ඉතා අල්ප වූ සුවිශේෂි විෂය පිළිබඳ ප්‍රවීණයන්ගේ දායකත්වයෙන් ඉටු කරන ලද උතුම් ජාතික මෙහෙවරක් ලෙස මා අගයමි. මෙම ජාතික කාර්යය හරවත් ව, ඵලවත් ව ගොනු කොට ගැනීමට දායක වූ සැමට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

සංගීත විශාරද, ශාස්ත්‍රපති සුදත් සමරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්,
ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමතිය** - ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය විශේෂඥ උපදේශනය** මහාචාර්ය වෝල්ටර් මාරසිංහ
(සංස්කෘත විෂය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය)

**විෂය සම්බන්ධීකරණය** - පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය), අංශ ප්‍රධාන, සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

## ලේඛක මණ්ඩලය

**අභ්‍යන්තර ලේඛක මණ්ඩලය**

01. පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) (රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, (විශිෂ්ට පන්ති) පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට පන්ති) පශ්චාද් උපාධි උපදේශන ඩිප්ලෝමා, අධ්‍යාපනපති) ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

**බාහිර ලේඛක මණ්ඩලය**

01 මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි (අංශාධිපති) (රාජකීය පණ්ඩිත, ආචාර්ය) සංස්කෘත අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

02 ආචාර්ය පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) (රාජකීය පණ්ඩිත, ආචාර්ය) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල

03 පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි (සංස්කෘත විෂය උපදේශක) (රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති) පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල

04 පූජ්‍ය මල්අස්නේ තිලකවංශ හිමි (ගුරු උපදේශක), (රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති) ගම්/සිරි සුමංගල මහ පිරිවෙන, වලලියද්ද, එල්ලක්කල

05 ඒ.කේ.එච්. ධර්මප්‍රිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) (රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල

**විෂය සංස්කරණය**

මහාචාර්ය වෝල්ටර් මාරසිංහ (සංස්කෘත විෂය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය)

**භාෂා සංස්කරණය**

ආචාර්ය පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) (රාජකීය පණ්ඩිත, ආචාර්ය) ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල

**යතුරු ලියනය**

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි (සංස්කෘත විෂය උපදේශක)

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සංස්කෘත භාෂාව, පාසල් හා පිරිවෙන් තුළ ප්‍රචලිත කිරීමේ උදාර අරමුණෙන් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ 13 ශ්‍රේණියේ මෙම ගුරු මාර්ගෝපදේශය නිපුණතා පාදක ව සම්පාදනය කර ඇත. ශිෂ්‍යයා කෙරෙහි වඩාත් පරිපූර්ණ ශික්ෂණයක්, විචාරපූර්ව චින්තනයක්, ප්‍රගතිශීලී නිර්මාණ කෞශල්‍යයක් උත්පාදනය කිරීම මේ මඟින් අපේක්ෂා කෙරේ. පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා තුළ ධනාත්මක වූත් ප්‍රබෝධාත්මක වූත් සිතිවිලි හා ක්‍රියාකාරකම් නොමැති නම් 'උල්පතට ඉහළින් ගඟ ගලන්නේ නැතිවා සේ' අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත නොහැකි ය. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ වටිනා ම සම්පත වූ ගුරු සම්පතට අයත් ඔබගේ උද්‍යෝගය මත මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් ප්‍රායෝගික වනු ඇත. ඒ අනුව මෙම ගුරු මාර්ගෝපදේශය මුල සිට (අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩයේ සිට) සැලකිල්ලෙන් කියවා හොඳින් අවබෝධ කරගැනීම අත්‍යවශ්‍ය වේ.

2007 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නිපුණතා පාදක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳ ගුරුවරයකු වශයෙන් ඔබ මේ වන විටත් මනා අවබෝධයක් ලබා ඇත. යම් විෂයයක් පිළිබඳ සිසුන් නිපුණයන් වීමට නම් ඇසීම, දැකීම හා කිරීම යන අංශ තුනෙහි ම ක්‍රියාකාරී ව යෙදිය යුතු ය. තමා උගත් දේ ප්‍රායෝගික ජීවිතයේ දී සුසංයෝග කොට යොදාගැනීමේ හැකියාව ඇත්නම් ඔහු නිපුණයෙකි.

2018 වර්ෂයේ සිට ඔබ භාවිත කරන මෙම ගුරු මාර්ගෝපදේශය මඟින් දරුවන් විභාගයෙන් සමත් කරවීම පමණක් එක ම අරමුණ නොවිය යුතු ය. ඔබගේ ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයෙන් ශ්‍රේෂ්ඨ ගණයේ පුරවැසියකු බිහි කිරීම ප්‍රධාන අරමුණ විය යුතු අතර විශිෂ්ට ලෙස විභාග සමත්වීම සිසුන් ලබන අතිරේක ප්‍රතිලාභයක් වනු ඇත. අධ්‍යාපනයෙන්, විභාග සමත්වීමේ නිපුණතාව නොව දැහැමි ඵලදායී දිවියක් ගත කිරීමේ නිපුණතාව ඇති කළ යුතු ය.

සංස්කෘත විෂය නිර්දේශයෙහි 13 ශ්‍රේණිය සඳහා නිපුණතා 10ක් දක්වා ඇති අතර පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ පහසුව සඳහා ඒවා නිපුණතා මට්ටම් (පියවර) 37කට බෙදා ඇත. ඒ සඳහා ගුරු මාර්ගෝපදේශයේ පාඩම් ඒකක 29ක් දක්වා ඇත. සෑම ආදර්ශ පාඩම් ඒකකයක් ම ඉගෙනුම් පල ගණනාවකින් සමන්විත වන අතර එම ඉගෙනුම් පල අත් කරගත හැකි ආකාරයට ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය පන්ති කාමරය තුළ සිදු කළ යුතු ය. ගුණාත්මක යෙදවුම් භාවිත කරමින් යෝජිත කාලය තුළ අදාළ විෂය කරුණු ග්‍රහණය කරගැනීමෙන් පසු සිසුන්ට ඉගෙනුම් පල අත් කරගැනීමට හැකි වූ ප්‍රමාණය තක්සේරු කරබැලීම ද පාඩම් ඒකකය අවසානයේ සිදු විය යුතු ය.

පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන්ට හා පන්තියට උචිත පරිදි වඩාත් නිර්මාණශීලී ක්‍රමයක් භාවිත කිරීමට ගුරු භවතාට නිදහස ඇති අතර සිසුන්ගේ නිපුණතා තව දුරටත් සංවර්ධනය වීම සඳහා වැඩි දුර ගවේෂණයට යොමු කළ යුතු ය. මෙම ගුරු මාර්ගෝපදේශය තුළ කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නො ඉක්මවන පරිදි පාඩම් ඒකකවලට යොදා ඇති කාලච්ඡේද සංශෝධනයකර ගැනීමට හා පන්ති කාලසටහනට අනුව පාඩම් ඒකක කළමනාකරණය කරගැනීමට ඔබට අවකාශ ඇත. ගුරු මාර්ගෝපදේශය අවසානයේ දක්වා ඇති තක්සේරු හා ඇගයීම් ක්‍රියාවලියට අදාළ නිදර්ශක ආධාරකය ගුරු කොට නිපුණතා 10 ආවරණය වන පරිදි 13 ශ්‍රේණියේ දී ඇගයීම් 09ක් සිදු කළ යුතු ය. ඒ සඳහා විස්තර පාසල පදනම් කරගත් තක්සේරුකරණය කොටසේ දක්වා ඇත.

රාජකීය පණ්ඩිත, අධ්‍යාපනපති පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි
(ව්‍යාපෘති ප්‍රධාන හා අධ්‍යයන අංශප්‍රධාන)

# පටුන

| | | පිටු අංකය |
|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය | iii |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iv |
| 03 | විෂයමාලා කමිටුව | v |
| 04 | ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| 05 | පටුන | vii |
| 06 | විෂය හැඳින්වීම | ix |
| 07 | ජාතික අරමුණු | x |
| 08 | මූලික නිපුණතා | xi |
| 09 | විෂය අධ්‍යයනයේ අරමුණු | xiii |
| 10 | විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදාගැනීමට යෝජිත සැලැස්ම | xiv |
| 11 | විෂය නිර්දේශය | xv |
| 12 | පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය | xxii |
| 13 | තක්සේරුව හා ඇගයීම | xxiii |
| 14 | ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | xxiv |
| 15 | 1. ඒකකය - සංස්කෘත වර්ණමාලාව, අක්ෂර වර්ගීකරණය හා සංයුක්තාක්ෂර | 1 |
| 16 | 2. ඒකකය - සංස්කෘත කියවීමේ හා ලිවීමේ පරිචය | 3 |
| 17 | 3. ඒකකය - පද වර්ග | 5 |
| 18 | 4. ඒකකය - පද භාවිතය | 7 |
| 19 | 5. ඒකකය - ලිංග, විභක්ති හා කාරක | 9 |
| 20 | 6. ඒකකය - සන්ධි ප්‍රභේද, ධාතු ගණ හා ලකාර | 12 |
| 21 | 7. ඒකකය - තද්ධිත පද හා කෘදන්ත පද | 18 |
| 22 | 8. ඒකකය - සමාස පද | 21 |
| 23 | 9. ඒකකය - ප්‍රත්‍යයාර්ථ ක්‍රියා | 23 |
| 24 | 10. ඒකකය - අව්‍යය පද | 25 |
| 25 | 11. ඒකකය - අර්ථාවබෝධය (නිර්දිෂ්ට ගද්‍ය) | 27 |
| 26 | 12. ඒකකය - අර්ථාවබෝධය (නිර්දිෂ්ට පද්‍ය හා මිශ්‍ර කාව්‍ය) | 29 |
| 27 | 13. ඒකකය - සාහිත්‍ය නිර්මාණ | 31 |
| 28 | 14. ඒකකය - සාහිත්‍ය රසාස්වාදය | 33 |
| 29 | 15. ඒකකය - සාරධර්ම හඳුනාගැනීම | 35 |
| 30 | 16. ඒකකය - සාරධර්ම ඇගයීම | 37 |
| 31 | 17. ඒකකය - භාෂණයේ යෙදීම (ප්‍රශ්න හා පිළිතුරු) | 39 |
| 32 | 18. ඒකකය - භාෂණයේ යෙදීම (සංවාද) | 41 |
| 33 | 19. ඒකකය - ප්‍රායෝගික ව්‍යවහාර | 43 |
| 34 | 20. ඒකකය - ශ්‍රවණය හා අර්ථාවබෝධය | 45 |
| 35 | 21. ඒකකය - සවන් දී නිවැරැදි ව ප්‍රතිචාර දැක්වීම | 47 |
| 36 | 22. ඒකකය - ස්වාභාවික පරිසරය | 49 |
| 37 | 23. ඒකකය - සංස්කෘතික පරිසරය | 51 |
| 38 | 24. ඒකකය - නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය | 53 |
| 39 | 25. ඒකකය - මාධ්‍ය භාෂාගත නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය | 55 |
| 40 | 26. ඒකකය - සංස්කෘත මහාකාව්‍ය සාහිත්‍යය | 56 |
| 41 | 27. ඒකකය - සංස්කෘත ඛණ්ඩකාව්‍ය සාහිත්‍යය | 57 |
| 42 | 28. ඒකකය - සංස්කෘත ශතකකාව්‍ය සාහිත්‍යය | 59 |
| 43 | 29. ඒකකය - සංස්කෘත උපදේශ කථා සාහිත්‍යය සහ නාට්‍ය සාහිත්‍යය | 61 |
| 44 | පාසල පදනම් කර ගත් තක්සේරුකරණය - හැඳින්වීම | 64 |
| 45 | ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය | 66 |

# 13 ශ්‍රේණිය

# සංස්කෘත

## විෂය නිර්දේශය

## විෂය හැඳින්වීම

ලෝකයේ ප්‍රචලිත ව පැවැති හා පවතින සියලු භාෂා ඇතැමුන් විසින් ජීවභාෂා, මෘත භාෂා හා සම්භාව්‍ය භාෂා යනුවෙන් වර්ගත්‍රයයකට බෙදා දක්වනු ලැබේ. ජීවභාෂා යනු අද්‍යතන ව්‍යවහාරයේ පවතින සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ජර්මන්, ජපන් ආදි භාෂාවෝ ය. මෘතභාෂා හෙවත් මළබස් යනු කලින් ව්‍යවහාරයේ පැවැත, අද ව්‍යවහාරයෙන් ගිලිහී ගොස් ඇති භාෂා ය. මධ්‍යතන ප්‍රාකෘත භාෂා වූ සෞරසේනී, අපභ්‍රංශ, ආවන්තී, ප්‍රාච්‍යා ආදිය උදාහරණ ය. බහුතර ජනයා විසින් වැවහර නොකරනු ලබන භාෂා වුව ද, ආගමික හා ශාස්ත්‍රීය අගයකින් යුත් ලතින්, සංස්කෘත හා පාලි වැනි භාෂාවෝ සම්භාව්‍ය භාෂා ගණයට අයත් වෙති.

ලෝකයේ පවත්නා සම්භාව්‍ය භාෂා අතුරින් සංස්කෘතයට හිමි වන්නේ අද්විතීය ස්ථානයෙකි. යුරෝපයේ හා ආසියාවේ ප්‍රචලිත ග්‍රීක හා ලතින් ඇතුළු භාෂා බහුතරයෙක මූලභාෂාව වශයෙන් සැලැකෙන්නේ සංස්කෘතය යි. එය ඉතා පොහොසත් වාක්කෝෂයකින් හා අතිශයින් සංකීර්ණ ව්‍යාකරණයකින් ද සමන්විත අතිප්‍රබල පෞරුෂයක් ඇති භාෂාවකි. ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් උරුම කොට ඇති එය සංගීතය, නර්තනය, නාට්‍යය, චිත්‍රකලාව, මූර්තිශිල්පය ආදී පෙරදිග කලා මෙන් ම, කාව්‍යශාස්ත්‍රය, වෛද්‍යවිද්‍යාව, පුරාවිද්‍යාව, ආයුර්වේදය, ජ්‍යොතිශ්ශාස්ත්‍රය ආදි ශාස්ත්‍රීය විෂයයන් සමඟ ද අත්‍යන්තයෙන් බැඳී-පවත්නා වූ භාෂාවකි. සිංහලය හා සියලු උත්තර භාරතීය භාෂා හදාරන විද්‍යාර්ථීනට එබස පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම ඉතා ප්‍රයෝජනවත් ය. අද ප්‍රචලිත හින්දී, ගුජරාටී, මරාටී ආදි සියලු භාරතීය භාෂා දොඩන්නවුනට වඩා සංස්කෘත වචන නිවැරැදි ව උච්චාරණය කළ හැක්කේ සිංහල භාෂකයනට ය. සිංහල වාක්කෝෂයෙන් සියයට අනූවක් ම සමන්විත ව ඇත්තේ තත්සම ස්වරූපයෙන් භාවිත වන සංස්කෘත වචන හා ඒවායින් බිඳී-ආ තද්භව රූපවලිනි. සංස්කෘතයේ ආධිපත්‍යයට යට වී තිබුණු සිංහලය ඉන් මුදා-ගැනීමට ප්‍රබල සටනක් ගෙන-ගිය කුමාරතුංග මුනිදාසයන් සිංහල ගුරුවරුනට දුන් මුඛ්‍ය උපදේශය නම්, ඔවුන් විසින් පුරාණ භාෂාවක් වශයෙන් සංස්කෘතය අනිවාර්යයෙන් උගත යුතු බව යි. සෙනරත් පරණවිතාන, ආනන්ද කුමාරස්වාමී ආදීන් ලෝපතළ උගතුන් බවට පත් වූයේ, ඔවුන් සතු ව තිබූ සංස්කෘත ඥානය නිසා බව අප අමතක නොකළ යුතු ය.

සංස්කෘතය මළ බසෙකැයි කියමින් එබස ඉගැනීම නිෂ්ඵල ව්‍යායාමයෙකැයි පවසන්නෝ අඥානයෝ ය. සංස්කෘතය කිසි ලෙසෙකිනුත් මළ බසෙක් නො වේ. තව මත් සංස්කෘතයෙන් ග්‍රන්ථ රචනා වෙමින් පවතින අතර, එය මවුබස ලෙස වහරන සුළු පිරිසක් හෝ අද ද භාරතයේ වාසය කරති. ලෝකයේ උසස් යැයි සම්මත විද්‍යානිකේතනයන් වන ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ්, හාර්වර්ඩ්, චිකාගෝ, ජර්මනියේ ගොටින්ජන්, ඕස්ත්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය ආදියෙහි සංස්කෘතය සම්භාව්‍ය භාෂාවක් වශයෙන් ඉගැන්වේ. සංස්කෘත භාෂා අධ්‍යයනය අන් කිසිවකුටත් වඩා වැදගත් වනුයේ ශ්‍රී ලාංකිකයන් වන අපට ය. එබස හදාරන්නා මනා පෞරුෂයකින් හෙබි, සදාචාරසම්පන්න, පරිපූර්ණ මිනිසකු බවට පත් කිරීමේ ශක්තිය සංස්කෘතය සතු ව ඇත. එහෙයින් අපේ පාසල්වල සංස්කෘතය විෂයයක් වශයෙන් හැදෑරීම දිරිමත් කළ යුතු ව ඇත.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරාගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොටගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වාගෙන යාමට සහාය වීම

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කරගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවණීය ස්ථානයක් හිමි කරගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කරගැනීමට දායක වනු ඇත.

**(I) සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කරගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම

**(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුශලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයන්
- චිත්තවේගී බුද්ධිය

**(III) පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුශලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුශලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුශලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුශලතා මෙහි අඩංගු වේ.

**(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම, තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනාගැනීම, හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරාගැනීම, සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුශලතා

**(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහාගැනීම හා ස්වීයකරණය

**(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

**(VII) ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවාගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙනගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබාදීම.

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

## සංස්කෘත භාෂාව විෂය අධ්‍යයනයේ අරමුණු

01. සිංහල හා සංස්කෘත වර්ණ මාලාව පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයකට පෙලඹවීමක් ලැබීම

02. සිංහල භාෂාව නිවැරැදි ව භාවිත කිරීමට මූලාධාර වීම

03. ආයුර්වේදය, ජ්‍යෝතිර්විද්‍යාව වැනි විවිධ ශාස්ත්‍ර, කලා ශිල්ප හා දර්ශනවාද ඉගැනීමේ දී ජීවභාෂාවක් වශයෙන් දැනුම, ආකල්ප, කුශලතා සංවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම

04. ඉන්දියානු භාෂා අධ්‍යයනයට අත්වැලක් සැපයීම

05. පුරාණ ඥාන ගවේෂණය සඳහා උපකාරී වීම

06. වාග්විද්‍යාත්මක භාෂා ගවේෂණයට හා පාරිභාෂික ශබ්දමාලා සම්පාදනයට මූලාධාර වීම

07. සාහිත්‍ය රසාස්වාදයට රුකුලක් වීම

08. සාරධර්ම චරිතාබද්ධ කරගැනීමට සහාය වීම

09. තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැඟීමට මූලාධාර වීම

10. විශ්වීය කේත (Universal code) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සඳහා රුකුලක් වීම

11. හින්දු ස්තෝත්‍ර හා බෞද්ධ ශ්ලෝක, සංස්කෘත භාෂාවෙන් ලියැවී ඇත. ඒවා මඟින් ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සමඟියට අවශ්‍ය දායකත්වය ලබාදීම

# සංස්කෘත විෂය

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදාගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 13 | I | 1.1, 1.2, 1.3, 1.4, 2.1, 2.2, 2.3, 2.4, 2,5, 2.6, 2.7, 2.8,2.9, 3.1, | 100 |
| | II | 3.2, 4.1, 4.2, 4.3, 5.1, 5.2, 5.3 6.1, 6.2, 6.3, 6.4, 6.5, 6.6, 7.1, | 100 |
| | III | 7.2, 8.1, 8.2, 9.1, 9.2, 10.1, 10.2, 10.3, 10.4, 10.5, | 100 |
| | | එකතුව | 300 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1.0 වර්ණමාලාව නිවැරැදි ව හඳුනාගෙන ලියයි. | 1.1 මාධ්‍ය භාෂාවට සාපේක්ෂ ව දේවනාගරී වර්ණමාලාවේ විශේෂතා හඳුනාගනියි.<br><br>1.2 දේවනාගරී වර්ණමාලාව වර්ගීකරණය කරයි.<br><br>1.3 සංකීර්ණ දීර්ඝ සමාස හා විවිධ සංයුක්තාක්ෂර ඇතුළත් ඡේද කියවයි.<br><br>1.4 සංකීර්ණ හා විවිධ සංයුක්තාක්ෂර ඇතුළත් ඡේද කියවන විට ලියයි. | • මාධ්‍ය භාෂාවේ අක්ෂර මාලාව හා දේවනාගරී අක්ෂර මාලාව දේවනාගරී අක්ෂර භාවිතයෙන්<br><br>• දේවනාගරී අක්ෂර ආශ්‍රයයෙන් සංස්කෘත ශබ්දමාලාව ලිවීම හා වර්ග කිරීම (ස්වරඃ හ්‍රස්ව, දීර්ඝ හා සන්ධ්‍යක්ෂර, **ව්‍යඤ්ජනඃ** වර්ගාක්ෂර අන්තඃස්ථාක්ෂර, ඌෂ්මාක්ෂර, අනුස්වාර, විසර්ග හා අනුනාසිකාක්ෂර, ඝෝෂ, අඝෝෂ, අල්පප්‍රාණ, මහාප්‍රාණ ආදිය)<br><br>• කාදම්බරී, දශකුමාරචරිත යන කෘතිවලින් තෝරාගත් ඡේද කිහිපයක්<br><br>• නිතර භාවිත නොවන දේවනාගරී සංයුතාක්ෂර සහිත ඡේද හා වචන ලිවීම | • මාධ්‍ය භාෂාවේ හා දේවනාගරී අක්ෂර මාලාවේ විශේෂතා හඳුනාගෙන භාවිත කරයි.<br><br>• සංස්කෘත ශබ්ද දේවනාගරී අක්ෂරවලින් ගළපා ලියයි.<br><br>• සංයුක්තාක්ෂර බහුල ව භාවිත කරමින් සංස්කෘත වචන ලියයි; කියවයි.<br><br>• සංයුක්තාක්ෂර බහුල වචන භාවිතයෙන් වාක්‍ය තනයි.<br><br>• සංකීර්ණ සමාස බහුල සංයුක්තාක්ෂර ඇතුළත් ඡේද කියවයි; ලියයි.<br><br>• සංයුක්තාක්ෂර සහිත වචනවල ඇති අක්ෂර වර්ගීකරණ වෙන වෙන ම වගුගත කරයි.<br><br>• සංයුක්තාක්ෂර ඇතුළත් ඡේද කියවන විට දේවනාගරී අක්ෂර භාවිතයෙන් ලියා දක්වයි.<br><br>• සංයුක්තාක්ෂර සහිත උද්ධෘත ශ්ලෝක පාඨ ශබ්ද නගා කියවයි. | 13 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2.0 භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි. | 2.1 පද වර්ගීකරණය කරයි.<br>2.2 පද යෝජනය වෙන් කොට හඳුනාගෙන භාවිත කරයි.<br>2.3 ලිඞ්ග, විභක්ති හා කාරක හඳුනාගනියි.<br>2.4 පද සංශ්ලේෂණය හා විශ්ලේෂණය හඳුනාගෙන භාවිත කරයි.<br>2.5 කාරක භේදය, ධාතුගණ හා ලකාර (ආර්ධධාතුක) හඳුනාගනියි.<br>2.6 තද්ධිත හා කෘදන්ත හඳුනාගනියි; භාවිත කරයි.<br>2.7 සමාස භාවිත කරයි.<br>2.8 ප්‍රත්‍යයාර්ථක්‍රියා භාවිත කරයි.<br>2.9 අව්‍යයපද භාවිත කරයි. | • නාමපද (නාම විශේෂණ ඇතුළත් ව), ක්‍රියාපද (ක්‍රියා විශේෂණ ඇතුළත් ව), අව්‍යයපද (නිපාත සහ උපසර්ග) යන වර්ගීකරණ සවිස්තර ව හැඳින්වීම<br>• උක්තාඛ්‍යාත සම්බන්ධය (විස්තර සහිත ව)<br>• ලිඞ්ග භේදය, විභක්ති හා කාරක (විස්තර සහිත ව)<br>• සංකීර්ණ බාහිර සන්ධි හා අභ්‍යන්තර සන්ධි<br>• කර්තෘකරක, කර්මකාරක, භාවකාරක, ධාතු ගණ 2, 3, 7, 8, 9 හා ආර්ධධාතුක ලකාර<br>• තද්ධිත හා තද්ධිත ප්‍රභේද, කෘදන්ත හා කෘදන්ත ප්‍රභේද<br>• සමාස හා සමාස ප්‍රභේද<br>• ඊප්සාර්ථක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා හා අතිශයාර්ථක්‍රියා<br>• උපසර්ග හා නිපාත | • විවිධ ශබ්ද ප්‍රකෘති හා ඒවායින් නිපැයෙන පද, විවිධ ධාතු ප්‍රකෘති හා ඒවායින් නිපැයෙන පද හඳුනාගෙන වර්ග කර දක්වයි.<br>• සංස්කෘතයේ යෙදෙන විවිධ පද වර්ග භාවිත කරමින් සරල වාක්‍ය නිර්මාණය කරයි.<br>• කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය අතර වෙනස පැහැදිලි කරයි; ලියයි.<br>• සන්ධි හා විසන්ධි පද ඇසුරෙන් සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව ලබයි; ලියා දක්වයි.<br>• සාර්වධාතුක හා ආර්ධධාතුක ලකාරවල වෙනස දැන ප්‍රකාශ කොට සරල වාක්‍යවල යොදයි.<br>• විවිධ තද්ධිත ප්‍රභේද, විවිධ කෘදන්ත ප්‍රභේද හා තදීය විශේෂතා දැන පවසයි.<br>• සමාස පද විශ්ලේෂණය හා සමාස පද සැකසීම පිළිබඳ අභ්‍යාසයක යෙදෙයි.<br>• ඊප්සාර්ථ, ප්‍රයෝජ්‍යාර්ථ, අතිශයාර්ථ හා නාම ධාතුකක්‍රියා වෙන් වෙන් ව හඳුනාගෙන ලියයි; භාවිත කරයි.<br>• විශේෂ අර්ථ සහිත උපසර්ග හා නිපාත පද හඳුනාගෙන වාක්‍යවල යොදා ලියා දක්වයි. | 76 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 3.0 කියවා අර්ථය අවබෝධ කරගනියි. | 3.1 සරල ගද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කරගනියි.<br>3.2 සරල පද්‍ය පාඨ හා ගද්‍ය පද්‍ය මිශ්‍ර පාඨ කියවා අර්ථය අවබෝධ කරගනියි. | • ද්විතීයාදර්ශ, තෘතීයාදර්ශ, කථාසරිත්සාගර, හිතෝපදේශ, පඤ්චතන්ත්‍ර, රත්නාවලී, ප්‍රතිඥායෞගන්ධරායණ, ස්වප්නවාසවදත්ත සහ අභිඥානශාකුන්තල යන කෘතිවලින් උපුටාගත් පාඨ | • අර්ථාවබෝධය සහිත ව සරල ගද්‍ය හා පද්‍ය පාඨ කියවයි.<br>• එම පාඨ නිවැරැදි ව මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි. | 27 |
| 4.0 සාහිත්‍ය රසාස්වාදනයේ යෙදෙයි. | 4.1 සාහිත්‍යාත්මක නිර්මාණයක ලක්ෂණ හඳුනාගනියි.<br>4.2 සංස්කෘත ඡන්දෝලංකාර පිළිබඳ සරල අවබෝධයක් ලබාගනියි.<br>4.3 සාහිත්‍යාත්මක පාඨයක රසය විඳගනියි; ප්‍රකාශ කරයි. | • ද්විතීයාදර්ශ, තෘතීයාදර්ශ, කථාසරිත්සාගර, හිතෝපදේශ, පඤ්චතන්ත්‍ර, රත්නාවලී, ප්‍රතිඥායෞගන්ධරායන, ස්වප්නවාසවදත්ත සහ අභිඥානශාකුන්තල, වෘත්තරත්නාකර, කාව්‍යාදර්ශ යන කෘතිවලින් උපුටාගත් පාඨ | • සාහිත්‍ය නිර්මාණයක උපයුක්ත වෘත්ත අලංකාර ආදි මූලික ලක්ෂණ අවබෝධ කොටගෙන නිර්මාණ විචාරයෙහි ප්‍රායෝගික ව යෙදෙයි.<br>• සාහිත්‍යාත්මක චරිත පුද්ගල චරිත හා සංසන්දනය කරයි.<br>• සාහිත්‍ය නිර්මාණයක රසය සාමූහික ව විචාරශීලී ව සාකච්ඡා කරයි. | 26 |
| 5.0 භාෂා සාහිත්‍යය තුළ අන්තර්ගත සාරධර්ම චරිතාබද්ධ කරයි; ප්‍රකාශ කරයි. | 5.1 පාඨයක අන්තර්ගත සාරධර්ම හඳුනාගනියි; චරිතාබද්ධ කරයි.<br>5.2 සාරධර්ම අගයයි; ප්‍රකාශ කරයි.<br>5.3 ශිල්පීය නිපුණතා සඳහා අවශ්‍ය මූලික ප්‍රවේශය ලබයි. | • නලෝපාඛ්‍යාන, ඍතුසංහාර, මේඝදූත, සාවිත්‍ර්‍යුපාඛ්‍යාන, මඤ්ජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යාශාස්ත්‍ර හා චිත්‍රකර්මශාස්ත්‍ර, සෞන්දරනන්ද, චරකසංහිතා, සුශ්‍රැතසංහිතා, අෂ්ටාඞ්ගහෘදයසංහිතා, ජානකීහරණ යන කෘතිවලින් උපුටාගත් පාඨ<br>• ජ්‍යොතිෂය (වෘහත් පාරාසර හෝරා ශාස්ත්‍ර )<br>• සද්ධර්මපුණ්ඩරීක (අධිමුක්ති පරිවර්තය) | • නිර්දිෂ්ට පාඨානුසාරයෙන් හදාළ සාරධර්මවල ඇති සමාජ වටිනාකම තේරුම්ගනියි; හැසිරෙයි.<br>• සංස්කෘත සාහිත්‍යාගත ධීර, වීර, වික්‍රමාන්විත, උදාර චරිත හා සිද්ධි ප්‍රතිනිර්මාණය කරයි.<br>• සාරධර්ම ජීවිතයට බද්ධ කරගන්නා අයුරු සාමූහික ව සාකච්ඡා කරයි.<br>• සංස්කෘත සාහිත්‍යාගත සාරධර්ම කෙටි නිර්මාණ හා රචනා ලෙස ලියා දක්වයි. | 26 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 6.0 නිරවුල් ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි. | 6.1 ප්‍රශ්න අසයි.<br><br>6.2 ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.<br><br>6.3 උපදෙස් ලබා දෙයි.<br><br>6.4 සංවාදයේ යෙදෙයි.<br><br>6.5 මාතෘකාවට අදාළ ව කෙටි දෙසුමක් පැවැත්වීමට සමත් වෙයි.<br>6.6 භාෂාව ව්‍යක්ත ව භාවිත කරයි. | • උචිත භාෂා ප්‍රයෝග භාවිතයෙන් අදහස් පළකිරීම<br><br>• විශේෂ උත්සවයක්, ශිෂ්‍ය සංගම් රැස්වීමක්, භාෂා දිනය වැනි අවස්ථාවක දී සංස්කෘත භාෂාව භාවිත කරමින් දේශනයක් පැවැත්වීම<br><br>• රාමායණ, මහාභාරත, සද්ධර්මමකරන්ද, චරකසංහිතා ආදි ග්‍රන්ථවලින් උපුටාගත් කොටස් | • උචිත භාෂා ප්‍රයෝග භාවිත කරමින් සංස්කෘතයෙන් ප්‍රශ්න ඇසීමට සමත් වෙයි.<br>• යථෝක්ත ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු සංස්කෘතයෙන් සැපයීමට සමත් වෙයි.<br>• සංස්කෘත භාෂා ප්‍රයෝග භාවිත කරමින් උපදෙස් දීමට යොමු වෙයි; සංවාද කරයි.<br>• ආචාර-සමාචාර සඳහා සංස්කෘත ප්‍රයෝග භාවිත කිරීමෙහි යෙදෙයි.<br>• නිවැරැදි ව සංස්කෘත භාෂාවෙන් කථාවක් පැවැත්වීමේ හැකියාව ලබයි; එය ලියයි.<br>• දෛනික සටහන්, දින චරියාව, මෛත්‍රී භාවනාව, සංස්කෘත භාෂාවෙන් ලියයි; කරයි. | 22 |
| 7.0 සවන් දී අර්ථය පැහැදිලි ව හා නිවැරැදි ව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | 7.1 තෝරාගත් ගද්‍ය හෝ පද්‍ය හෝ පාඨවලට සවන් දී අර්ථ අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.<br><br>7.2 ශ්‍රව්‍ය පටවලට හා ශ්‍රව්‍ය දෘශ්‍ය පටවලට සවන් දී, නරඹා අර්ථ අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | • හඬපට හා චිත්‍රපට | • අවබෝධ කරගත් පාඨයන්හි අර්ථය ලියා දක්වයි.<br>• අනිර්දිෂ්ට පාඨයකට වුව සවන් දී අර්ථාවබෝධය ලබා ප්‍රශ්නවලට පිළිතුරු දෙයි; සාරාංශය ඉදිරිපත් කරයි.<br>• ශ්‍රව්‍ය පට හා දෘශ්‍ය පට ශ්‍රවණය කොට, නරඹා අර්ථාවබෝධය ලබා ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.<br>• ශ්‍රව්‍ය හා දෘශ්‍ය පට නිරවද්‍ය ව ප්‍රතිවාචනය කරයි; රඟ දක්වයි; ගායනය කරයි. | 20 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 8.0 අදාළ සංස්කෘතික පරිසරය හඳුනාගනියි. | 8.1 ස්වාභාවික පරිසරය හඳුනාගනියි.<br><br>8.2 භාෂා ශෛලිය හා සාහිත්‍යාගත චරිත හඳුනාගනියි. | • විෂයාබද්ධ ස්වාභාවික වස්තු හඳුනාගැනීම.<br><br>• ඍතුසංහාර, මේඝදූත, සෞන්දරනන්ද, ජානකීහරණ, පඤ්චතන්ත්‍ර, හිතෝපදේශ, අභිඥානශාකුන්තල යන කෘති ඇසුරින් | • නිර්දිෂ්ට කෘති ඇසුරින් සත්ත්ව හා මානව චර්යා, පාරිසරික වෙනස්කම්, සෞන්දර්ය, මනෝභාව, මානව සම්බන්ධතා හඳුනාගෙන ලියයි; අඳියි; ලැයිස්තුගත කරයි; රඟ දක්වයි; අභිරූපණය කරයි; ප්‍රතිනිර්මාණය කරයි; භූමිකා රංගනය කරයි; වෙනස මාධ්‍යයන්ගෙන් ප්‍රකාශ කරයි. | 30 |
| 9.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය කරයි. | 9.1 නිවැරැදි අර්ථය ලැබෙන සේ සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.<br><br>9.2 මාධ්‍ය භාෂාවෙන් සංස්කෘත භාෂාවට ව්‍යාකරණානුකූල ව පරිවර්තනය කරයි. | • සුරභාරතී, ද්විතීයාදර්ශ, අභිනවා පාඨාවලී, සරල සංස්කෘත ශික්ෂකය, සංස්කෘත ප්‍රථම පුස්තකය, සංස්කෘත පාඨමාලා 01, පඤ්චතන්ත්‍ර, හිතෝපදේශ, රාමායණ යන කෘතිවලින් උපුටාගත් කොටස් පරිවර්තනය කිරීම<br><br>• සරල සංස්කෘත ශික්ෂක 02, සුරභාරතී, සංස්කෘත ශික්ෂකය යන ග්‍රන්ථවලින් කොටස් උපුටාගෙන පරිවර්තනය කිරීම, භාෂාවට ආවේණික ප්‍රයෝග යොදාගැනීම | • නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨ, සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවට ද මාධ්‍ය භාෂාවෙන් සංස්කෘත භාෂාවට ද නිවැරැදි ව හා ව්‍යාකරණානුකූල ව පරිවර්තනය කරයි. | 30 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 10.0 සංස්කෘත සාහිත්‍යාගත කෘති හා කතුවරුන් පිළිබඳ අවබෝධය ලබයි. | 10.1 අශ්වඝෝෂ හිමියන්ගේ, කාලිදාසයන්ගේ සහ කුමාරදාසයන්ගේ මහාකාව්‍ය කෘති හඳුනාගනියි.<br><br>10.2 කාලිදාසයන්ගේ හා ජයදේවයන්ගේ ඛණ්ඩකාව්‍ය හඳුනාගනියි.<br><br>10.3 සංස්කෘත ශතකකාව්‍ය සාහිත්‍යය පිළිබඳ ව දැනුමක් ලබාගනියි.<br><br>10.4 සංස්කෘත උපදේශ කථා සාහිත්‍යය සහ නාට්‍ය සාහිත්‍යය පිළිබඳ ව අවබෝධයක් ලබාගනියි.<br><br>10.5 සංස්කෘත නාට්‍ය සාහිත්‍යය පිළිබඳ ව සාමාන්‍ය දැනුමක් ලබාගනියි. | • බුද්ධචරිත, සෞන්දරනන්ද, රඝුවංශ, කුමාරසම්භව හා ජානකීහරණ යන කෘති පිළිබඳ සාමාන්‍ය දැනුමක්<br><br>• ඍතුසංහාර, මේඝදූත හා ගීතගෝවින්ද යන කෘති පිළිබඳ දැනුමක්<br>• නාමාෂ්ටශතක, නීතිශතක, භක්තිශතක, වෛරාග්‍යශතක, අනුරුද්ධශතක හා ශෘඞ්ගාරශතක යන ශතක ග්‍රන්ථ පිළිබඳ අවබෝධය<br><br>• පඤ්චතන්ත්‍ර හා හිතෝපදේශ යන කෘතීන්හි කර්තෘ, කාලය, අන්තර්ගතය, ශෛලිය සහ සාරධර්ම<br><br>• භාස, කාලිදාස, ශූද්‍රක, ශ්‍රී හර්ෂ යන කවීන්ගේ නාට්‍ය කෘති | • අශ්වඝෝෂ, කාලිදාස, කුමාරදාස යන මහාකාව්‍ය රචකයන් පිළිබඳ ව රචනා ලියයි; ශිෂ්‍ය සමිතියේ දී කථා පවත්වයි.<br>• ගීතගෝවින්දාගත ගීත තාලයට ගායනය කරයි; කේවල හා සාමූහික ව රස වින්දනයෙහි යෙදෙයි.<br><br>• සංස්කෘත මහාකාව්‍ය හා ඛණ්ඩකාව්‍ය කර්තෘවරුන් හා ඔවුන්ගේ කෘති පිළිබඳ පුවත්පත් ලිපි සපයයි.<br><br>• ශතක කාව්‍යවල එන කරුණු සාමාන්‍ය ජීවිතයට සම්බන්ධ කරගන්නා අයුරු පෙන්වා දෙයි.<br><br>• උපදේශ ග්‍රන්ථවල කර්තෘ, කාල ආදි තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ප්‍රකට සංස්කෘත නාට්‍ය හා ඒවායෙහි රචකයන් නම් කරයි. | 30 |

## 13 ශ්‍රේණිය

### නිර්දිෂ්ට ග්‍රන්ථ

01. සංස්කෘත ප්‍රවේශ - ගද්‍ය පද්‍යාවලී III, සංස්කරණය - මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි, ආචාර්ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි, මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ, ආචාර්ය කේ.බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඒ.කේ.එච්. ධර්මප්‍රිය - ප්‍රාචී අධ්‍යාපන ආයතනය
02. සංස්කෘත අකුරු ලියමු I, II, III ග්‍රන්ථ, ප්‍රාචී අධ්‍යාපන ආයතනය
03. සංස්කෘත ප්‍රවේශ පාඨමාලා I - ප්‍රාචී අධ්‍යාපන ආයතනය
04. සංස්කෘත ද්විතීයාදර්ශ - දස වැනි පාඩමේ සිට පසළොස් වැනි පාඩම තෙක් (10-15)
05. සංස්කෘත තෘතීයාදර්ශ - දොළොස් වැනි පාඩමේ සිට දහසය වැනි පාඩම තෙක් (12-16)

### ආශ්‍රේය ග්‍රන්ථ

01 සුරභාරතී - මහාචාර්ය ඩබ්.එස්. කරුණාතිලක
02 සංස්කෘත ශික්ෂකය, ප්‍රථම, ද්විතීය පුස්තක - මහාචාර්ය එම්.එච්.එෆ්. ජයසූරිය
03 සංස්කෘත නාමාඛ්‍යාත විවරණය - මහාචාර්ය වරාගොඩ පේමරතන හිමි
04 සරල සංස්කෘත ශික්ෂකය I, II - අතිපූජ්‍ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නාහිමි
05 ආධුනික සංස්කෘත ව්‍යාකරණය - ඒ.ඒ. මැක්ඩොනල්ඩ්
06 වෛදික සාහිත්‍යය - මහාචාර්ය ජයදේව තිලකසිරි
07 සංස්කෘත කාව්‍ය සාහිත්‍යය - මහාචාර්ය ජයදේව තිලකසිරි
07 සංස්කෘත නාට්‍ය සාහිත්‍යය - මහාචාර්ය ජයදේව තිලකසිරි
07 සංස්කෘත ප්‍රථම පුස්තකය - ආර්.ජී. භාණ්ඩාර්කර්
07 සංස්කෘත සාහිත්‍යය - ජී.එස්.බී. සේනානායක

## පිරිවෙන් /පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය

සම්භාව්‍ය භාෂාවක් හා ආගමික භාෂාවක් වශයෙන් සංස්කෘත භාෂාව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මධ්‍යස්ථානවල පුරාතනයේ සිට අද වන තෙක් හැදෑරීම, භාවිතය සිදු වේ. තාක්ෂණික අංශයෙන් දියුණු වී විශ්ව ගම්මානයක් වූ ලෝක ප්‍රජාවගේ ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක සංවර්ධනයට පෙරටත් වඩා පරිපූර්ණ දායකත්වයක් සංස්කෘත භාෂාවෙන් ලබාගත හැකි ය. අන්තර්ජාතික කීර්තියට පත් ශ්‍රී ලාංකික ඇතැම් විද්වතුන් එම තත්ත්වයට පත් වීමේ ප්‍රධාන සාධකය ඔවුන් සතු සංස්කෘත භාෂා නිපුණතාව යි. සංස්කෘත භාෂාව ශාස්ත්‍රීය කටයුතු හා ආගමික කටයුතුවලට පමණක් සීමා නොකොට පිරිවෙන් /පාසල් පද්ධතිය මඟින් සමාජයට නව ආරකින් හඳුන්වා දිය යුතු කාලය එළඹ ඇත. දැනුම ගවේෂණය කරන ක්‍රියාකාරී පුද්ගලයකු වශයෙන් පන්ති කාමරයට පමණක් කොටු වී ලබන අධ්‍යාපනයෙන් බැහැර ව පිරිවෙන/පාසල තුළ විවිධ වැඩසටහන් සංවිධාන කළ යුතු ය. පිරිවෙන් /පාසල් සංස්කෘතියට ගැළපෙන පරිදි සහ පිරිවෙනේ / පාසලේ පවත්නා මානව හා භෞතික සම්පත් අනුව විෂය නිර්දේශයේ සඳහන් නිපුණතා සාක්ෂාත් කරගැනීම සඳහා මෙම වැඩසටහන් සංවිධාන විය යුතු ය.

01. සංස්කෘත භාෂා දින,
02. කණ්ඩායම් සංවාද,
03. මාසික, වාර්ෂික (ශිෂ්‍ය/විෂය) සංගම්වල දී සංස්කෘතයෙන් භාෂණය, ගායනය,
04. කෙටි නාට්‍ය සැකසීම, ඉදිරිපත් කිරීම,
05. බිත්ති පුවත්පත් පළ කිරීම,
06. උපදේශාත්මක සංස්කෘත ශ්ලෝක හා තොරතුරු එක්රැස් කිරීම,
07. මවුබසේ වචන පරිණාමය වී ඇති ආකාරය පිළිබඳ ව සංස්කෘතය ඇසුරින් තොරතුරු රැස් කිරීම ආදි වැඩසටහන් ඒ සඳහා උදාහරණ වේ.

## තක්සේරුව හා ඇගයීම

පිරිවෙන / පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගැනුම්-ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

ඉගෙනුම් කාර්යයේ දී අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගෙනුම් පලවල ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගෙනුම්පලවලට ළඟා වන ආකාරය හඳුනාගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කරගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ ශිෂ්‍යයා නිපුණතා කවර මට්ටමකින් සාක්ෂාත් කරගෙන තිබේ දැයි පරීක්ෂා කළ යුතු වේ. ඒ අනුව ප්‍රබලතා හා දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ, ඉදිරි පෝෂණ වැඩසටහන් සංවිධාන කළ යුතු ය. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම යන අවස්ථාවල දී තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩපිළිවෙළ යනු ශිෂ්‍යයාගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයයේ දී සිසුන් හිමි කරගත් ශ්‍රේණි, ලකුණු ආදිය සසඳා ඔවුන්ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය

සංස්කෘත භාෂාව ශ්‍රී ලංකාව තුළ දිගු කලක පටන් පරපුරෙන් පරපුරට පැවත එයි. ජේතවනාරාම සංස්කෘත සෙල්ලිපිය නමින් ප්‍රකට ව ඇති අභයගිරි සංස්කෘත සෙල්ලිපිය ආදි අභිලේඛන අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකික ජන සමාජය තුළ සංස්කෘත භාෂාව සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ද භාවිත වූ බව යි. සිංහල භාෂා-සාහිත්‍යය වෙත සුවිශාල ආභාසයක් සපයා ඇති සංස්කෘතය දෙමළ භාෂා-සාහිත්‍යය වෙත ද එබඳු ම ආභාසයක් සපයා ඇත. "**සර්වභාෂාසු යා ශ්‍රේෂ්ඨා** " ආදි හැඳින්වීම්වලට අනුව සංස්කෘතය සියලු භාෂාවන් අතර ශ්‍රේෂ්ඨතම වූත්, සියලු ශාස්ත්‍ර සමූහයන්ගෙන් ආඪ්‍ය වූත්, අංග සම්පූර්ණ භාෂාවකි. සිංහල හෝ දෙමළ හෝ මවුබස කොට ඇති ශිෂ්‍යයා ඊට වෙනස් වූ අක්ෂර රටාවක් වෙත යොමු වෙමින් හෝඩිය වශයෙන් ඉඳුරා වෙනස් නොවුව ද විෂමතා හඳුනාගනිමින් හැදෑරිය යුතු සංස්කෘතය ශිෂ්‍යයන් අතර ප්‍රියශීලී විෂයයක් බවට පත් කිරීමටත් එම විෂයය ඉගෙනීම සඳහා ඔවුන් පෙලඹවීමටත් භාෂාව පහසුවෙන් ඉගැනීමේ සාම්ප්‍රදායික විධි ක්‍රම නො ඉක්මවමින් පෙරට වඩා සංස්කෘත භාෂාව ජනප්‍රිය කළ හැකි ය. ඒ සඳහා තුලනාත්මක භාෂා අධ්‍යයන විධි ක්‍රමය වඩාත් උචිත වනු ඇත.

නිපුණතා පාදක අධ්‍යාපනය ජාතික අවශ්‍යතාවක් වන බැවින් සංස්කෘත භාෂාවෙන් පෙරටත් වඩා නිපුණයන් බිහි කිරීම අරමුණු කොට ගවේෂණාත්මක ක්‍රියාකාරකම් ඔස්සේ සිසු නිපුණතා ගොඩනැගෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ඇත.

අතීතයේ සිට පන්ති කාමර තුළ බහුල ව ක්‍රියාත්මක වූ ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රම වූ සම්ප්‍රේෂණ ක්‍රමය (Transmission Role), ගනුදෙනු ක්‍රමය (Transaction Role), ඉක්මවා සිසු චින්තනය අවදි කරන, සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුශලතා සංවර්ධනය කරන පරිණාමන ක්‍රමය (Transformation Role) ගුරුවරයාගෙන් මෙහි දී අපේක්ෂා කෙරේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම සිසුවකු ම ඒ ඒ නිපුණතා සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත්දායකයකුගේ තත්ත්වය පරිණාමන ගුරු භූමිකාවෙන් අපේක්ෂා කෙරේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් උගන්නා අයුරු සමීප ව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනාගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබාදෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැර ව ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්ය වේ.

සංස්කෘත විෂය, අ. පො. ස. (උසස් පෙළ) සම්බන්ධයෙන් ගත් විට භාෂා විෂයයක් වන බැවින් භාෂාවක් ඉගෙනීමේ දී භාවිත කළ හැකි නූතන විද්‍යාත්මක ක්‍රම, එනම් ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යය, සමකාලීන ප්‍රකාශන, අන්තර්ජාලය ආදිය ද භාෂා භාවිතයට කෙටි විද්‍යාත්මක ක්‍රම හා තර්කානුකූල ක්‍රම ද යොදාගත යුතු ය.

## 01. ඒකකය සංස්කෘත වර්ණමාලාව, අක්ෂර වර්ගීකරණය හා සංයුක්තාක්ෂර

**1.0 නිපුණතාව**

වර්ණමාලාව නිවැරැදි ව හඳුනාගෙන ලියයි.

**නිපුණතා මට්ටම**

1.1 මාධ්‍ය භාෂාවට සාපේක්ෂ ව දේවනාගරී වර්ණමාලාවේ විශේෂතා හඳුනාගනියි.

1.2 දේවනාගරී වර්ණමාලාව වර්ගීකරණය කරයි.

**කාලච්ඡේද** 08

**ඉගෙනුම් පල**

- මාධ්‍ය භාෂාවට සාපේක්ෂ ව දේවනාගරී වර්ණමාලාවේ විශේෂතා හඳුනාගෙන භාවිත කරයි.
- සංස්කෘත ශබ්දමාලාව දේවනාගරී අක්ෂර භාවිතයෙන් ලියයි.
- සංස්කෘත වර්ණමාලාව විධිමත් ව වර්ගීකරණය කරයි.
- ශබ්ද වර්ගීකරණයෙහි උපයෝගිතාව හඳුනාගෙන භාවිත කරයි.
- සංයුක්තාක්ෂර නිවැරැදි ව හඳුනාගෙන ලේඛනයෙහි යෙදෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

මාධ්‍ය භාෂාවේ වර්ණමාලාවට සාපේක්ෂ ව සංස්කෘත වර්ණමාලාවේ සුවිශේෂතා හඳුනාගැනීම මගින් සංස්කෘත භාෂාවේ භාවිත වර්ණ පිළිබඳ විධිමත් හා නිවැරැදි අවබෝධය ශිෂ්‍යයාට ලබා දිය හැකි ය. සංස්කෘත භාෂාවේ වර්ණමාලාව, මාධ්‍ය භාෂාවේ වර්ණමාලාවට වඩා වෙනස් වන බව හඳුනාගැනීම අතිශය වැදගත් වේ. එම වර්ණමාලාව සංස්කෘතයට ආවේණික දේවනාගරී අක්ෂරවලින් නිවැරැදි ව ලියන ආකාරය (අක්ෂරයේ ආරම්භය හා රටාව) හා සංයුක්තාක්ෂර ලියන විට මුල් අක්ෂර රූපවලට සාපේක්ෂ ව සංයුක්තාක්ෂරය සකස් වන ආකාරය අනිවාර්යයෙන් ම හදාළ යුතු ය. වර්ණමාලාවේ විධිමත් වර්ගීකරණය පිළිබඳ අවබෝධය ඉදිරි පාඩම්වල දී අතිශයින් උපයෝගි වන නිසා මෙහි දී ඒ පිළිබඳ ව අවධානය විශේෂයෙන් යොමු විය යුතු ය.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- දේවනාගරී වර්ණමාලාව අක්ෂර හතළිස් අටකින් යුක්ත බව
- වර්ණමාලාව ස්වර හා ව්‍යඤ්ජන වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදෙන බව
- ස්වරාක්ෂර: හ්‍රස්ව, දීර්ඝ, සන්ධ්‍යක්ෂර ආදි වශයෙන් ප්‍රභේදගත වන බව
- ව්‍යඤ්ජනාක්ෂර: වර්ග, අන්තඃස්ථ, ඌෂ්මන්, ඝෝෂ, අඝෝෂ, අල්පප්‍රාණ, මහාප්‍රාණ, වර්ගාන්ත, අනුස්වාර, විසර්ග ආදි වශයෙන් ප්‍රභේදගත වන බව
- සංස්කෘත වර්ණමාලාව උත්පත්තිස්ථානයට අදාළ ව කණ්ඨජ, තාලුජ, මූර්ධජ, දන්තජ, ඕෂ්ඨජ, කණ්ඨතාලුජ, කණ්ඨෞෂ්ඨජ, දන්තෞෂ්ඨජ, නාසික්‍යය හා අනුනාසික්‍ය වශයෙන් නැවත ප්‍රභේදගත වන බව
- ව්‍යඤ්ජනයකට ස්වරයක් එකතු වීමේ දී ආරෝපිත ස්වරයට අදාළ පිල්ලම භාවිත වන බව
- ව්‍යඤ්ජනාක්ෂර දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හෝ එකතු වීමේ දී ඊට සංයුක්තාක්ෂර භාවිත කළ යුතු බව
- සංයුක්තාක්ෂර ලිවීමේ දී මූලික අක්ෂර රූප අනුසාරයෙන් සංයුක්තාක්ෂරය සෑදෙන අයුරු විධිමත් ව හැදෑරිය යුතු බව
- සංයුක්තාක්ෂර බහුල ව යෙදී ඇති වචන කියවීමටත් දේවනාගරී අක්ෂර භාවිතයෙන් ලිවීමටත් හුරු කළ යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- මාධ්‍ය භාෂාවේ වර්ණමාලාවට සාපේක්ෂ ව සංස්කෘත වර්ණමාලාවේ සුවිශේෂතා හඳුන්වා දෙන්න.
- වර්ණමාලාව ස්වර හා ව්‍යඤ්ජන ලෙසත්, ස්වර ප්‍රභේද හා ව්‍යඤ්ජන ප්‍රභේද වෙන් වෙන් වත් වර්ගීකරණය කරවන්න. මේ සඳහා ආධාරක වගු, පුවරු ආදිය භාවිත කරන්න.
- ව්‍යඤ්ජන, ස්වර සමඟ එකතු වීමේ දී භාවිත වන පිලි සියලු ස්වරවලට අදාළ ව වෙන් වෙන් ව ලියා දක්වන්න.
- සංයුක්තාක්ෂර ලිවීමේ දී ප්‍රධාන අක්ෂර රූප අනුසාරයෙන් සංයුක්තාක්ෂරය නිමැවෙන ආකාරය ලියා පෙන්වන්න.
- සංයුක්තාක්ෂර බහුල සංස්කෘත වචන ඉදිරිපත් කොට ඒවා කියවීමටත් ලිවීමටත් සලස්වන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- දේවනාගරී වර්ණමාලාව අක්ෂර හතළිස් අටකින් යුක්ත බව ප්‍රකාශ කරයි. ඐ කාරය සහිත ව වර්ණමාලාව අක්ෂර හතළිස් නවයකින් යුක්ත වුවත් එම අක්ෂරය භාවිතයේ නොමැති බව ප්‍රකාශ කරයි.
- ස්වර හා ව්‍යඤ්ජන වශයෙන් වර්ණමාලාව ප්‍රභේද වන අතර හ්‍රස්ව, දීර්ඝ හා සන්ධ්‍යක්ෂර වශයෙන් ස්වරමාලාවේ ප්‍රභේද දක්වයි.
- ව්‍යඤ්ජනාක්ෂර: වර්ගාක්ෂර, අන්තඃස්ථාක්ෂර, ඌෂ්මන් ආදි වශයෙන් වන ප්‍රභේද සහ ඝෝෂ හා අඝෝෂ වශයෙන් ඇති ප්‍රධාන ප්‍රභේද දක්වයි.
- අල්පප්‍රාණාක්ෂර - මහාප්‍රාණාක්ෂර, වර්ගාන්තාක්ෂර යන වර්ගීකරණය හඳුනාගෙන වර්ගීකරණය කරයි.
- අනුස්වාරය හා විසර්ගය ද ව්‍යඤ්ජනාක්ෂර සංඛ්‍යාවට ම ගැනෙන බව දක්වයි.
- කණ්ඨජ, තාලුජ, මූර්ධජ, දන්තජ හා ඕෂ්ඨජ යනුවෙන් ද කණ්ඨතාලුජ, කණ්ඨෝෂ්ඨජ, දන්තෞෂ්ඨජ, නාසික්‍ය සහ අනුනාසික්‍ය ආදි වශයෙන් උත්පත්තිස්ථාන අනුව අක්ෂර වර්ගීකරණය කරයි.
- ස්වරාරෝපණයේ දී අක්ෂරවල විවිධතා ඇති වන බව හඳුනාගනියි; භාවිත කරයි.
- ව්‍යඤ්ජනාක්ෂර දෙකක් හෝ ඊට වඩා හෝ එක් ව කියැවීම සංයුක්තාක්ෂර වන බවත් සංයුක්තාක්ෂර ලිවීමේ දී අක්ෂරයේ මූලික කොටස් එකතු කළ යුතු බවත් ප්‍රකාශ කරයි; ඒ අනුව ලියයි; කියවයි.

**ගුණාත්මක යෙදවුම්**

- සංස්කෘත වර්ණමාලාවේ සියලු වර්ගීකරණ දැක්වෙන විධිමත් පුවරුවක්
- අක්ෂර ප්‍රභේද සහිත දෘශ්‍ය සංයුක්ත තැටි

**වැඩි දුර ගවේෂණය**


- සංස්කෘත අකුරු ලියමු 2, ප්‍රාචී ප්‍රකාශන, කොළඹ, 2016.
- සංස්කෘත ශික්ෂකය ප්‍රථම පුස්තකය, ජයසූරිය, එම්.එච්.එෆ්.: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1971

## 2. ඒකකය සංස්කෘත කියවීමේ හා ලිවීමේ පරිචය

**1.0 නිපුණතාව**

වර්ණමාලාව නිවැරදි ව හඳුනාගෙන ලියයි.

**නිපුණතා මට්ටම**

1.3 සංකීර්ණ දීර්ඝ සමාස හා විවිධ සංයුක්තාක්ෂර ඇතුළත් ඡේද කියවයි.

1.4 සංකීර්ණ හා විවිධ සංයුක්තාක්ෂර ඇතුළත් ඡේද කියවන විට ලියයි.

**කාලච්ඡේද 05**

**ඉගෙනුම් පල**

- සංස්කෘත භාෂාවෙන් රචිත ග්‍රන්ථවල අන්තර්ගත සංයුක්තාක්ෂර සහිත දීර්ඝ සමාස ඇතුළත් වාක්‍ය හඳුනාගනියි. කියවයි.
- සංයුක්තාක්ෂර ඇතුළත් ඡේද කියවන විට දේවනාගරී අක්ෂර භාවිතයෙන් ලියයි.
- සංයුක්තාක්ෂර සහිත උද්ධෘත ශ්ලෝක පාඨ ශබ්ද නගා කියවයි.
- එම පාඨවල ඇතුළත් සංයුක්තාක්ෂර වෙන වෙන ම උපුටාගෙන විශ්ලේෂණය කර පෙන්වයි.
- දේවනාගරී අක්ෂර භාවිත කොට සංයුක්තාක්ෂර සහිත දීර්ඝ ඡේද ලියයි.
- සංකීර්ණ වාක්‍යවල ඇති විවිධ සංයුක්තාක්ෂර වෙන වෙන ම උපුටාගෙන එම සංයුක්තාක්ෂර විශ්ලේෂණය කරයි

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

දීර්ඝ සමාස, සංයුක්තාක්ෂර බහුල කාදම්බරී, දශකුමාරචරිත ආදි සංස්කෘත ගද්‍ය-පද්‍ය-මිශ්‍ර ග්‍රන්ථ අධ්‍යයනය වෙත ශිෂ්‍යයා යොමු කොට ඔහුගේ නිරවද්‍ය කියැවීමේ හා ලිවීමේ හැකියාව වර්ධනය කිරීම අපේක්ෂාව යි. ඒ අනුව එබඳු ග්‍රන්ථවලින් උපුටාගත් ගද්‍ය පද්‍ය කොටස් පන්තියට ඉදිරිපත් කරමින් නියමිත කාලච්ඡේද සංඛ්‍යාව තුළ සංකීර්ණ දීර්ඝ සමාස හා විවිධ සංයුක්තාක්ෂර ඇතුළත් දේවනාගරී ලේඛන කියවීමටත් කියවන විට ලිවීමටත් ශිෂ්‍යයා මෙහෙයවිය යුතු ය. උපුටාගත් කොටස් තුළ අන්තර්ගත සංයුක්තාක්ෂර වෙන වෙන ම දක්වා ඒවා විශ්ලේෂණය කරවීමෙන් සංයුක්තාක්ෂර පිළිබඳ පරිචය ඇති කළ යුතු ය.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- කාදම්බරී කථාමුඛයෙහි හෝ දශකුමාරචරිත පූර්වපීඨිකාවේ හෝ ඇතුළත් සංයුක්තාක්ෂර බහුල ඡේද තෝරාගත යුතු බව
- උපුටාගත් ඡේද ශිෂ්‍යයන් ලවා කියැවිය යුතු බව හා ලියවිය යුතු බව
- උපුටාගත් ඡේදවල ඇතුළත් සංයුක්තාක්ෂර වෙන වෙන ම ගෙන ඒවා විශ්ලේෂණය කරවමින් සංයුක්තාක්ෂර පිළිබඳ පරිචය ලබාදිය යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- තෝරාගත් පාඨ කියැවීමට යොමු කරන්න.
- උපුටාගත් පාඨවල ඇති සංයුක්තාක්ෂර විශ්ලේෂණය කරවන්න.
- සංකීර්ණ දීර්ඝ සමාස සහිත වාක්‍ය ලිවීමට සලස්වන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සංස්කෘත සාහිත්‍යයෙහි ගද්‍ය පද්‍ය ග්‍රන්ථවල සංකීර්ණ සංයුක්තාක්ෂර ඇති බව ප්‍රකාශ කරයි.

- වගුගත කරන ලද සංයුක්තාක්ෂර ඇතුළත් සටහන කියවයි.
- තෝරාගත් ඡේදයක සංයුක්තාක්ෂර ඇතුළත් වචන උපුටා ලියයි.
- දෙනු ලබන සංකීර්ණ වාක්‍යයක ඇතුළත් සංයුක්තාක්ෂර දේවනාගරී අක්ෂරයෙන් ලියයි.
- දේවනාගරී අක්ෂරයෙන් ඇති සංකීර්ණ සංයුක්තාක්ෂර ඇතුළත් ඕනෑ ම වාක්‍යයක් නිවැරැදි ව කියවයි.

**ගුණාත්මක යෙදවුම්**

- සංකීර්ණ දීර්ඝ සමාස හා විවිධ සංයුක්තාක්ෂර ඇතුළත් ඡේද කීපයක් (කාදම්බරී හා දශකුමාරචරිත වැනි ග්‍රන්ථ ඇසුරින්)

**වැඩි දුර ගවේෂණය**

කාදම්බරී (කථාමුඛය), දශකුමාරචරිතය (පූර්වපීඨිකාවේ ප්‍රථමෝච්ඡ්වාසය) යන කෘතිවලින් උපුටාගත් කොටස්

## 3. ඒකකය පද වර්ග

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.1 පද වර්ගීකරණය කරයි.

**කාලච්ඡේද** 03

**ඉගෙනුම් පල**

- ශබ්දප්‍රකෘති හා ඒවායින් නිපැයෙන පද හඳුනාගෙන වර්ගීකරණය කරයි.
- ධාතුප්‍රකෘති හා ඒවායින් නිපැයෙන පද හඳුනාගෙන වර්ගීකරණය කරයි.
- උපසර්ග හා විවිධ නිපාත හඳුනාගෙන අර්ථ වශයෙන් වර්ගීකරණය කරයි.
- ශබ්ද ප්‍රකෘති, ධාතු ප්‍රකෘති හා අව්‍යයපද අවබෝධයෙන් භාවිත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

වෙනත් බොහෝ භාෂාවල මෙන් ම සංස්කෘත භාෂාවේ ද නාමපද විවිධ ය. ඒවා සංඥානාම, ගුණනාම ආදි වශයෙන් වර්ග කළ හැකි ය. ධාතු මූලික භාෂාවක් වන සංස්කෘතයේ එන බොහෝ නාමපද ධාතුවලින් නිපැයීම විශේෂත්වයකි. සංස්කෘතයේ විශේෂයෙන් යෙදෙන උපසර්ග සහ විවිධ නිපාත හඳුනාගැනීම ද වැදගත් වේ. විවිධ ශබ්දප්‍රකෘති, ධාතුප්‍රකෘති හා අව්‍යයපද පිළිබඳ ව මූලික අවබෝධයක් සිසුන් තුළ ඇති කිරීම සඳහා මෙම කාලච්ඡේද 03 දී පාඩම් සැලසුම් කිරීම අපේක්ෂා කෙරේ.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය:**

- **නාමපද** : සංඥා, ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, භාව වශයෙන් බෙදෙන අයුරු දක්වා පහත පෙන්වා ඇති පරිදි උදාහරණ මඟින් පුහුණු කළ යුතු බව

| | |
|---|---|
| සංඥා | कालिदास, श्री लङ्का |
| ජාති | पशु , पुष्प, वृक्ष, पुरुष |
| ද්‍රව්‍ය | जल, सुवर्ण, अयस्, लवण |
| ගුණ | श्वेत, दीर्घ, सुन्दर |
| ක්‍රියා | गच्छत्, क्रियमान, कृत, गन्तृ |
| භාව | सन्तुष्टि, चिन्ता, सङ्कल्प |

- **ක්‍රියාපද** : ආඛ්‍යාතපද, පූර්වක්‍රියාපද, තුමන්තක්‍රියාපද, ප්‍රත්‍යයාර්ථක්‍රියාපද හා ක්‍රියා විශේෂණපද ආදි වශයෙන් ප්‍රභේදගත වන බව

උදා:

| | | |
|---|---|---|
| ආඛ්‍යාතපද | भवति । अगच्छत् । चकार । | |
| පූර්වක්‍රියාපද | गत्वा । निष्क्रम्य । आहत्य । | |
| තුමන්තක්‍රියාපද | कर्तुम् । जेतुम् । भवितुम् । | |
| ප්‍රත්‍යයාර්ථක්‍රියාපද | ඊප්සාර්ථ | चिकीर्षति । तितीर्षति । |
| | අතිශයාර්ථ | बोभोति । देदीप्यते । |
| | ප්‍රයෝජ්‍ය | पाचयति । कारयति । चोरापयति |

| | |
|---|---|
| ක්‍රියා විශේෂණපද | शनैः शनैः । सुष्ठु । साधु । |

- **නිපාතඃ** වර නොනැගෙන බැවින් අව්‍යය ගණයට අයත් වන නිපාතපද ස්වාධීන පද විශේෂයක් බව හා මෙයින් වාක්‍යයේ අර්ථයෙහි වෙනසක් ඇති වන බව

| |
|---|
| උදාඃ नमस् । हि । अपि । प्रातर् । ऋते । कृते । भोस् । अघोस् । भघोस् । बहिस् । साकम् । समम् । |

- **උපසර්ගඃ** සාම්ප්‍රදායික උපසර්ගවලට අමතර ව පහත දැක්වෙන පද ද උපසර්ග සේ සැලකේ.

| |
|---|
| උදාඃ अन्तर् । प्रादुर् । आविष् । |

- සංස්කෘතයේ දී උපසර්ග පදාදියෙහි යෙදෙන නමුදු වෛදික භාෂාවේ දී ස්වාධීන ව යෙදී ඇත.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- සංස්කෘත භාෂාවේ යෙදෙන ඉහත සඳහන් පදවර්ග වෙන වෙන ම ලැයිස්තු ගත කිරීමට උපදෙස් දෙන්න.
- මෙම විවිධ පද වර්ගවල උපයෝගිතාව විස්තර කර දෙන්න.
- රුක් සටහනක් මඟින් පද වර්ගීකරණය පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සරල වාක්‍යයක ඇති ශබ්දප්‍රකෘති උපුටා ලියයි.
- සරල ඡේදයක ඇතුළත් ධාතුප්‍රකෘති උපුටා ලියයි.
- සරල ඡේදයක ඇතුළත් උපසර්ග හා විවිධ නිපාත හඳුනාගෙන කියවයි.
- ගද්‍ය හා පද්‍ය ඡේදවල උපසර්ග හා නිපාත බහුල ව යෙදෙන බව කියයි.
- සංස්කෘත පද වර්ග 04 නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- පද වර්ගීකරණය කළ පුවරුවක් (රුක් සටහනක්)

**වැඩි දුර ගවේෂණය**

- සංස්කෘත ශික්‍ෂකය 3, පූජ්‍ය ආනන්ද මෛත්‍රෙය නාහිමි, බළන්ගොඩ.ඃනුගේගොඩ, 1964.
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගණී (සංඥා - සන්ධි - නාම) පූජ්‍ය ධම්මින්ද හිමි, හැගොඩ.ඃ සමයවර්ධන, 1999
- සංස්කෘත ප්‍රථම පුස්තකය, භාණ්ඩාර්කර්, ආර්, ජී.ඃ කොළඹ, 1958.

### 4. ඒකකය පද භාවිතය

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.2 පද යෝජනය වෙන් කොට හඳුනාගෙන භාවිත කරයි.

**කාලච්ඡේද** 04

**ඉගෙනුම් පල**

- මූලික ආකෘතියට අනුව සරල වාක්‍ය නිර්මාණය කරයි.
- විවිධ පද වර්ග භාවිත කරමින් සරල වාක්‍ය සංකීර්ණ වාක්‍ය තෙක් වර්ධනය කරයි.
- නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ වාක්‍ය රචනයෙහි දී භාවිත කරයි.
- උපසර්ග හා නිපාත ඇතුළත් වන සේ වාක්‍ය නිර්මාණය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංස්කෘත භාෂාවේ විවිධ පද වර්ග වෙන් වෙන් ව හඳුනාගැනීමටත්, එම පද වර්ග භාවිත කරමින් සරල වාක්‍ය සංකීර්ණ වාක්‍ය තෙක් විස්තෘත කිරීමටත් සිසුන් යොමු කිරීම අවශ්‍ය වේ. ඒ සඳහා සුදුසු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම භාවිත කිරීමට ඔබට මෙහි දී අවකාශ ඇත. පද යෝජනය සඳහා 12 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශය ද භාවිත කරන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ධාතුවක් මුල් වී සෑදෙන පද අතුරින් පූර්වක්‍රියා තුමන්ත ක්‍රියා සහ ක්‍රියා විශේෂණ වර නොනැඟෙන බව

| | |
|---|---|
| පූර්වක්‍රියා | 1. ශුද්ධ ධාතුවකට ත්වා ප්‍රත්‍යය එකතු වීමෙන් පූර්වක්‍රියාව සෑදේ.<br>උදා: भू + त्वा = भूत्वा/ गम् + त्वा = गत्वा |
| | 2. සෝපසර්ග ධාතුවකින් පූර්වක්‍රියාව සෑදෙන විට ත්වා ප්‍රත්‍යය වෙනුවට ය ප්‍රත්‍යය ද කලාතුරෙකින් ත්‍ය ප්‍රත්‍යය ද යෙදේ.<br>උදා:<br>आ + ✓गम् + य = आगम्य<br>सम् + ✓भू + य = सम्भूय<br>सम् + ✓श्रु + त्य = संश्रुत्य<br>आ + ✓हन् + त्य = आहत्य |
| තුමන්ත ක්‍රියා | ධාතුවකින් පර ව තුම් ප්‍රත්‍යය යෙදී සෑදේ.<br>✓भू + तुम् = भवितुम्<br>✓कृ + तुम् = कर्तुम् |
| | තුම් ප්‍රත්‍යය එකතු වීමේ දී ධාතුවට යම් වෙනස්කමක් සිදු විය හැකි ය.<br>गम् + तुम् = गन्तुम् (म्>न्)<br>पच् + तुम् = पक्तुम् |

| | |
|---|---|
| | मुच् + तुम् = मोक्तुम् (ධාතු ස්වරය ගුණ වේ.) |
| ක්‍රියා විශේෂණ | ක්‍රියා පදයකට විශේෂණ ව මුත් ස්වාධීන ව පවතින පද විශේෂයකි.<br>सावेगम् .सावेगं वदति ।<br>सुष्ठु .सुष्ठु गायति ।<br>साधु .साधु नृत्यति । |

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- පූර්වක්‍රියා, තුමන්තක්‍රියා, නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද භාවිත කරමින් වාක්‍ය නිර්මාණය කිරීමට මඟ පෙන්වන්න.
- ඉහත පද භාවිත කරමින් හිස් තැන් පිරවීමට වාක්‍ය හෝ සරල ඡේද හෝ ලබා දෙන්න.
- උපසර්ග රහිත හා සහිත ධාතු ලබා දී ඒවායින් සාදාගත හැකි පූර්වක්‍රියා හා තුමන්ත ක්‍රියා පද සෑදීමට යොමු කරන්න.
- විවිධ වර්ගයන්ට අයත් පද ලැයිස්තුවක් ලබා දී ඒවා වගුවක් ආශ්‍රයයෙන් වර්ගීකරණය කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- වාක්‍ය සකස් කිරීමට නාමපද හා ක්‍රියාපද අවශ්‍ය බව ප්‍රකාශ කරයි.
- නාමපද හා ක්‍රියාපද සමඟ ම නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද යෙදෙන බව ප්‍රකාශ කරයි.
- වාක්‍ය නිර්මාණය කිරීමේ දී උපසර්ග හා නිපාත පද එකතු කරයි.
- ගද්‍ය-පද්‍ය ඡේදවල විවිධ පද වර්ග භාවිත වන බව අවබෝධයෙන් විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නාම විශේෂණ පද හා ක්‍රියා විශේෂණ පද ලැයිස්තු
- පූර්වක්‍රියාපද හා තුමන්තක්‍රියාපද ලැයිස්තු

**වැඩි දුර ගවේෂණය**


- සංස්කෘත ශික්‍ෂකය 3, පූජ්‍ය ආනන්ද මෛත්‍රෙය නාහිමි, බළන්ගොඩ.: නුගේගොඩ, 1964.
- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගණී, (ආඛ්‍යාත - කෘදන්ත) පූජ්‍ය ධම්මින්ද හිමි, හැගොඩ.: සමයවර්ධන, 1999.
- සංස්කෘත ප්‍රථම පුස්තකය, භාණ්ඩාර්කර්, ආර්, ජී.: කොළඹ, 1958.
- නාමාඛ්‍යාත පදමාලා, පූජ්‍ය පේමරතන හිමි, වරාගොඩ.: සමයවර්ධන, 1995.

## 5. ඒකකය ලිඞ්ග, විභක්ති හා කාරක

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.3 ලිඞ්ග, විභක්ති හා කාරක හඳුනාගනියි.

**කාලච්ඡේද** 15

**ඉගෙනුම් පල**

- සංස්කෘත ලිඞ්ග භේදයේ විශේෂතා හඳුනාගනියි.
- දෙන ලද නාමපදයක ලිඞ්ගය හඳුනාගෙන කියවයි.
- නාමයක අන්තයට අනුව ලිඞ්ගය හඳුනාගෙන විභක්තීන්හි වරනගයි.
- හලන්ත නාමපදවල වරනැඟීම් අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.
- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය අතර වෙනස හඳුනාගෙන විස්තර කරයි.
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයටත් කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයටත් හරවයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංස්කෘත ලිඞ්ගභේදයේ විශේෂතා පිළිබඳ ව ද ලිඞ්ගත්‍රයයට ම අයත් ස්වරාන්ත හා හලන්ත නිවැරැදි ව විභක්තීන්හි වරනැඟීමට ද අවබෝධයක් ලබා දීම මෙම ඒකකයේ දී අපේක්ෂා කෙරේ. එසේ ම කර්තෘකාරක හා කර්මකාරක වාක්‍යවල ආකෘතිය හඳුන්වා දිය යුතු අතර ඒවාට අදාළ විභක්ති නිවැරැදි ව භාවිත කිරීමේ පරිචය සිසුන්ට ලබා දිය යුතු ය.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- හලන්ත නාමපදවල ලිඞ්ගභේදයක් පැවතියත් වරනැඟීම්වල දී පුරුෂ හා ස්ත්‍රීලිඞ්ගශබ්දවල වෙනසක් නැති බව

| ශබ්දය | ලිංගය | ඒකවචනය | ද්විවචනය | බහුවචනය |
|---|---|---|---|---|
| **वाच्** | ස්ත්‍රී | **वाक्** | **वाचौ** | **वाचः** |
| **सम्राज्** | පුරුෂ | **सम्राट्** | **सम्राजौ** | **सम्राजः** |

**वाच् > वाक्** වීමේ දී හා **सम्राज् > सम्राद्** වීමේ දී පහත රීතිය බලපායි. ඕනෑ ම සංස්කෘත පදයක් කෙළවර විය හැක්කේ 'ක්, ට්, ත්, ප්, ඞ්, න්, ම්, ඃ' යන ව්‍යඤ්ජන අටෙන් එකකිනි. මෙහි දී 'ශ්' ඇතුළු චවර්ගාක්ෂර සමහරක් 'ක්' බවට ද සමහරක් 'ට්' බවට ද හැරෙන බව

- සංස්කෘත පදයක් කෙළවර විය හැක්කේ එක් ව්‍යඤ්ජනයකින් පමණක් බව හා වාච් යන්නට ප්‍රථමා විභක්ති ඒකවචන ප්‍රත්‍යය වන 'ස්' එක් වූ විට 'ස්' යන්න ලොප් වී වාක් යන්න පමණක් ප්‍රථමා විභක්ති ඒකවචනය වශයෙන් ඉතිරි වන බව හා මීට වෛකල්පික ව යෙදෙන අවස්ථා ද ඉතා කලාතුරෙකින් දැකිය හැකි බව

උදාඃ **अर्क्** (සූර්යයා)

**अमार्ट्** (ඇමදී ය)

- ස්වරාන්ත නාමපදවල අන්ත්‍ය ස්වරය බොහෝ විට ලිංගය පෙන්වන බව හා අකාරාන්ත ශබ්ද පුල්ලිඞ්ග හෝ නපුංසක ලිඞ්ගවන බව

උදා: පුරුෂලිඞ්ග- **नर । वृक्ष । मित्र** (එනම් දෙවියා)

නපුංසකලිඞ්ග- **पात्र । फल । मित्र** (මිතුරා)

- බොහෝ ආකාරාන්ත ශබ්ද හා ඊකාරාන්ත ශබ්ද ස්ත්‍රීලිඞ්ගික වන බව

  උදාහරණ - **माला । बाला । शाला । नारी । नदी । वापी** (ආකාරාන්ත, ඊකාරාන්ත )

- ඉකාරාන්ත උකාරාන්ත ශබ්ද ලිඞ්ගත්‍රයයට ම අයත් බව

  උදා -:

  පුරුෂලිඞ්ග- **कवि । रवि । पति** (ඉකාරාන්ත)

  ස්ත්‍රීලිඞ්ග- **बुद्धि । मति । कृति** (ඉකාරාන්ත)

  නපුංසකලිඞ්ග- **वारि । दधि । शुचि** (ඉකාරාන්ත)

  පුරුෂලිඞ්ග - **गुरु । भानु । पशु**

  ස්ත්‍රීලිඞ්ග- **धेनु । तनु । वासु** (කෙල්ල)

  නපුංසකලිඞ්ග- **मधु । दारु । वस्तु**

- පුරුෂලිඞ්ගික හා ස්ත්‍රීලිඞ්ගික ඍකාරාන්ත ශබ්ද වරනැගීමේ දී විශේෂිත වෙනස්කමක් දැකිය නොහැකි බව

  උදා :

  පුරුෂලිඞ්ග - **पितृ । भातृ । गन्तृ**

  ස්ත්‍රීලිඞ්ග - **मातृ । दुहितृ । स्वसृ**

  නපුංසකලිඞ්ග - **दातृ । कर्तृ । वक्तृ**

  මෙම ශබ්ද පුරුෂලිංගයේ ද වරනැගේ.

- **කර්තෘකාරක හා කර්මකාරක වශයෙන් වාක්‍ය ඇති බව**
- කර්තෘකාරක වාක්‍යයක දී කර්තෘ උක්ත වන අතර කර්මය අනුක්ත වන බව
- උක්තය ප්‍රථමා විභක්තිය ගන්නා අතර අනුක්ත කර්මය ද්විතීයා විභක්තියෙන් යෙදෙන බව

  උදා: **बालकः पुस्तकं पठति ।**
  **शकुन्तला गुरुं नमति ।**
  **पण्डितौ सभां अलंकुरुतः ।**

- කර්මකාරක වාක්‍යයක දී කර්මය උක්ත වන අතර කර්තෘ අනුක්ත වන බව
- උක්ත කර්මය ප්‍රථමා විභක්තිය ගන්නා අතර අනුක්ත කර්තෘ තෘතීයා විභක්තියෙන් යෙදෙන බව

  උදා: **बालकेन पुस्तकं पठ्यते ।**

शकुन्तलया गुरुः नम्यते ।
पण्डिताभ्यां सभा अलंक्रियते ।

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- සංස්කෘත ලිඞ්ග භේදය හා එහි සුවිශේෂතා පිළිබඳ ව පහදා දෙන්න.
- ස්ත්‍රීලිඞ්ග හා පුරුෂලිඞ්ග වශයෙන් වෙන් වෙන් ව හලන්ත නාම පද ලැයිස්තු පිළියෙල කරන්න.
- අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත, ඌකාරාන්ත, ඍකාරාන්ත, ඎකාරාන්ත නාම එකතු කොට ලිඞ්ගත්‍රයයට අනුව වර්ගකර පෙන්වන්න.
- දෙන ලද ඉහත නාම වරනැඟීම්වල වෙනස්කම් පහදා දෙන්න.
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයටත්, කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයටත් පෙරළා ලියවන්න.
- නිර්දිෂ්ට පාඨ්‍ය ග්‍රන්ථවල ඇතුළත් කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය හඳුනාගෙන ඒවා වෙන වෙන ම ලියවන්න.

**තක්සේරුව හා ඇගයීම**

- ලිඞ්ගත්‍රයයෙහි වෙනස වරනැඟීම් මඟින් බෙදා දක්වයි.
- විභක්තිගත වගු ඇසුරින් නාම වරනැඟීම්වල වෙනස්කම් පෙන්වා දෙයි.
- ස්වර අකුරකින් අවසන් වන නාම ' ස්වරාන්ත ' නාම වන බව කියයි.
- ව්‍යඤ්ජන අකුරකින් අවසන් වන නාම ' හලන්ත' නාම වන බව ප්‍රකාශ කරයි.
- වාක්‍ය තුළ කාරක බහුල ව යෙදෙන බව මතුකර පෙන්වයි.
- වාක්‍ය තුළ ඇති කර්තෘ හා කර්මය අතර වෙනස කාරක තුළින් මතුකර පෙන්වයි.
- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය උදාහරණ ඇසුරින් විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- ලිඞ්ගත්‍රයය දැක්වෙන රුක් සටහන.
- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍යවල ආකෘතිය දැක්වෙන සටහනක්

**වැඩි දුර ගවේෂණය**


- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගණී, (සංඥා - සන්ධි - නාම තරංග) පූජ්‍ය ධම්මින්ද හිමි, හෑගොඩ.: සමයවර්ධන, 1999.
- නාමාඛ්‍යාත පදමාලා, පූජ්‍ය පේමරතන හිමි, වරාගොඩ.: සමයවර්ධන, 1995.
- සංස්කෘත ද්විතීයාදර්ශ, ශාස්ත්‍රී, කේ. එල්. වී.: එල්සාට්, 2001.

## 6. ඒකකය සන්ධි ප්‍රභේද, ධාතු ගණ හා ලකාර

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.4 පද සංශ්ලේෂණය හා විශ්ලේෂණය හඳුනාගෙන භාවිත කරයි.

2.5 කාරක භේදය, ධාතුගණ හා ලකාර (ආර්ධධාතුක) හඳුනාගනියි.

**කාලච්ඡේද** 28

**ඉගෙනුම් පල**

- පාඨ්‍ය ග්‍රන්ථවල ඇතුළත් සන්ධිපද හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- සන්ධි විය හැකි වචන දෙකක් නිවැරැදි ව සන්ධි කිරීමේ හා සන්ධි වී ඇති පද දෙකක් විශ්ලේෂණය කිරීමේ හැකියාව ලබාගනියි.
- අනිවාර්ය අභ්‍යන්තර සන්ධි නිවැරැදි ව භාවිත කරයි.
- බාහිර සන්ධි ස්වර ව්‍යඤ්ජන විසර්ග ලෙස හඳුනාගෙන වර්ගකර පෙන්වයි.
- I වැනි හා II වැනි ධාතු වරනැඟීම්වල වෙනස අවබෝධ කරගනියි.
- II ධාතු වරනැඟීමට අයත් ධාතුන්ගෙන් සෑදෙන ක්‍රියාපද නිවැරැදි ව භාවිත කරයි.
- සාර්වධාතුක ලකාර හා ආර්ධධාතුක ලකාර අතර වෙනස හඳුනාගනියි.
- තෝරාගත් සංස්කෘත ඡේද ඇසුරින් ආර්ධධාතුක ලකාර හඳුනාගෙන ලියා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සන්ධි යෝජනය සංස්කෘත භාෂාවේ විශේෂිත ලක්ෂණයකි. එහෙයින් බාහිර හා අභ්‍යන්තර සන්ධි පිළිබඳ නිසි අවබෝධයක් නොමැති ව සංස්කෘත භාෂාව හැදෑරීම ව්‍යර්ථ ව්‍යායාමයකි. එම නිසා සන්ධි පිළිබඳ මනා පරිචයක් ලබාගැනීම සංස්කෘත භාෂා අධ්‍යයනයේ දී අතිශය වැදගත් වෙයි. ඒ සඳහා ප්‍රමාණවත් කාලච්ඡේද සංඛ්‍යාවක් වෙන් කරගෙන මෙම ඒකකයේ දී සිසුන් තුළ නිසි අවබෝධය ඇති කරවිය යුතු ය.

I වරනැඟීමට අයත් I, IV, VI, X යන ධාතුගණවල වරනැඟීම් 12 වැනි ශ්‍රේණියේ දී හදාරා ඇත. සෙසු ධාතුගණ 06 වරනැඟීමේ දී දක්නට ලැබෙන සාම්‍යයන් නිසා ඒවා වෙන ම ධාතු වරනැඟීමක් වශයෙන් පිළිගනු ලැබේ. I වැනි ධාතු වරනැඟීම් හා II වැනි ධාතු වරනැඟීම් පිළිබඳ ව සිසුන් දැනුම්වත් කළ යුතු ය.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සන්ධි ප්‍රධාන වශයෙන් ස්වර හා ව්‍යඤ්ජන වශයෙන් කොටස් දෙකක් බව
- ස්වර දෙකක් අතර සිදු කෙරෙන ගැළපීම ස්වර සන්ධි වශයෙන් හැඳින්වෙන බව

  උදා: **सुर + असुर = सुरासुर**
  **फल + उदय = फलोदय**
  **महा + ऋषि = महर्षि**
- ව්‍යඤ්ජන දෙකක් අතර හෝ ව්‍යඤ්ජනයක් හා ස්වරයක් අතර හෝ සිදුවන ගැළපීම ව්‍යඤ්ජන සන්ධි වශයෙන් හැඳින්වෙන බව
- විසර්ග සන්ධි ද මේ යටතට ගැනෙන බව

  උදා: **तत् + शिल्पम् = तच्छिल्पम्**
  **शतॄन् + जयति = शतॄञ्जयति**
  **तम् + एव = तमेव**
- ස්වර සන්ධි හැදෑරීමේ දී පහත පෙනෙන ස්වර ප්‍රභේද පිළිබඳ අවබෝධය අත්‍යවශ්‍ය බව

| හ්‍රස්ව | දීර්ඝ | ගුණ | වෘද්ධි | ව්‍යස්ත | අර්ධස්වර |
|---|---|---|---|---|---|
| अ | आ | - | आ | - | - |
| इ | ई | ए | ऐ | अय् / आय् | य् |
| उ | ऊ | ओ | औ | अव् / आव् | व् |
| ऋ | ॠ | अर् | आर् | - | र् |
| ऌ | ॡ | अल् | आल् | - | ल् |

- **ස්වර සන්ධි**

1. සමාන ස්වර දෙකක් එක් වූ කල ප්‍රතිඵලය දීර්ඝ ස්වරයකි.

   උදා: सुर + असुर = सुरासुर
   यति + इन्द्र = यतीन्द्र
   किन्तु + उदेति = किन्तूदेति
   कर्तृ + ऋजु = कर्तॄजु

2. अ වර්ණයට පර ව වෙනත් ස්වරයක් ඇති කල එම ස්වරය ගුණ බවට පත් වේ.

   උදා: महा + इन्द्र = महेन्द्र
   सूर्य + उदय = सूर्योदय
   महा + ऋषि = महर्षि

3. अ වර්ණයට පර ව ගුණ හෝ වෘද්ධි හෝ ස්වරයක් පිහිටි කල එම ස්වරය වෘද්ධි බවට පත් වෙයි.

   උදා: अत्र + आगतः = अत्रागतः
   अथ + एवम् = अथैवम्
   महा + ओषधी = महौषधी
   महा + औषध = महौषध

4. अ වර්ණය හැර වෙනත් ස්වරයකට පර ව අන්‍ය ස්වරයක් පිහිටි කල එම ස්වරය අදාළ අන්තඃස්ථාක්ෂරය බවට පත් වේ.

   උදා: इति + अत्र = इत्यत्र
   मधु + अस्ति = मध्वस्ति
   पितृ + अर्थः = पित्रर्थः
   बहु + इव = बह्विव

5. ए හෝ ओ වර්ණයෙන් පර ව अ කාරය ඇති විට එම අකාරය ලොප් වී අවග්‍රහය (ऽ) යෙදේ.

   උදා: ग्रामे + अस्ति = ग्रामेऽस्ति
   रामो + अत्ति = रामोऽत्ति

6. ए, ऐ, ओ, औ යන ස්වරවලට පර ව अ කාරය හැර වෙනත් ස්වරයක් යෙදුණ විට එම ස්වර පිළිවෙළින් अय्, आय्, अव्, आव् බවට පත් වෙයි.

උදා: हरे + इति = हरयिति/ हर इति
श्रियै + अर्थः = श्रियायर्थः/ श्रिया अर्थः
प्रभो + एहि = प्रभवेहि/ प्रभ एहि
तौ + इति = ताविति/ ता इति

- ව්‍යඤ්ජන සන්ධි

1. අඝෝෂයක් අඝෝෂයක් සමඟ ද ඝෝෂයක් ඝෝෂයක් සමඟ ද සන්ධි වේ.

උදා: तद् + काल = तत्काल
वाक् + वहति = वाग्वहति
मरुत् + वहति = मरुद्वहति

2. त् , थ् , द् , ध् , न् , स् යන ව්‍යඤ්ජනවලට පර ව තාලුජාක්ෂරයක් යෙදුණු කල එම ව්‍යඤ්ජනය අදාළ තාලුජාක්ෂරය බවට පත් වේ.

උදා: तद् + च = तत्च = तच्च
अरीन् + जयति = अरीञ्जयति

3. ඕනෑ ම ව්‍යඤ්ජනයකට පර ව අනුනාසිකාක්ෂරයක් යෙදේ නම් එය එම වර්ගයේ අනුනාසිකය බවට ද විකල්පයෙන් අල්පප්‍රාණ ඝෝෂය බවට ද පත් වේ.

උදා: अवदत् + मुरारिः = अवदद्मुरारिः/ अवदन्मुरारिः
षट् + मासाः = षड्मासाः/ षण्मासाः
वाक् + मय = वाङ्मय
मृत् + मय = मृन्मय

4. දන්තජාක්ෂරයකට පර ව මූර්ධජාක්ෂරයක් යෙදේ නම් එම අක්ෂරය ද මූර්ධජ බවට පත් වේ.

උදා: महान् + डमरः = महाण्डमरः
अरचयत् + टीकाम् = अरचयट्टीकाम्
रामस् + टीकते = रामष्टीकते

5. අනුනාසිකාක්ෂරයක් හැර ඕනෑ ම ව්‍යඤ්ජනයකට පර ව ह කාරය තිබේ නම් එම ह කාරය පෙර අක්ෂරයට අයත් වර්ගයේ මහාප්‍රාණ ඝෝෂ අක්ෂරය බවට විකල්පයෙන් පත් වේ.

උදා: वाक् + हस्तौ = वाग्हस्तौ/ वाग्घस्तौ
अवदत् + हरिः = अवदद्हरिः/ अवदद्धरिः

6. त् අක්ෂරයට පසුව श යෙදුණු කල එම ව්‍යඤ්ජන දෙක පිළිවෙළින් च् සහ छ् බවට පත් වේ.

උදා: तत् + शिल्पम् = तच्छिल्पम्
अवदत् + शटः = अवदच्छटः
तत् + श्रुत्वा = तच्छ्रुत्वा

7. හ්‍රස්ව ස්වරයකට පසු ව යෙදෙන ङ्, ण्, न् යන ව්‍යඤ්ජනවලට පර ව ඕනෑ ම ස්වරයක් යෙදෙන විට එම මුල් ව්‍යඤ්ජනය ද්විත්ව වේ.

උදා: तस्मिन् + अरण्ये = तस्मिन्नरण्ये
नृत्यन् + आगतः = नृत्यन्नागतः

8. म् ව්‍යඤ්ජනයට පර ව ස්වරයක් යෙදේ නම් එය නොවෙනස් වෙයි. ව්‍යඤ්ජනයක් යෙදුණු කල අනුස්වාරය බවට පත් වේ.

උදා: रामम् + आगच्छति = राममागच्छति
ग्रामम् + गच्छति = ग्रामं गच्छति
रामम् + शंसति = रामं शंसति

විකල්පයෙන් අදාළ ව්‍යඤ්ජනය අයත් අනුනාසිකය බවට පත් වේ.

**सम्** + **कलन** = **संकलन/ सङ्कलन**

**सम्** + **चरण** = **संचरण/ सञ्चरण**

**सम्** + **ताप** = **संताप/ सन्ताप**

**सम्** + **प्रदान** = **संप्रदान / सम्प्रदान**

වාක්‍යාවසානයේ යෙදෙන **म्** වෙනස් නොවේ.

- විසර්ග සන්ධි

1. **अ** කාරයට පසුව එන විසර්ගය ඝෝෂාක්ෂරයක් හෝ **अ** කාරයක් හෝ ඉදිරියේ දී **उ** කාර බවට පත් වේ. (පසු ව **अ+उ=ओ** බවට පත් වේ.)

   උදා: **रामः** + **गच्छति** = **रामो गच्छति**

   **रामः** + **अस्ति** = **रामोऽस्ति**

2. **अ** ස්වරය හැර වෙනත් ස්වරයකට පූර්ව විසර්ගය ලෝපශ් වේ.

   උදා: **रामः** + **इच्छति** = **राम इच्छति**

   **नरः** + **उवाच** = **नर उवाच**

3. **आ** ස්වරයට පර ව යෙදෙන විසර්ගය ඝෝෂාක්ෂරයක් හෝ ස්වරයක් හෝ ඉදිරියේ දී ලෝපශ් වේ.

   උදා: **बालाः** + **आगच्छन्ति** = **बाला आगच्छन्ति**

   **मालाः** + **म्लायन्ति** = **माला म्लायन्ति**

4. වෙනත් ඕනෑ ම ස්වරයකට පර ව යෙදෙන විසර්ගය ඝෝෂ අක්ෂරයකට පූර්වයේ දී **र्** බවට පත් වේ. ස්වරයට පර ව යෙදෙන විසර්ගය ඝෝෂාක්ෂරයක් හෝ ස්වරයක් හෝ ඉදිරියේ දී ලෝපශ් වේ.

   උදා: **अग्निः** + **दहति** = **अग्निर्दहति**

   **मुनिः** + **अत्र** = **मुनिरत्र**

5. විසර්ගයට පර ව **च्**, **ट्**, **त्** හෝ ඌෂ්මාක්ෂරයක් යෙදුණු කල එම විසර්ගය අදාළ වර්ගයේ ඌෂ්මාක්ෂරය බවට පත් වේ.

   උදා: **वृक्षः** + **चलति** = **वृक्षश्चलति**

   **कः** + **टीकते** = **कष्टीकते**

   **कः** + **त्वम्** = **कस्त्वम्**

6. **सः** , **एषः** යන සර්වනාම පද දෙකේ විසර්ගය වාක්‍යාවසානයෙහි හැරෙන්නට සෙසු තැන්වල දී ලෝපශ් වේ.

   උදා: **सः** + **गच्छति** = **स गच्छति**

   **एषः** + **बालः** = **एष बालः**

- II වැනි ධාතු වරනැඟීම
- II වැනි ධාතු වරනැඟීමට අයත් ධාතු ගණ සයේ දක්නට ලැබෙන පොදු ලක්ෂණ

1. ධාතුවට කෙළින් ම ප්‍රත්‍යය එකතු වීම

2. ලට් පරස්මෛපදී ඒකවචන, ලඞ් පරස්මෛපදී ඒකවචන හා ලෝට් පරස්මෛපදී හා ආත්මනේපදී උත්තමපුරුෂ ද පරස්මෛපදී ප්‍රථමපුරුෂ ඒකවචන රූප ද ශක්තිමත් රූප ගනී.

3. **लट्** හා **लङ्** ආත්මනේපදී ද්විවචන ප්‍රත්‍යය වන එථෙ, එතෙ හා එථාම් එතාම් වෙනුවට පිළිවෙළින් ආථෙ, ආතෙ, ආථාම්, ආතාම් යන ප්‍රත්‍යය යෙදේ.

- එම ධාතු වරනැගීම්වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ
    1. III වැනි ධාතු ගණයේ ධාතුවල ප්‍රථම වර්ණය ද්විත්ව වේ.
       උදාහරණ: ✓हु > जुहु ✓भी > बिभी ✓धा > दधा ආදි වශයෙනි.
    2. V වැනි ධාතු ගණයේ ධාතුවල දී ධාත්වංගය වශයෙන් 'නු' ආගම වේ.
       උදා:✓धु > धुनु ✓अश् > अश्नु ✓आप् > आप्नु
    3. VII වැනි ධාතු ගණයේ ධාතු මධ්‍යයට 'න' කාරයක් ආගම වේ.
       උදා: ✓रुद् > रुणद् ✓युज् > युनज् ✓भुज् > भुनज्
    4. VIII වැනි ධාතු ගණයේ ධාතුවල දී ධාත්වංගය වශයෙන් 'උ' කාරයක් ආගම වේ.
       උදා: ✓तन् > तनु ✓मन् > मनु
    5. IX වැනි ධාතු ගණයේ ධාතුවල දී ධාත්වංගය වශයෙන් 'නා' ආගම වේ.
       උදා: ✓क्री> क्रीणा ✓मि > मिना ✓लु > लुना

- **සංස්කෘත ලකාර 10 අතුරින් ආර්ධධාතුක ලකාර 06කි.**

  ලිට් (පරෝක්ෂ) - ද්විත්ව හා අනුප්‍රයෝග වශයෙන් ලිට් ප්‍රභේද දෙකකට බෙදේ.

  උදා: ද්විත්ව- चकार

  අනුප්‍රයෝග- कारयामास/ कारयाञ्चकार/कारयांबभूव

  ලුඞ් (භූතාතීත) - මෙහි ප්‍රභේද හතකි. උදා: अभूत्। अकार्षीत्। अगमत्। अचीकरत्

  ලුට් (අනද්‍යතන භවිෂ්‍යත්) -भविता। गन्ता।

  ලෘට් (භවිෂ්‍යත්) - भविष्यति। गमिष्यति।

  ලෘඞ් (ක්‍රියාතිපත්ති) - अभविष्यत्। अदास्यत्।

  ආශීර්ලිඞ් (ආශීඃ) - भूयात्। देयात्।

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- පාඨ්‍ය ග්‍රන්ථ අනුසාරයෙන් සන්ධිපද විසන්ධි කිරීමටත් දෙන ලද විසන්ධිපද සන්ධි කිරීමටත් උපදෙස් දෙන්න.
- සන්ධි දැනුම අනුසාරයෙන් නිර්දේශ ග්‍රන්ථවල හමු වන සන්ධිපද වර්ගකර වගුවක් නිර්මාණය කිරීමට සලස්වන්න.
- I වැනි හා II වැනි වරනැගීම්වලට අදාළ ධාතු ලැයිස්තු දෙකක් ලබා දෙන්න.
- එම ලැයිස්තු ඇසුරින් I වැනි හා II වැනි වරනැගීම්වල වෙනස අවබෝධ කරගැනීමට සලස්වන්න.
- එක් එක් ගණයට අයත් ධාතු සාර්වධාතුක ලකාරවල වරනැගීමට උපදෙස් දෙන්න.
- මෙම වරනැගීම්වල දී භාවිත වන අභ්‍යන්තර සන්ධි රීති පිළිබඳ අවධානය යොමු කරවන්න.
- නිර්දිෂ්ට පාඨ්‍ය ග්‍රන්ථවල ආර්ධධාතුක ලකාරවලට අයත් ක්‍රියාපද එකතු කිරීමට උපදෙස් දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සන්ධිපද විසන්ධි කළ හැකි බව ප්‍රකාශ කරයි.
- විසන්ධිපද සන්ධි කළ හැකි බව ප්‍රකාශ කරයි.
- අභ්‍යන්තර සන්ධි විශ්ලේෂණය කර පෙන්වයි.
- වර්ග කිරීම් මගින් බාහිර සන්ධි අතර පවතින වෙනස ලියා දක්වයි.
- වරනැගෙන ක්‍රියාපද වගුගත කර දක්වයි.
- ක්‍රියාපද එක් එක් ධාතුවලට අනුව වෙනස් වන බව විස්තර කරයි.
- සාර්වධාතුක ලකාර හා ආර්ධධාතුක ලකාර අතර වෙනස ප්‍රකාශ කරයි.
- නියමිත ග්‍රන්ථයක කෙටි ඡේදයක් තුළ ඇති සාර්වධාතුක හා ආර්ධධාතුක ලකාර උපුටා ලියා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- ස්වර, ව්‍යඤ්ජන හා විසර්ග සන්ධි ප්‍රභේද දැක්වෙන රුක් සටහනක්
- I වැනි හා II ධාතු ගණ වරනැගීම්වල වෙනස දැක්වෙන පුවරුවක්

**වැඩි දුර ගවේෂණය**

- සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගණී, (සංඥා - සන්ධි - නාම තරංග) පූජ්‍ය ධම්මින්ද හිමි, හැගොඩ.: සමයවර්ධන, 1999.
- ආධුනික සංස්කෘත ව්‍යාකරණය, මැක්ඩොනල්,ඒ.ඒ.: අනුඃ ගුණපාල සේනාධීර, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1994.

# 7. ඒකකය තද්ධිතපද හා කෘදන්තපද

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.6 තද්ධිතපද හා කෘදන්තපද හඳුනාගනියි**.** භාවිත කරයි.

**කාලච්ඡේද** 10

**ඉගෙනුම් පල**

- විවිධ තද්ධිත ප්‍රභේද හා ඒවායෙහි විශේෂතා හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- දෙන ලද ඡේදයක ඇතුළත් තද්ධිතපද උපුටා වර්ගීකරණය කරයි.
- තද්ධිතපද සාධනය පිළිබඳ මනා පරිචයක් ලබයි.
- විවිධ කෘදන්තපද ප්‍රභේද හා ඒවායෙහි විශේෂතා හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- දෙන ලද ඡේදයක ඇතුළත් කෘදන්තපද උපුටා වර්ගීකරණය කරයි.
- කෘදන්තපද සාධනය පිළිබඳ මනා පරිචයක් ලබයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

තද්ධිත හා කෘදන්ත පිළිබඳ 12 වැනි ශ්‍රේණියේ දී ලබා දී ඇති මූලික දැනුම ඉස්මතු වන ආකාරයට පුනරීක්ෂණ ද සහිත ව පාඩම් සැලසුම් කරගන්න. ධාතු මූලික භාෂාවක් වන සංස්කෘතයේ භාවිත වන නාමපදවලින් අතිබහුතරයක් කෘදන්තපද බව හඳුනාගැනීම භාෂා අධ්‍යයනයෙහි ලා අතිශයින් වැදගත් බවත් තද්ධිත සඳහා සංස්කෘතයේ හිමි ව ඇති ස්ථානය හා එහි වැදගත්කමත් මතු වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යය සිදු කරන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

තද්ධිතපද සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් ප්‍රභේද තුනක් ඇති බව

1. සාමාන්‍ය තද්ධිත
2. භාව තද්ධිත
3. අව්‍යය තද්ධිත

1. සාමාන්‍ය තද්ධිතයේ දී නිරන්තරයෙන් ම ප්‍රථම (ආදි) ස්වරය වෘද්ධි වේ.

උදා: **प्रमाण + इक = प्रामाणिक**

**दिन + इक = दैनिक**

**भूमि + इक = भौमिक**

**ऋच् + इक = आर्चिक**

**देह + इक = दैहिक**

**मुनि + अ = मौन**

2. භාව තද්ධිත

උදා: **मृदुता । मार्दवम् । मृदुत्वम्**

ऋजुता। आर्जवम्। ऋजुत्वम्

कुशलता। कौशलम्। कौशल्यम्

3. අව්‍යය තද්ධිත

උදා: यत्र। तत्र। कुत्र

यदा। तदा। कदा

ग्रामतः। मूकशः

क्रमशः। बहुशः

- කෘදන්තපද විවිධ වන අතර උදාහරණ වශයෙන් ✓ कृ (කිරීමේ) ධාතුවෙන් පහත සඳහන් කෘදන්තපද සාදාගත හැකි බව

  कार। कारक। कर्तृ। कर्म। करण। कुर्वत्। कृत। कृतवत्। कुर्वाण। क्रियमाण। करिष्यत्। कर्तव्य। करणीय। कार्य। कृत्वा। कर्तुम्। कारण। कर। चकृवस्। क्रिया। कृतावि। कृतक। कृति।

- (මීට අමතර ව උපසර්ග යෙදූ කල එම ධාතුවෙන් ම තවත් කෘදන්තපද විශාල සංඛ්‍යාවක් සාදාගත හැකි බව උදා: प्रकृति। विकृति। विकार। आकार। उपकार। )
- කෘදන්තපද ලිඞ්ග වශයෙන්, කාල වශයෙන් හා කාරක වශයෙන් වෙනස් වෙමින් විවිධ අර්ථ පළ කරන බව
- කාලය හා ප්‍රකාරය අනුව කෘදන්තපද පහත දැක්වෙන පරිදි විවිධ ප්‍රභේදවලට අයත් වන බව

උදා: වර්තමාන කාල කර්තෘකාරක- गच्छत्

වර්තමාන කාල කර්මකාරක- गम्यमान

අතීත කාල කර්තෘකාරක- गत / गतवत्

අතීත කාල කර්මකාරක - गत

අනාගත කාල කර්තෘකාරක - गन्तृ

පරෝක්ෂ කර්තෘකාරක- जग्मिवस्

- ක්‍රියා පදවලින් කෘදන්තපද සෑදීමේ දී භාවිත වන ප්‍රත්‍යය විශාල සංඛ්‍යාවක් ඇති බව හා ඒ අතුරින් ඉතා ම වැදගත් සේ සැලකෙන ප්‍රත්‍යය කිහිපයක් පහත දක්වා ඇති බව

  अ = ✓ सृज् > सर्ग ✓भू > भाव

  अन् = ✓राज् > राजन् ✓नम् > नामन्

  अन = ✓दृश् > दर्शन ✓भुज् > भोजन

  अस् = ✓वच् > वचस् ✓मन् > मनस्

  इस् = ✓हु > हविस् ✓सृप् > सर्पिस्

  उस् = ✓यज् > यजुस् ✓चक्ष् > चक्षुस्

  इ = ✓कृष् > कृषि ✓शुच् > शुचि

  उ = ✓तन् > तनु ✓हन् > हनु

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- පාඨ්‍ය ග්‍රන්ථයකින් තෝරාගත් කොටසක ඇති තද්ධිතපද හා කෘදන්තපද වෙන් කොට දැක්වීමට උපදෙස් දෙන්න.
- තද්ධිතපද කීපයක් දී ඒවායේ ප්‍රකෘතිය සෙවීමට යොමු කරවන්න.
- කෘදන්තපද කීපයක් දී ඒවායේ ධාතුව සෙවීමට යොමු කරවන්න.
- කෘදන්තපද හා තද්ධිතපද භාවිත කරමින් නිර්මාණාත්මක වාක්‍ය සකස් කිරීමට යොමු කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- වර්ගීකරණය මඟින් තද්ධිතපද වෙන් කොට දක්වයි
- තද්ධිතපද භාෂාවේ නිතර යෙදෙන බව සරල ඡේද මඟින් පෙන්වා දෙයි.
- නාම මූලවලට තද්ධිත ප්‍රත්‍ය එකතු වී තද්ධිතපද සෑදෙන බව ලියා දක්වයි.
- තද්ධිත නාමය නාමපදයක් බවට පත් කරන අයුරු විස්තර කරයි.
- නිතර භාවිත තද්ධිතපද ලැයිස්තුගත කොට ප්‍රදර්ශන පුවරුවක් සකසයි.
- ලැයිස්තු ගත කෘදන්තපද මඟින් ත්‍රෛකාලික කෘදන්තපද වෙන් කොට දක්වයි.
- ඡේද නිර්මාණය කිරීම සඳහා කෘදන්තපද බහුල ව යෙදෙන අයුරු පැහැදිලි කරයි.
- කෘදන්ත හා තද්ධිත අතර වෙනස එක් එක් සිසුවා මඟින් ප්‍රකාශ කර දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- මෙහි දක්වා ඇති පරිදි සකස් කරගත් තද්ධිතපද හා කෘදන්තපද ඇතුළත් කෙටි ප්‍රකාශ සහිත පුවරුවක්

**වැඩිදුර ගවේෂණය**

- **ආධුනික සංස්කෘත ව්‍යාකරණය**, මැක්ඩොනල්, ඒ. ඒ.: අනු : ගුණපාල සේනාධීර, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1964.
- **සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගණී**, (කාරක-සමාස-තද්ධිත-තරඞ්ග) පූජ්‍ය ධම්මින්ද හිමි, හෑගොඩ.:සමයවර්ධන, 1999.

## 8. ඒකකය සමාසපද

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.7 සමාස හඳුනාගනියි**.** භාවිත කරයි.

**කාලච්ඡේද** 07

**ඉගෙනුම් පල**

- සමාසපද හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- සමාසපද විශ්ලේෂණය කිරීම හා සමාසපද සැකසීම පිළිබඳ නිපුණත්වය ලබයි.
- සමාසපද භාවිත කිරීමේ පරිචය ලබයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සමාස යන්නේ තේරුම සංක්ෂේප කිරීම යන්න යි. සංස්කෘත භාෂාවේ දී සමාසවලට විශේෂ ස්ථානයක් හිමි වෙයි. ගද්‍ය කාව්‍යයේ දී සමාස බහුල ව භාවිත වෙයි. වෙන් කර ඇති කාලච්ඡේද තුළ සමාස වර්ගීකරණය පිළිබඳ මනා පරිචයක් ලබා දිය යුතු වන අතර සමාසපද විශ්ලේෂණය කිරීමත් වෙන් ව පවතින පද සමාස කිරීමත් සිසුන් ලවා කරවිය යුතු ය. දීර්ඝ සමාස බහුල පාඨ්‍ය ග්‍රන්ථවලින් උපුටාගත් කොටස් මේ සඳහා භාවිත කරන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පද කිහිපයක් එකට එකතු කොට ඒකාර්ථයක් හැඟවීම සමාසයෙන් කෙරෙන කාර්යය බව
- සමාසපද සැකසීමේ දී අවසාන පදයේ හැර අනෙක් පදවල විභක්ති ඉවත් වීම විශේෂත්වයක් බව
- අවසාන පදයේ විභක්තිය ඇතැම් විට වෙනස් වන බව
- සමාස වර්ග හයක් ඇති බව

01. ද්වන්ද්ව

**සමාහාර ද්වන්ද්වඃ** මෙම සමාසයේ දී සමාස වූ පදය එකක් වශයෙන් ගැනෙන අතර නිතර ම නපුංසකලිඞ්ග ඒකවචන රූප ගනී. (උදාඃ **पाणिपादम्। बधिरामलकम्** )

**ඉතරේතරයෝග ද්වන්ද්වඃ** මෙහි දී සෑම පදයක ම අර්ථය සැලකිල්ලට ගැනේ. (උදාඃ **सुरासुरगन्धर्वाः। मृगकाकौ**)

02. තත්පුරුෂ

මෙහි දී සමාස වන පද දෙකින් පූර්ව පදයේ ඇති විභක්ති ප්‍රත්‍යය ඉවත් වුව ද විභක්ති අර්ථය රඳවා ගනී (උදාඃ **राज्ञः सभा = राजसभा। चोरेभ्यः भयम् = चौरभयम्। वने मृगः = वनमृगः**)

03. බහුව්‍රීහිඃ

සමාස වූ පදවලින් ගම්‍ය වන අර්ථයට වෙනස් වූ අර්ථයක් ප්‍රකාශ කරයි.

(උදාඃ **त्रिनेत्रः। कमलासनः**)

04. කර්මධාරයඃ

මෙම සමාසය විශේෂණ සහ විශේෂ්‍යය යන වර්ග දෙක ම දරන හෙයින් කර්මධාරය නම් වෙයි. (උදාඃ श्वेतपुष्पम्। नीलोत्पलम्। नरसिंहः)

**05. ද්විගුඃ**

සංඛ්‍යා පදයක් විශේෂණ වශයෙන් සිටිනුයේ ද්විගු සමාසයේ දී ය. (त्रिभुवनम्। सप्त च ते ऋषयश्च = सप्तर्षयः)

**06. අව්‍යයීභාවඃ**

අව්‍යය නොවූ පද මෙම සමාසයේ දී සමාස වීමෙන් අනතුරු ව අව්‍යයපද මෙන් වේ. අව්‍යය සංඛ්‍යාත උපසර්ගයක් හෝ නිපාතයක් හෝ පෙරටු ව යෙදී ඒ අව්‍යයාගේ ම අර්ථයට ප්‍රමුඛස්ථානය දෙමින් ගළපන සමාසය අව්‍යයීභාව සමාස යි. අකාරාන්ත නොවන අව්‍යයීභාව සමාස පද සියලු විභක්තිවල එක ම රූපයෙන් සිටී.

අකාරාන්ත අව්‍යයීභාව සමාසපද තෘතීයා (उपनगरेण/उपनगरम्) සප්තමී (उपनगरे/ उपनगरम्) දෙකෙහි විකල්ප වශයෙන් ද පඤ්චමියෙහි (उपनगरात्) නිත්‍ය වශයෙන් ද වෙනස් රූප ගනියි.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- සිංහලයේ ඉරහඳ, මව් පිය, සුදුමල, නිලුපුල්, තිනෙත් ආදි සමාසපද සංස්කෘතයට පරිවර්තනය කරමින් සිංහල (මාධ්‍ය භාෂාගත) සමාස සහ සංස්කෘත සමාස අතර සමානතා සහ අසමානතා හඳුනාගැනීමට මෙහෙයවන්න.
- සංස්කෘතයේ භාවිත වන විවිධ සමාස වර්ග විශ්ලේෂණය කොට සමාසපද හඳුනාගැනීමට සලස්වන්න.

.

- සමාස නොවූ පද ලැයිස්තු [උදාඃ अर्थश्च धर्मश्च = अर्थधर्मौ , अन्यश्च अन्यश्च = अन्योन्यम् , महान् पुरुषः = महापुरुषः)] සපයමින් ඒවා සමාස කිරීමේ සහ සමාස වර්ග කිරීමේ අභ්‍යාසවල යොදවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සමාස ප්‍රභේද ලියා දක්වයි.
- සමාස කිරීමේ දී දෙකක් හෝ ඊට වඩා වැඩි ගණනක් හෝ පද සමාස වන බව ප්‍රකාශ කරයි.
- දෙන ලද ඡේදයක් ඇසුරින් වචන දෙකේ සමාස, වචන තුනේ සමාස වෙන් කොට ලියා දක්වයි.
- එක් එක් වර්ගයකට ආවේණික සමාස ඉදිරිපත් කළ හැකි බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- සමාස වර්ගීකරණය දැක්වෙන රුක් සටහන.

**වැඩිදුර ගවේෂණය**

- A Higher Sanskrit Grammar, Kale, M.R.: Delhi,1995.
- ආධුනික සංස්කෘත ව්‍යාකරණය, මැක්ඩොනල්,ඒ.ඒ.ඃ අනුඃ ගුණපාල සේනාධීර, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1994.
- සංස්කෘත ශික්ෂකය II, ජයසූරිය, එම්.එච්.එෆ්.ඃ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ, 1961.

## 9. ඒකකය ප්‍රත්‍යයාර්ථ ක්‍රියා

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.8 ප්‍රත්‍යයාර්ථක්‍රියාපද හඳුනාගෙන භාවිත කරයි.

**කාලච්ඡේද** 06

**ඉගෙනුම් පල**

- ප්‍රත්‍යයාර්ථක්‍රියාපද යනු මොනවා ද යි පැහැදිලි කරයි.
- ඊප්සාර්ථක්‍රියාපද යෙදීම හඳුනාගනියි.
- ප්‍රයෝජ්‍යක්‍රියාපද හා අතිශයාර්ථක්‍රියාපද අතර වෙනස හඳුනාගනියි.
- නාමධාතුකක්‍රියා විස්තර කරයි.
- ඊප්සාර්ථ, ප්‍රයෝජ්‍යාර්ථ, නාමධාතුක යන ක්‍රියාපද භාෂා භාවිතයේ දී නිවැරැදි ව යොදාගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

ප්‍රත්‍යයාර්ථක්‍රියාපද පිළිබඳ මූලික අවබෝධයක් සිසුන් තුළ ඇති කොට ඒවායේ ඇති ප්‍රයෝජන හා භාවිත කරන ආකාරය පිළිබඳ දැනුම ලැබෙන පරිදි පාඩම් සැලසුම් සකස් විය යුතු වේ.

ප්‍රත්‍යයාර්ථක්‍රියාපද යනුවෙන් හැඳින්වෙන්නේ ද්විතීයික ක්‍රියා ය. මේවා ප්‍රධාන වශයෙන් වර්ග තුනකට බෙදා දැක්විය හැකි ය. එනම්, ඊප්සාර්ථ, ප්‍රයෝජ්‍ය, අතිශයාර්ථ යනුවෙනි. මීට අමතර ව ධාතුමූලික නොවූව ද නාමධාතුක ක්‍රියාපද ද මේ ගණයෙහි ලා සැලකිය හැකි ය.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- **ඊප්සාර්ථක්‍රියා:**

  අපේක්ෂාවක් හෝ අභිලාෂයක් හෝ ප්‍රකාශ කිරීමෙහි දී ඊප්සාර්ථක්‍රියා භාවිත වන බව හා මෙහි විශේෂ ලක්ෂණය වන්නේ ධාතුවේ ප්‍රථම වර්ණය ද්විත්ව වීමත් සකාරාන්ත වීමත් බව

  උදා: ✓पा > पिपासति

  ✓कित् > चिकित्सति

  ✓तृ > तितीर्षति

- **ප්‍රයෝජ්‍ය ක්‍රියා:**

  යමකු ලවා කරවීම, පෙලඹවීම, මෙහෙයවීම යන අර්ථ ලබාදෙන්නා වූ ද්විතීයක ක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා වශයෙන් හැඳින්වෙන බව හා එම ක්‍රියා වරනැඟෙන්නේ 10 වැනි ගණයේ ධාතු වරනැඟෙන ආකාරයෙන් බව

  උදා: ✓चुर् > चोरयति

  ✓कृ > कारयति

  ✓बुध् > बोधयति

- आ කාරාන්ත බොහෝ ධාතුවල දී ප්‍රත්‍යයයට මුලින් प ආගම වන බව

  උදාඃ ✓दा > दापयति
  ✓ज्ञा > ज्ञापयति
  ✓स्ना > स्नापयति

- **අතිශයාර්ථ ක්‍රියාපදඃ**
  අතිශයින් කිරීම හෝ පුන පුනා කිරීම හෝ යන අර්ථයෙන් මෙම ක්‍රියා අතිශයාර්ථක්‍රියා යනුවෙන් හැඳින්වෙන බව හා රිද්මානුකූල ද්විත්වයත් ය ප්‍රත්‍යයත් වීම මෙහි ලක්ෂණ බව

  උදාඃ ✓दी > देदीप्यते
  ✓भू > बोभूयते
  ✓नी > नेनीयते

- **නාමධාතුක ක්‍රියාපදඃ**
  නාමයකින් සාදාගනු ලබන ක්‍රියාපද නාමධාතුක ක්‍රියාපද යනුවෙන් හැඳින්වෙන බව හා ධාතුව හා ප්‍රත්‍යය අතරට 'අය' ආගම වන බව

  උදාඃ द्रुम > द्रुमायते
  पुत्र > पुत्रायते
  गोप > गोपायते

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- ප්‍රත්‍යයාර්ථක්‍රියාපද යනු මොනවා දැ යි විස්තර කර දෙන්න.
- ඊප්සාර්ථ, ප්‍රයෝජ්‍ය, අතිශයාර්ථ හා නාමධාතුක ක්‍රියාපද ඇතුළත් පද ලැයිස්තුවක් සපයා ඒවා වෙන වෙන ම වර්ග කොට ඒවායේ මූලය සෙවීමට උපදෙස් දෙන්න.
- ප්‍රත්‍යයාර්ථක්‍රියා ප්‍රභේදවලට අදාළ වචන ඇසුරින් වාක්‍ය කිහිපයක් සකස් කිරීමට සිසුන් යොමු කරන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- ප්‍රත්‍යයාර්ථක්‍රියාපද සාධනය ලියා දක්වයි.
- ඊප්සාර්ථ, ප්‍රයෝජ්‍ය, අතිශයාර්ථ හා නාමධාතුකක්‍රියා ඇතුළත් ලැයිස්තුවක් සකසයි.
- ලැයිස්තුගත ක්‍රියාපද තුළ ඇති මූලය වෙන් කොට ලියා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- ප්‍රත්‍යයාර්ථක්‍රියාවල හා ප්‍රාථමිකක්‍රියාවල අර්ථය සහිත සටහනක්.

**වැඩි දුර ගවේෂණය**


- ආධුනික සංස්කෘත ව්‍යාකරණය, මැක්ඩොනල්,ඒ.ඒ.ඃ අනුඃ ගුණපාල සේනාධීර, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1994.
- නාමාඛ්‍යාත පදමාලා, පේමරතන හිමි, වරාගොඩ.ඃ සමයවර්ධන, 1995.
- A Higher Sanskrit Grammar, Kale, M.R.: Delhi,1995.

## 10. ඒකකය අව්‍යයපද

2.0 **නිපුණතාව**

භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරැදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2.9 අව්‍යයපද භාවිත කරයි.

**කාලච්ඡේද** 03

**ඉගෙනුම් පල**

- අව්‍යයපදවල ඇති වැදගත්කම පැහැදිලි කරයි.
- අව්‍යයපද වාක්‍යවල යෙදීමේ නිපුණත්වය ලබයි.
- නාම හා ක්‍රියා හැරුණු විට වාක්‍ය තුළ බහුල ලෙස අව්‍යයපද ඇති බව උදාහරණ මඟින් පෙන්වයි.
- උපසර්ගවල ඇති විශේෂාර්ථ හඳුනාගනියි.
- නිපාතපද වර්ගීකරණය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

12 වැනි ශ්‍රේණියේ 13 වැනි ඒකකයට අදාළ ව දී ඇති උපදෙස් හා එම ඒකකයේ විෂය කරුණු පුනරීක්ෂණය කරමින් අව්‍යයපද පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදීමට මෙම ඒකකයේ දී කටයුතු කළ යුතු වේ.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- උපසර්ග හා නිපාත පිළිබඳ ව මූලික අවබෝධයක් ලබාදිය යුතු බව
- නාමයකට හෝ ධාතුවකට හෝ මුලින් උපසර්ගයක් එකතු වීමෙන් ඉන් හැඟවෙන අර්ථයේ වෙනසක් ඇති බව හා ඇතැම් විට අර්ථය ශක්තිමත් වන අතර ඇතැම් විට දුර්වල වන බව
- නිපාත වර්ග කිහිපයකට බෙදා දැක්විය හැකි ය.

1. සම්බන්ධීකාරක නිපාත

    වචන එක් කිරීම- अथ । अधः । उत । च

    වචන වෙන් කිරීම- वा

    ප්‍රතිපක්ෂ වීම- अथवा । किंतु । किंवा

    නියමයන් දැක්වීම- चेत् । यदि

    ප්‍රශ්න කිරීම- अहोस्वित् । उत । उताहो

    කාලය සම්බන්ධ කිරීම- यावत् । तावत् । यदा । तदा

2. නිෂේධාර්ථක නිපාත- मा । अलम्

3. විස්මයාර්ථක නිපාත- आ । हा । अहो । हहा

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- පාඨ්‍ය ග්‍රන්ථවල සෝපසර්ගපද තෝරා ඒවා විශ්ලේෂණය කරවන්න.
- පාඨ්‍ය ග්‍රන්ථවල ඇතුළත් නිපාතපද තෝරා ඒවායෙන් ඉටු වන කාර්යය අවබෝධ කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- අව්‍යයපද වර නොනැගෙන බව විස්තර කරයි.
- නිපාතපද වෙනස් නොවන බව ප්‍රකාශ කරයි.
- උපසර්ගපදයක් මුලින් ද යෙදෙන බව ලියා දක්වයි.
- වාක්‍යයේ සියලු තැන්හි නිපාත යෙදිය හැකි බව වාක්‍ය නිර්මාණයෙන් පෙන්නුම් කරයි.
- අව්‍යයපද යොදා සරල වාක්‍ය සකසයි.

**ගුණාත්මක යෙදවුම්**

- අව්‍යයපද බෙදී යන අයුරු දැක්වෙන පුවරුවක්

**වැඩි දුර ගවේෂණය**


- ආධුනික සංස්කෘත ව්‍යාකරණය, මැක්ඩොනල්,ඒ.ඒ.: අනුඃ ගුණපාල සේනාධීර, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1994.
- නාමාඛ්‍යාත පදමාලා, පේමරතන හිමි, වරාගොඩ.: සමයවර්ධන, 1995.

## 11. ඒකකය අර්ථාවබෝධය (නිර්දිෂ්ට ගද්‍ය)

**3.0 නිපුණතාව**

කියවා අර්ථය අවබෝධ කරගනියි.

**නිපුණතා මට්ටම**

3.1 සරල ගද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කරගනියි.

**කාලච්ඡේද** 12

**ඉගෙනුම් පල**

- සරල ගද්‍ය පාඨ නිවැරැදි ව කියවයි.
- කියවන ලද ගද්‍ය පාඨවල අර්ථය අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි.
- සරල ගද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංස්කෘත සාහිත්‍යයේ එක් ප්‍රභේදයක් වන සංස්කෘත ගද්‍ය සාහිත්‍යය ග්‍රන්ථ සංඛ්‍යාත්මක ව සීමිත ය. එහෙත් තද්භාෂා ඥාන වර්ධනය සඳහා ඒවා අධ්‍යයනය කිරීම ද අතිශයින් වැදගත් වේ. එබැවින් එම කෘතිවලින් උද්ධෘත කොටස් සංස්කෘත ප්‍රවේශ - ගද්‍යපද්‍යාවලී III සංග්‍රහයේ අන්තර්ගත කොට ඇත. ඒවා පිළිබඳ මනා අවබෝධයක් සිසුන් තුළ ඇති වන පරිදි පාඩම් සැලසුම් කරගත යුතු වේ.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරින් උපදේශ කථා සාහිත්‍යයේ පාඨ කිහිපයක් එක්රැස් කරගත යුතු බව
- නාට්‍ය හා ගද්‍ය කාව්‍ය කෘතිවලින් පාඨ කිහිපයක් තෝරාගත යුතු බව
- උපුටාගත් පාඨ කියවා අර්ථය අවබෝධ කරවිය යුතු බව
- අර්ථාවබෝධය සඳහා සරල ගද්‍ය ඡේදවලින් පටන්ගෙන සංකීර්ණ ගද්‍ය ඡේද තෙක් සිසුන් මෙහෙයවිය යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- නිර්දිෂ්ට ගද්‍ය කොටස්වලින් වාක්‍ය දෙකකින් හෝ තුනකින් හෝ සමන්විත ගද්‍ය පාඨ 10ක් තෝරා ලිවීමට සලස්වන්න.
- ශිෂ්‍යයන් ලවා ඒවා මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරවන්න.
- එම උද්ධෘත පාඨවල භාෂා ප්‍රයෝගාදිය පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.
- දුරවබෝධ පද ලැයිස්තුගත කර තේරුම් ලියවන්න.
- සරල ගද්‍ය ඡේදවලින් පටන් ගෙන සංකීර්ණ ගද්‍ය ඡේද තෙක් පරිවර්තන කාර්යයෙහි යොදවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- අර්ථාවබෝධයෙන් යුතු ව සරල ගද්‍ය පාඨ කියවයි.
- සරල ගද්‍ය පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කර ලියා දක්වයි.
- සරල ගද්‍ය පාඨවල ඇති දුරවබෝධ පද වර්ගීකරණය කරයි.
- දෙන ලද ගද්‍ය ඡේදයක් කියවා එහි අර්ථය නැවත මතකයෙන් ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට කෘතිවලින් තෝරාගත් පාඨ ඇතුළත් ඡායා පිටපත්

**වැඩි දුර ගවේෂණය**

- **සංස්කෘත ප්‍රවේශ, ගද්‍යපද්‍යාවලී** III
  මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි, ආචාර්ය පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි, මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ, ආචාර්ය කේ.බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඒ.කේ.එච්. ධර්මප්‍රිය

## 12. ඒකකය අර්ථාවබෝධය (නිර්දිෂ්ට පද්‍ය හා මිශ්‍ර කාව්‍ය)

**3.0 නිපුණතාව**

කියවා අර්ථය අවබෝධ කරගනියි.

**නිපුණතා මට්ටම**

3.2 සරල පද්‍ය පාඨ හා ගද්‍ය-පද්‍ය මිශ්‍ර පාඨ කියවා අර්ථය අවබෝධ කරගනියි.

**කාලච්ඡේද 15**

**ඉගෙනුම් පල**

- සරල පද්‍ය පාඨ හා මිශ්‍ර පාඨ නිවැරැදි ව කියවයි.
- කියවන ලද පද්‍ය හා මිශ්‍ර පාඨවල අර්ථය අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි.
- සරල පද්‍ය හා මිශ්‍ර පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.
- තෝරාගත් පද්‍ය පාඨ ලයාන්විත ව ගායනය කරයි.

**පාඩම් සැලසුම් හා උපදෙස්**

පද්‍ය භාවිතය සංස්කෘත සාහිත්‍යයේ බෙහෙවින් පැතිර පවත්නා ලක්ෂණයකි. රිද්මානුකූල රචනා හඳුනාගනිමින් පද්‍ය පාඨ පරිවර්තන ශක්‍යතාව ඇති කරගැනීමත් ඒ ආශ්‍රයයෙන් භාෂා ඥානය වර්ධනය කරගැනීමත් අතිශයින් වැදගත් වේ. ඒ සඳහා නියමිත කාලච්ඡේද සංඛ්‍යාව තුළ නිර්දිෂ්ට කෘතියේ පද්‍ය හා මිශ්‍ර කොටස් ඇසුරින් අපේක්ෂිත ඉගෙනුම් පල සිසුන් තුළ ගොඩනැගෙන පරිදි පාඩම් සැලසුම් කර ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ද්විතීයාදර්ශ, පඤ්චතන්ත්‍ර, කථාසරිත්සාගර ආදි ග්‍රන්ථාශ්‍රිත නිර්දිෂ්ට පාඨ අතරින් කිහිපයක් තෝරාගත යුතු බව
- හිතෝපදේශ, රත්නාවලී, අභිඥානශාකුන්තල වැනි ග්‍රන්ථාශ්‍රිත නිර්දිෂ්ට පාඨ අතරින් කිහිපයක් තෝරාගත යුතු බව
- තෝරාගත් ඉහත කෘතීන්හි අර්ථය මාධ්‍ය භාෂාවට පරිවර්තනය කළ යුතු බව
- දුරවබෝධ පද පිළිබඳ ව අවධානය යොමු කළ යුතු බව
- සන්ධිපද හා සමාසපද පිළිබඳ ව අවධානය යොමු කරමින් අර්ථ ලියා දැක්විය යුතු බව

**යෝජිත ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රමය**

- සරල පද්‍ය පාඨ හා ගද්‍ය පද්‍ය මිශ්‍ර පාඨ නිර්දිෂ්ට කෘතියෙන් තෝරාගෙන කියවීමට සලස්වන්න.
- හඳුනාගත් ශ්ලෝක රිද්මානුකූල ව ගායනය කරවන්න.
- අර්ථාවබෝධය පිණිස කණ්ඩායම් ක්‍රියාකාරකම් කරවන්න.
- සිසුන් කණ්ඩායම්වලට බෙදා තෝරාගත් නිර්දිෂ්ට පාඨවල ඇති සන්ධි, සමාස, තද්ධිත, කෘදන්ත, ප්‍රත්‍යයාර්ථ ක්‍රියා, අව්‍යයපදාදිය ලැයිස්තුගත කිරීමේ ව්‍යාපෘතියක යොදවන්න.
- ඉහත ක්‍රියාකාරකම් පිළිබඳ ව සමාලෝචනයක යෙදෙන්න.

**තක්සේරුව හා ඇගයීම**

- පද්‍ය පාඨ අර්ථාවබෝධයෙන් යුක්ත ව ශබ්ද නගා කියවයි.
- දෙන ලද ගද්‍ය-පද්‍ය මිශ්‍ර පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කර පෙන්වයි.
- ශ්ලෝක සමූහ වශයෙන් කියවයි.
- ගායනය කරන ලද ශ්ලෝක මතකයේ රඳවා අරුත් ලියා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ

**වැඩි දුර ගවේෂණය**

- **සංස්කෘත ප්‍රවේශ, ගද්‍යපද්‍යාවලී** III
  මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි, ආචාර්ය පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි, මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ, ආචාර්ය කේ.බී. ජයවර්ධන, ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය ඒ.කේ.එච්. ධර්මප්‍රිය

## 13. ඒකකය සාහිත්‍ය නිර්මාණ

**4.0 නිපුණතාව**

සාහිත්‍ය රසාස්වාදයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

4.1 සාහිත්‍යාත්මක නිර්මාණයක ලක්ෂණ හඳුනාගනියි.

4.2 සංස්කෘත ඡන්දෝලංකාර පිළිබඳ සරල අවබෝධයක් ලබාගනියි.

**කාලච්ඡේද** 13

**ඉගෙනුම් පල**

- සාහිත්‍යාත්මක නිර්මාණයක මූලික ලක්‍ෂණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- ඍජු භාෂණ, ප්‍රවෘත්ති කථන හා සාහිත්‍ය නිර්මාණ අතුරින් සාහිත්‍ය නිර්මාණ වෙන් කොට හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- සාහිත්‍ය නිර්මාණයක අන්තර්ගත වෘත්ත හා අලංකාරාදි මූලික කාව්‍ය ලක්‍ෂණ වෙන වෙන ම අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි.
- සාහිත්‍ය නිර්මාණවල උපයුක්ත සෞන්දර්යාත්මක යෙදුම් හා විශේෂ භාෂා ප්‍රයෝග වෙන් කොට දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

මෙම ඒකකයේ දී නිර්දිෂ්ට ගද්‍ය-පද්‍ය කොටස් ඇසුරින් සාහිත්‍යාත්මක නිර්මාණයක ලක්‍ෂණ හඳුනාගැනීමත් සංස්කෘත සාහිත්‍යයේ එන ඡන්දස් හා අලංකාර පිළිබඳ සරල දැනුමක් ලබාගැනීමත් සිසුන්ගෙන් අපේක්‍ෂා කරන බැවින් නියමිත කාලච්ඡේද සංඛ්‍යාව තුළ ඉහත නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි පාඩම් සැලසුම් කරගත යුතු වේ.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ඍජු භාෂණ, ප්‍රවෘත්ති කථන හා සාහිත්‍ය නිර්මාණ අතුරින් සාහිත්‍ය නිර්මාණ වෙන් කොට හඳුනාගත යුතු බව
- තෝරාගත් නිර්මාණ කොටස්වල ඇති අලංකාර, වෘත්ත සහ භාෂා ප්‍රයෝග ආදිය පැහැදිලි කරගත යුතු බව
- අලංකාරඃ- උදාඃ උපමා, රූපක, උත්ප්‍රේක්ෂා, ස්වභාවෝක්ති
- වෘත්තඃ- උදාඃ වසන්තතිලකා, ශාර්දූලවික්‍රීඩිත, මාලිනී, මන්දාක්‍රාන්තා
- භාෂා ප්‍රයෝගඃ- ''इहोपविश्य इदमासनमलंक्रियताम् '' (මෙහි වාඩි වී මෙම අසුන අලංකාර කළ මැනවි)
- ''स्निग्धजनसंविभक्तं हि दुःखं सह्यवेदनं भवति।'' (මෘදුසිත් ඇත්තන් සමග බෙදාගත් විට දුක ඉවසාගත හැකි ය.- අභිඥානශාකුන්තල)
- භාෂා ප්‍රයෝග හා සෞන්දර්යාත්මක යෙදුම් නිර්දිෂ්ට කෘති ඇසුරින් තෝරාගෙන සිසුන්ට ලබා දිය යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- සෙසු භාෂා ව්‍යවහාරයන්ට වඩා සාහිත්‍ය නිර්මාණයක භාෂා ව්‍යවහාරය වෙනස් වන අයුරු සිසුන්ට පැහැදිලි කරන්න.
- සාහිත්‍ය නිර්මාණයක මූලික ලක්‍ෂණ සාකච්ඡා කරන්න.
- සංස්කෘත වෘත්ත හා අලංකාර පිළිබඳ ව මූලික හැඳින්වීමක් කරන්න.
- මේ සඳහා විෂය කරුණුවල සංක්ෂිප්තය යටතේ ඇති අලංකාර හා වෘත්ත පමණක් උදාහරණ ලෙස යොදාගන්න.

- නිර්දිෂ්ට කෘතිවල අන්තර්ගත නිර්මාණාත්මක හා සෞන්දර්යාත්මක භාෂා ප්‍රයෝග, නාට්‍ය සංවාද ආදිය උපුටාගෙන සිසුන්ට ලබා දී සාකච්ඡා කරන්න. ඒවායෙහි නිර්මාණාත්මක අගය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- කාව්‍යෝක්ති යනු කුමක් ද යි විස්තර කරයි
- ඡන්දස් හා අලංකාර පිළිබඳ පැහැදිලි කරයි.
- සාහිත්‍ය නිර්මාණයක ඇතුළත් කාව්‍යෝක්ති වෙන් කර ලියා දක්වයි.
- සාහිත්‍ය නිර්මාණයෙහි ඇති කථා මතකයෙන් කියවයි.
- දෙන ලද සාහිත්‍ය නිර්මාණයක් කියවා ඉන් ලබන අත්දැකීම ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථවලින් උපුටාගත් කොටස් ඇතුළත් ඡායා පිටපත්.
- අන්තර්ජාලයෙන් තෝරාගත් උපදේශ සාහිත්‍යයේ කථා ඇතුළත් වීඩියෝ දර්ශන සහිත සීඩී/ඩීවීඩී තැටි

**වැඩි දුර ගවේෂණය**

- ද්විතීයාදර්ශ, කථාසරිත්සාගර, හිතෝපදේශ, රත්නාවලී, ප්‍රතිඥායෞගන්ධරායණ යන ග්‍රන්ථවල නිර්දිෂ්ට පාඨ

# 14. ඒකකය - සාහිත්‍ය රසාස්වාදය

**4.0 නිපුණතාව**

සාහිත්‍ය රසාස්වාදයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

4.3 සාහිත්‍යාත්මක පාඨයක රසය විඳගනියි; ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද** 13

**ඉගෙනුම් පල**

- කාව්‍ය ලක්ෂණානුසාරයෙන් සාහිත්‍යාත්මක පාඨ විචාරශීලී ව රස වින්දනය කළ හැකි බව පෙන්වා දෙයි.
- තෝරාගත් සාහිත්‍යාත්මක පාඨයක වින්දනීය රසය ප්‍රකාශ කරයි.
- සාහිත්‍ය රස වින්දන හැකියාව මගින් නිර්මාණ කෞශල්‍යය දියුණු වන බව පහදයි.
- ජීවිතය දෙස සෞන්දර්යාත්මක ව හා සංවේදී ව බැලීමට සාහිත්‍ය රසාස්වාදය ප්‍රබල අනුබලයක් ලබා දෙන බව පෙන්වා දෙයි.
- සාහිත්‍යාත්මක චරිත පුද්ගල චරිත හා සංසන්දනය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

මේ සඳහා නිර්දිෂ්ට කෘතිවලින් තෝරාගත් සාහිත්‍යාත්මක පාඨ යොදාගත යුතු ය. එහි දී ශබ්දාලංකාර සහ අර්ථාලංකාර ඇතුළත් පාඨ තෝරාගැනීම සුදුසු ය. එසේ ම ඒවායේ එන භාෂා ප්‍රයෝග, කාව්‍යෝක්ති ආදිය ගැන අවධානය යොමු කරමින් රසවින්දන කාර්යයෙහි යෙදීම අත්‍යවශ්‍ය වේ.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- තෝරාගත් සාහිත්‍යාත්මක පාඨ අයත් වන සාහිත්‍ය ප්‍රභේදත්, එම ප්‍රභේදයන්ට අයත් සෙසු ග්‍රන්ථ සහ ඒවායේ කර්තෘවරුනුත් ඇතුළත් නාමාවලියක් සකස් කළ යුතු බව
- අදාළ පද්‍ය පාඨ ගායනයට ශිෂ්‍යයා යොමු කරවමින් ඔහුගේ වින්දන ශක්තිය උසස් කිරීමට කටයුතු කළ යුතු බව
- ශිෂ්‍යයන් කණ්ඩායම්ගත කොට අධීත නාට්‍ය පාඨයන්හි එන දෙබස් නිරවද්‍ය ලෙස කථනයෙහි යෙදවිය යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය**

- වින්දනීය සාහිත්‍යාත්මක පාඨ නිර්දිෂ්ට කෘති ඇසුරින් තෝරාගන්න.
- උපදේශ කථා සාහිත්‍යය, නාට්‍ය සාහිත්‍යය ආදියෙන් ගත් උද්ධෘත භාවිත කරන්න.
- සාහිත්‍යාත්මක නිර්මාණ විචාරශීලී ව රස වින්දනය කරන අයුරු පහදා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් උසස් සාහිත්‍ය රස වින්දන හැකියාවක් දියුණු වන ලෙස සිසුන් මෙහෙයවන්න.

**තක්සේරුව හා ඇගයීම**

- සාහිත්‍ය නිර්මාණයක ඇති කාව්‍ය ලක්ෂණ විස්තර කරයි.
- තමා උගත් සාහිත්‍යාත්මක චරිත පිළිබඳ ලිපියක් ලියයි.
- උපදේශාත්මක සාහිත්‍යයේ චරිත පිළිබඳ අගය කරමින් කතාවක් කරයි.
- සරල කතා ගොඩනඟා සාහිත්‍යය පෝෂණය කරයි.

**ගුණාත්මක යෙදුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථය
- රසවින්දනාත්මක අගයන් ඇති හිතෝපදේශ, පඤ්චතන්ත්‍ර නොහොත් රාමායණ, මහාභාරත යන කෘතිවලින් උපුටාගත් කොටස්.
- උපදේශ කථා හා වීර කථා ඇතුළත් වීඩියෝ හා ඡායාරූප සහිත DVD හෝ VCD හෝ තැටි
- පරිගණකයක් / රූපවාහිණී යන්ත්‍රයක්/DVD ධාවකයක්.

**වැඩි දුර ගවේෂණය**

තෘතීයාදර්ශ, පඤ්චතන්ත්‍ර, ස්වප්නවාසවදත්ත, ප්‍රතිඥායෞගන්ධරායණ, යන ග්‍රන්ථවල නිර්දිෂ්ට පාඨ.

## 15. ඒකකය - සාරධර්ම හඳුනාගැනීම

**5.0 නිපුණතාව**

භාෂා සාහිත්‍යයෙහි අන්තර්ගත සාරධර්ම චරිතාබද්ධ කරයි; ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටම**

5.1 පාඨයක අන්තර්ගත සාරධර්ම හඳුනාගනියි**.** චරිතාබද්ධ කරයි.

**කාලච්ඡේද** 13

**ඉගෙනුම් පල**

- භාෂා සාහිත්‍යාදියට සංවේදී නොවීම සමාජයේ සාරධර්ම පරිහාණියට හේතු වන බව පෙන්වා දෙයි.
- සංස්කෘත සාහිත්‍යයේ එන සාරධර්මවල සමාජ උපයෝගිතාව නිර්දිෂ්ට පාඨානුසාරයෙන් අවබෝධ කොට ප්‍රකාශ කරයි.
- සාරධර්ම ජීවිතයට බද්ධ කරගන්නා අයුරු සාමූහික ව සාකච්ඡා කරයි.
- අධීත සාරධර්ම අවස්ථානුකූල ලෙස ජීවිතයෙන් ප්‍රකාශයට පත් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

විවිධ සාහිත්‍ය ප්‍රභේද ඔස්සේ නොයෙක් විෂය තේමාවලට අයත් සාරධර්ම පිරුණු සාහිත්‍යයක් සංස්කෘතය සතු ය. එය මැනවින් අවබෝධ කොට ජීවිතය සමග ගළපාගැනීමට උනන්දු කරවීම අතිශයින් වැදගත් වේ. ඒ සඳහා සංස්කෘත සාහිත්‍යයේ එන මහාකාව්‍ය, ඛණ්ඩකාව්‍ය, බෞද්ධ සංස්කෘත හා ආයුර්වේද සාහිත්‍ය කෘතිවලින් උපුටාගත් කොටස් නිර්දිෂ්ට කර ඇත. එම නිර්දිෂ්ට කොටස් ආධාරයෙන් සාරධර්ම හඳුනාගැනීමටත්, චරිතාබද්ධ කරගැනීමටත් සිසුන් යොමු කරවිය යුතු ය.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නිර්දිෂ්ට කෘතිවලින් තේමාවට උචිත පාඨ කිහිපයක් තෝරාගත යුතු බව
- බෞද්ධ සංස්කෘත සාහිත්‍යය හා ආයුර්වේද සාහිත්‍යය කෘතිවලින් තෝරාගත් පාඨ සිසුන්ට ඉදිරිපත් කළ යුතු බව
- තෝරාගත් ගද්‍ය හෝ පද්‍ය පාඨයේ අන්තර්ගතය අවබෝධ කරවිය යුතු බව
- යථෝක්ත පාඨවල අන්තර්ගත සාරධර්මවල සර්වකාලීන අගය පැහැදිලි කළ යුතු බව
- නිර්දිෂ්ට ග්‍රන්ථාගත පාඨ ආශ්‍රයයෙන් සාරධර්ම සහ ඒ හා බැඳෙන අවස්ථා කිහිපයක් තෝරා දක්විය යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- සාරධර්ම දක්වෙන ප්‍රකාශ ඇතුළත් ලැයිස්තුවක් පිළියෙළ කරවන්න.
- තෝරාගත් පාඨවල දක්වෙන සාරධර්ම දෛනික ජීවන අත්දැකීම් හා සමාජ ක්‍රියාකාරකම් සමග සන්සන්දනය කරන්න.
- සාරධර්ම භාවිතයට ගත හැකි අවස්ථා ද එමගින් ලබාගත හැකි ප්‍රතිඵල ද ඉදිරිපත් කරන කණ්ඩායම් ක්‍රියාකාරකමක ශිෂ්‍යයන් යොදවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- ශිෂ්‍ය සංගම්වල දී පන්තිය ඉදිරියේ දී සාරධර්ම අන්තර්ගත සංස්කෘත ප්‍රකාශ සහිත පුවරු සකසා ප්‍රදර්ශනය කරයි.
- දෛනික පුවත්පත්, බිත්ති පුවත්පත්, සඟරා ආදියට උක්ත සාරධර්ම ප්‍රකාශ පදනම් කොට ගෙන කුඩා නිර්මාණ ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ

**වැඩි දුර ගවේෂණය**

- නලෝපාඛ්‍යානය, ඍතුසංහාර, සාවිත්‍ර්‍යුපාඛ්‍යාන, සෞන්දරනන්ද, චරකසංහිතා යන ග්‍රන්ථවල නිර්දිෂ්ට පාඨ

## 16 ඒකකය - සාරධර්ම ඇගයීම

**5.0 නිපුණතාව**

භාෂා සාහිත්‍යයෙහි අන්තර්ගත සාරධර්ම චරිතාබද්ධ කරයි; ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටම**

5.2 සාරධර්ම අගයයි, ප්‍රකාශ කරයි

5.2 ශිල්පීය නිපුණතා සඳහා අවශ්‍ය මූලික ප්‍රවේශය ලබයි.

**කාලච්ඡේද 08**

**ඉගැනුම් පල**

- භාෂා සාහිත්‍යයෙහි අන්තර්ගත සාරධර්ම හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- හඳුනාගත් සාරධර්මවල ඇති ප්‍රායෝගික වටිනාකම පෙන්වා දෙයි.
- අධීත සාරධර්ම සර්වකාලීන හා සාර්වභෞමික ව භාවිත කළ හැකි බව පහදා දෙයි.
- සංස්කෘත සාහිත්‍යයට අයත් ශිල්ප ග්‍රන්ථ හඳුනාගෙන නම් කරයි.
- ශිල්ප ග්‍රන්ථවල උපයුක්ත ශිල්පීය ඥානය ජීවිතය සාර්ථක කරගැනීමට භාවිත කළ හැකි බව පෙන්වා දෙයි.
- සංස්කෘත සාහිත්‍යාගත සාරධර්ම, කෙටි නිර්මාණ රචනා වශයෙන් ලියා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

මහාකාව්‍ය, ඛණ්ඩකාව්‍ය, බෞද්ධ සංස්කෘත හා ආයුර්වේද සාහිත්‍ය කෘති වලින් තෝරා ගෙන උද්ධෘත කොට ඇති කොටස් නිර්දිෂ්ට ග්‍රන්ථයේ ඇති අතර ඒවා ඇසුරින් ඉහත නිපුණතා මට්ටමට සිසුන් ළඟා කරවීම මෙම ඒකකයේ අපේක්ෂාව වේ. ශිල්ප ග්‍රන්ථ සාහිත්‍යයට අයත් මඤ්ජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යාශාස්ත්‍ර හා චිත්‍රකර්මශාස්ත්‍ර, වෘහත්පරාශර හෝරාශාස්ත්‍ර ආදි ශිල්ප ග්‍රන්ථ හඳුන්වාදීමත් ඒවායෙහි උපයුක්ත කරුණු සාර්ථක ජීවිතයකට අවශ්‍ය පසුබිම සකසන බව හඳුන්වාදීමත් මෙහි දී අපේක්ෂිත යි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නිර්දිෂ්ට පාඨවල අන්තර්ගත අගය කළ හැකි සාරධර්ම ඇතුළත් පාඨ කිහිපයක් තෝරා ගත යුතු බව
- යථෝක්ත පාඨවල සමාජ වටිනාකම අගය කළ යුතු බව
- එම සාරධර්ම ජීවිතයට ආදේශ කොටගත හැකි ආකාරය සාකච්ඡා කළ යුතු බව
- ජීවන හා සමාජ ගැටලු විසඳන ක්‍රමවේදයක් වශයෙන් සාරධර්ම භාවිතයට ගත යුතු බව
- සංස්කෘත ශිල්ප ග්‍රන්ථාවලිය සංස්කෘත සාහිත්‍යයෙහි වැදගත් අංගයක් වශයෙන් අගය කළ යුතු බව
- නිර්දිෂ්ට ශිල්ප ග්‍රන්ථවල ඇතුළත් දැනුම ජීවිතය සාර්ථක කරගැනීමට උපයෝගි කරගත හැකි බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- නිර්දිෂ්ට කොටස්වල ඇතුළත් සාරධර්ම සහිත ප්‍රකාශ එකතු කරවන්න.
- එකතු කළ සාරධර්ම ඇතුළත් ප්‍රකාශවල ඇති සමාජ වටිනාකම කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් ඉදිරිපත් කරවන්න.
- උගත් සාරධර්ම ඇසුරෙන් විමර්ශනාත්මක රචනයක් පිළියෙළ කරවන්න.

- සාරධර්ම අධ්‍යයනයෙන් යහපත් සමාජයක් ගොඩනැගිය හැකි ආකාරය පහදා දෙන්න.
- වාස්තුශාස්ත්‍ර, චිත්‍රකර්ම, ජ්‍යොතිශ්ශාස්ත්‍ර යන ශිල්ප සාහිත්‍යයට අයත් කොටස් හඳුන්වා දෙන්න.
- ශිල්ප සාහිත්‍යයට අයත් නිර්දිෂ්ට කොටස් ඇසුරෙන් ශිල්පීය නිපුණතා සඳහා අවශ්‍ය මූලික මඟ පෙන්වීමක් ලබා දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- උපුටාගත් සාරධර්ම කොටස් නිවැරැදි ව කියවයි.
- සාරධර්ම සහිත පාඨ එකතුවක් පිළියෙළ කරයි.
- සිත් ගත් සාරධර්ම ඇසුරින් කෙටි නිර්මාණයක් කරයි

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ

**වැඩි දුර ගවේෂණය**

- මේඝදූත, මහාභාරත, සුශ්‍රැතසංහිතා, අෂ්ටාඞ්ගහෘදයසංහිතා, ජානකීහරණ, සද්ධර්මමකරන්ද යන ග්‍රන්ථවල නිර්දිෂ්ට පාඨ

## 17. ඒකකය - භාෂණයේ යෙදීම (ප්‍රශ්න හා පිළිතුරු)

**6.0 නිපුණතාව**

නිරවුල් ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

6.1 ප්‍රශ්න අසයි.

6.2 ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 08

**ඉගෙනුම් පල**

- සංස්කෘත භාෂාවෙන් එදිනෙදා සිදුවීම් පිළිබඳ සරල ප්‍රශ්න අසයි.
- අසන ලද ප්‍රශ්නවලට සංස්කෘත භාෂාවෙන් සරල ව හා නිවැරැදි ව පිළිතුරු ලබා දෙයි.
- ව්‍යක්ත ලෙස සංස්කෘත භාෂාව භාවිත කිරීමේ ශක්‍යතාව ලබයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

අද්‍යතන ලෝකයේ විද්වතුන් අතර සංස්කෘත භාෂාව විවිධ පරමාර්ථ උදෙසා විශේෂයෙන් භාවිත වේ. භාරතීය සමාජය එය ව්‍යාප්ත කිරීමට මහත් පරිශ්‍රමයක් දරනු පෙනේ. සංස්කෘතය කිසි ලෙසකින් වත් මළ බසක් නොවේ. ජීව ගුණයෙන් යුතු ප්‍රායෝගික ව භාවිත කළ හැකි, ප්‍රබල ප්‍රකාශන හැකියාවක් සහිත භාෂාවක් වශයෙන් සංස්කෘත භාෂාව අගය කළ යුතු ය. එදිනෙදා ජීවිතයේ සිදුවීම්වලින් සරල ව පටන්ගෙන ගැඹුරු ප්‍රකාශන තෙක් ව්‍යක්ත ව භාවිත කළ හැකි භාෂාවක් වශයෙන් සංස්කෘතය සිසුන්ට හඳුන්වා දිය යුතු ය.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- දෛනික ජීවිතයේ සිදුවීම් ප්‍රශ්නෝත්තර වශයෙන් ඉදිරිපත් කළ යුතු බව
- වාක්‍යයක මුල, මැද සහ අග යනාදි ස්ථානවල ප්‍රශ්නවාචී නිපාත එකතු කරමින් ප්‍රශ්න ඇසිය හැකි බව
- කාණ්ඩ වශයෙන් බෙදා දෙබස් අයුරින් ප්‍රශ්න ඇසීමට හා පිළිතුරු සැපයීමට සිසුන් යොමු කිරීම
- ව්‍යවහාරයට උචිත භාෂාප්‍රයෝග සංස්කෘත සාහිත්‍යයෙන් ලබා ගත හැකි බව

  උදා: आसनमलङ्क्रियताम्। श्रूयताम्। ब्रूयताम्। उच्यताम्। स्खलन् स्खलन् गच्छति। सत्यमेव तत्। सत्वरं गच्छ। हस्तं प्रसारय। मुखं प्रक्षालय। ततः किमकरोत्।
- එවැනි භාෂාප්‍රයෝග හඳුනාගෙන භාවිත කිරීමට මඟ පෑදීම:

  උදා: आचार्य आगच्छतु। इदमासनमलङ्क्रियताम्। हे छात्राः कदा यूयं उत्तिष्ठत। आचार्य वयं प्रातरेव उत्तिष्ठामः। कथं विद्यालयं आगच्छथ। बस्रथेन द्विचक्रेण च आगच्छामः।

**යෝජිත ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- එදිනෙදා ජීවිතයේ සිදුවීම් ආශ්‍රිත ව සරල ප්‍රශ්න ඇසීමට හා පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරවන්න.
- නාට්‍ය ග්‍රන්ථවලින් ප්‍රශ්නෝත්තර සහිත කොටස් එකතු කොට ඒවා කියැවීමට යොමු කරවන්න.
- ප්‍රශ්න හා පිළිතුරු සහිත පොත් පිංචක් සැකසීමට යොමු කරවන්න.
- සංස්කෘත භාෂාවෙන් සිදුවන ප්‍රශ්නෝත්තර සංවාද අන්තර්ජාලයෙන් හා මුද්‍රිත ප්‍රකාශනවලින් උපුටාගෙන ඇසීමටත් කියවීමටත් සලස්වන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- එදිනෙදා හමුවන දෑ පිළිබඳ ව සංස්කෘතයෙන් සරල ප්‍රශ්න අසයි. ඒවාට පිළිතුරු දෙයි.
- සංස්කෘත භාෂාව ව්‍යාවහාරික භාෂාවක් වශයෙන් භාවිත කළ හැකි බව ප්‍රකාශ කරයි.
- කණ්ඩායම් වශයෙන් බෙදී ප්‍රශ්න කරයි; පිළිතුරු දෙයි.
- ශිෂ්‍ය සංගම් රැස්වීම්වල දී අසන ලද ප්‍රශ්න සඳහා නොබිය ව පිළිතුරු දෙයි.
- කෙටි ප්‍රශ්න සංස්කෘත භාෂාවෙන් ලියා ඒවාට පිළිතුරු සොයයි.

**ගුණාත්මක යෙදවුම්**

- අන්තර්ජාලය භාවිතයෙන් ලබාගත් සංස්කෘත ප්‍රශ්නෝත්තර ඇතුළත් සංවාද
- පරිගණකයක් හෝ රූපවාහිනියක්
- ප්‍රශ්නෝත්තරවාචී පද හා පිළිතුරු ඇතුළත් පුවරු කිහිපයක්
- සංස්කෘත නාට්‍ය කෘතිවල සංවාද සහිත DVD තැටියක්

**වැඩි දුර ගවේෂණය**

- රත්නාවලී, මෘච්ඡකටික ආදි ග්‍රන්ථවලින් තෝරාගත් සංවාද කොටස්

## 18. ඒකකය - භාෂණයේ යෙදීම (සංවාද)

**6.0 නිපුණතාව**

නිරවුල් ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

6.3 උපදෙස් ලබා දෙයි.
6.4 සංවාදයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 08

**ඉගෙනුම් පල**

- සංස්කෘත භාෂා ප්‍රයෝග භාවිත කිරීම පිළිබඳ උපදෙස් අනුගමනය කරයි.
- ආචාර-සමාචාර සඳහා සංස්කෘත යෙදුම් භාවිත කරයි.
- සංස්කෘත භාෂා භාවිතයෙහි චාතුර්යය ලබයි.
- මනා පෞරුෂයකින් යුතු ව සංස්කෘත භාෂණයෙහි යෙදෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

දෛනික ජීවිතයේ අත්විඳින සිදුවීම්වලට අදාළ ව යොදාගත හැකි සංස්කෘත යෙදුම් පිළිබඳ අවබෝධයක් ලබාදිය යුතු ය. සංවාද අවස්ථාවල භාවිත කළ හැකි ආචාර-විද්‍යාත්මක ප්‍රකාශ ඉදිරිපත් කිරීම හා භාවිත භාෂා ප්‍රයෝගවල නිරවද්‍ය භාවය පිළිබඳ අවධානය යොමු කිරීම සුදුසු ය. මේ ඇසුරින් සංස්කෘත භාෂණය පිළිබඳ මනා පෞරුෂයක් සිසුවා තුළ වර්ධනය කිරීම මෙම ඒකකයෙන් අපේක්ෂිත යි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සංස්කෘත භාෂා ප්‍රයෝග භාවිත කළ යුතු බව
- ආචාර සමාචාර ඇතුළත් ප්‍රකාශ සොයාගෙන ඉදිරිපත් කළ යුතු බව
  උදා - **सुप्रभातम्। शुभसन्ध्या। शुभरात्रिः। नमस्ते। चिरं जीवतु। नमो बुद्धाय। नमः श्री घनाय। स्वागतम्। असत्यम् मा वद। सत्यं वद। धर्मं चर। सत्यवान् बालकः भव। अलं कथनेन। अस्माकं दलं जयतु। अहो दिनमिदं परमसुखकरम्। दयां कुरु गुरुदेव।**
- සංවාදයට සුදුසු මාතෘකාවක් තෝරාගත යුතු බව
- සරල අර්ථාන්විත වචන භාවිත කරමින් සංවාදයකට පෙරහුරුවක් පිළියෙළ කළ යුතු බව
- සංවාද මෙහෙයවීම සංස්කෘත භාෂාවෙන් කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ආචාර-සමාචාරවල දී සංස්කෘතයේ භාවිත සරල යෙදුම් ඉදිරිපත් කරන්න.
- එම සරල භාෂා ප්‍රයෝග පන්තියේ දී පුහුණු කරවන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට බෙදා සංස්කෘත භාෂාව භාවිත කරමින් සුහද හමුවක දී ආචාර-සමාචාර පවත්වන අයුරුත් ආ-ගිය තොරතුරු විමසන අයුරුත් නිරූපණය වන පරිදි කණ්ඩායම් ක්‍රියාකාරකම්වල යොදවන්න.
- සංස්කෘත සාහිත්‍යාගත විවිධ සංවාද පාඨ එකතු කරවන්න.
- තෝරාගත් සංවාද පාඨ හඬ නගා කියවීමට සලස්වන්න.
- ස්වාධීන සංවාද නිර්මාණයට උපදෙස් ලබා දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සංස්කෘත භාෂාවෙන් ප්‍රශ්න අසයි.
- අන්තර් - සම්බන්ධතා ගොඩනඟාගැනීමට සංස්කෘත භාෂාව උපයෝගි කරගනියි.
- අදහස් ප්‍රකාශ කිරීමේ දී නවතාවකින් යුතු ව සංස්කෘත භාෂාව භාවිත කරයි.
- මනා පෞරුෂයකින් යුතු ව ඉදිරිපත් වීමේ කුශලතාව ලබයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථයෙන් උපුටාගත් ගද්‍යමය කොටස් හා ඡායා පිටපත්
- අන්තර්ජාලයෙන් සොයාගත් ආචාර සමාචාර ඇතුළත් D.V.D. පටයක්

**වැඩි දුර ගවේෂණය**

- අදාළ ප්‍රකාශ තෝරාගැනීම සඳහා සුදුසු පරිදි සංස්කෘත සාහිත්‍යාගත මූලාශ්‍රයයන් තෝරාගත හැකි ය.
- සංස්කෘත නාට්‍ය ග්‍රන්ථවලට විශේෂ අවධානය යොමු කරමින් සුදුසු සාහිත්‍ය මූලාශ්‍රයවලින් සංවාද පාඨ තෝරාගන්න.

## 19. ඒකකය - ප්‍රායෝගික ව්‍යවහාර

**නිපුණතාව**

6.0 නිරවුල් ව හා පැහැදිලි ව භාෂණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම**

6.5 මාතෘකාවකට අදාළ ව කෙටි දෙසුමක් පැවැත්වීමට සමත් වෙයි.

6.6 භාෂාව ව්‍යක්ත ව භාවිත කරයි.

**කාලච්ඡේද** 06

**ඉගෙනුම් පල**

- නිවැරැදි ව සංස්කෘත භාෂාවෙන් කථාවක් පැවැත්වීමේ හැකියාව ලබයි.
- අසන ලද කථාවක් සංස්කෘත භාෂාවෙන් ලියයි; කියවයි.
- ව්‍යක්ත ලෙස සංස්කෘත භාෂාව භාවිත කිරීමේ ශක්‍යතාව ලබයි.
- දෛනික සටහන්, දිනචරියා, කෙටි සටහන්, මෛත්‍රී භාවනා යනාදි දෑ ලියයි; කියවයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

භාෂණයට අතිරේක ව යම් මාතෘකාවක් යටතේ කිසියම් අදහස් සමූහයක් කථාවක ආකාරයෙන් සංස්කෘතයෙන් ඉදිරිපත් කිරීම භාෂාත්මක ශක්‍යතාව ප්‍රායෝගික ව වර්ධනය වීම විෂයයෙහි උපකාරවත් වෙයි. එම නිසා භාෂා භාවිතයේ දී එය නිවැරැදි ව සහ පැහැදිලි ව භාවිත කිරීමට සිසුන් යොමු කරවීම අවශ්‍ය ය.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නිවැරදි වූ සරල වචන භාවිතයට ගත යුතු බව
- කෙටි වාක්‍ය භාවිතය නිසා උක්තාඛ්‍යාත නිවැරැදි ව යොදාගැනීමට හැකි බව
- කථාවක් පිළිබඳ නිවැරැදි ව්‍යූහය අනුගමනය කළ යුතු බව
- උච්චාරණය පිළිබඳ ව මනා වූ පුහුණුවක් ලබාදිය යුතු නිසා අක්ෂර හා උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය මැනවින් හඳුනාගත යුතු බව
- මේ සඳහා සංස්කෘත සංවාද අන්තර්ගත ශ්‍රව්‍යපට සහ දෘශ්‍යපට භාවිත කළ යුතු බව
- දින සටහන් කෙටි සටහන් ආදිය සංස්කෘත භාෂාවෙන් ලියැවිය යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- විවිධ මාතෘකා ලබා දී නියමිත කාලයක් තුළ පන්ති කාමරයේ දී කථා පැවැත්වීමට ශිෂ්‍යයන් යොමු කරවන්න.
- තමන් දන්නා සරල කථාවක් සංස්කෘත භාෂාවෙන් ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- සංස්කෘත සංවාද පිළිබඳ ව අන්තර්ජාලයේ ඇති තොරතුරු එක්රැස් කරවන්න.
- ශ්‍රව්‍ය පට සහ දෘශ්‍ය පට භාවිත කරමින් නිරවද්‍ය උච්චාරණ අභ්‍යාස කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- නිවැරැදි ව හා නිරවුල් ව සංස්කෘත භාෂාව උච්චාරණය කරයි.
- පවත්වන ලද කෙටි දෙසුම් අවබෝධ කරගෙන ලියා දක්වයි.
- කෙටි සටහන්, දිනචරියා සටහන් ආදිය ඉදිරිපත් කරයි.

- ව්‍යක්ත ලෙස සංස්කෘත භාෂාව හසුරුවයි.

**ගුණාත්මක යෙදවුම්**

- දේවනාගරී නිර්දිෂ්ට කෘතිවලින් උපුටාගත් ඡායා පිටපත් කිහිපයක්
- පරිගණකය
- අන්තර්ජාලයෙන් තෝරාගත් ශ්‍රව්‍ය / දෘශ්‍ය සංවාද කිහිපයක්

**වැඩි දුර ගවේෂණය**

- අන්තර්ජාලයේ අන්තර්ගත සංස්කෘත කථාවලට අවධානය යොමු කිරීම

## 20. ඒකකය - ශ්‍රවණය හා අර්ථාවබෝධය

**7.0 නිපුණතාව**

සවන් දී අර්ථය පැහැදිලි ව හා නිවැරැදි ව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම**

7.1 තෝරාගත් පද්‍ය හෝ ගද්‍ය හෝ පාඨවලට සවන් දී අර්ථ අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද** 10

**ඉගෙනුම් පල**

- ඉදිරිපත් කරන ලද ඡේදයට මැනවින් සවන් දෙයි.
- ඒ පිළිබඳ අර්ථාවබෝධය ලබයි.
- අවබෝධ කරගත් පාඨවල අර්ථය ලියා දක්වයි.
- සංස්කෘත ආප්තෝපදේශ, සාරධර්ම ප්‍රකාශනාදිය සඟරාවල හා බිත්ති පුවත්පත්වල පළ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

භාෂා අධ්‍යයනයේ දී ශ්‍රවණ කුශලතාව සංවර්ධනය කළ යුතු වැදගත් අංශයකි. එම නිසා ශ්‍රවණය සඳහා යෝග්‍ය ගද්‍ය-පද්‍ය පාඨ සොයාගැනීම වැදගත් වේ. එහි දී රාමායණාදි වීරකාව්‍ය, සද්ධර්මමකරන්දාදි මහාකාව්‍ය, චරකසංහිතාදි ආයුර්වේද ග්‍රන්ථ යොදාගැනීම උචිත ය.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සරල සහ සංකීර්ණ ගද්‍ය, පද්‍ය කොටස් තෝරාගත යුතු බව

  උදා:
  - जननी जन्मभूमिश्च स्वर्गादपि गरीयसी ।
  - लोकाः समस्ताः सुखिनो भवन्तु ।
  - रात्रिः शशाङ्कोदितसौम्यवक्त्रा तारागणोन्मीलितचारुनेत्रा ।

    ज्योत्स्नांशुकं प्रावरणा विभाति नारीव शुक्लांशुकसंवृताङ्गी ॥
- හිතෝපදේශ, පඤ්චතන්ත්‍ර ආදි ග්‍රන්ථවලින් සුදුසු ගද්‍ය පාඨ තෝරාගත යුතු බව
- නිර්දිෂ්ට කොටස්වලින් සරල ශ්ලෝක එකතු කර ගායනය කිරීමට සැලැස්විය යුතු බව
- උද්ධෘත ගද්‍ය-පද්‍ය කොටස් හඬ නඟා උච්චාරණය කිරීම හා මැනවින් සවන් දීම කළ යුතු බව
- ශ්‍රවණය කළ උද්ධෘත පාඨවල අර්ථය අවබෝධ කළ යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
- එක් කණ්ඩායමක් ලවා තෝරාගත් පාඨ කියැවීමට සලස්වන්න.
- අනෙක් කණ්ඩායම ඒවාට සවන් දී ප්‍රශ්න ඇසීම වෙත යොමු කරවන්න.
- කණ්ඩායම් මාරු කොට නැවත මෙම ක්‍රියාකාරකම කරවන්න.
- සවන් දී අර්ථාවබෝධය ලැබීමටත් නැවත ඒවා ප්‍රකාශ කිරීමටත් සිසුන් මෙහෙයවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- උද්‍යෝගයෙන් යුතු ව ගද්‍ය - පද්‍ය කොටස්වලට සවන් දෙයි.
- සවන් දී අවබෝධ කරගත් ගද්‍ය - පද්‍ය කොටස් ප්‍රකාශ කරයි.

- පද්‍ය කොටස් ලියා ගායනය කරයි.
- අසන ලද සංස්කෘත පාඨ ලියා සඟරා, බිත්ති පුවත්පත් ආදිය සඳහා ලිපි ලබා දෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ.
- අන්තර්ජාලයෙන් ලබාගත් ශ්‍රව්‍ය හා දෘශ්‍ය පට කිහිපයක්

**වැඩි දුර ගවේෂණය**

- අන්තර්ජාලය.
- උපදේශාත්මක හා හරවත් ශ්‍රව්‍ය-දෘශ්‍ය කොටස් භාවිතයට යොමු කිරීම

## 21. ඒකකය - සවන් දී නිවැරැදි ව ප්‍රතිචාර දැක්වීම

**7.0 නිපුණතාව**

සවන් දී අර්ථය පැහැදිලි ව හා නිවැරැදි ව අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම**

7.2 ශ්‍රව්‍ය පටවලට හා ශ්‍රව්‍ය-දෘශ්‍ය පටවලට සවන් දී, නරඹා අර්ථාවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද** - 10

**ඉගැනුම් පල**

- ශ්‍රව්‍ය පට සහ ශ්‍රව්‍ය-දෘශ්‍ය පට ශ්‍රවණය කරයි.
- ශ්‍රවණය කොට අර්ථාවබෝධය ලබා අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.
- මතකයෙහි රඳවාගත් පාඨ නිරවද්‍ය ව ප්‍රතිවාචනය කරයි.
- අන්තර්ජාල ඇසුරින් කාලීන සිදුවීම් ඇතුළත් සංස්කෘත ප්‍රවෘත්ති හා වාර්තා වැඩසටහන් ආදිය නැරඹීමට උනන්දු වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සංස්කෘතය ව්‍යවහාරයෙන් තොර බසකැයි පැවසීම මිථ්‍යාවක් බව අන්තර්ජාලය පරිශීලනය කිරීම මඟින් පෙනේ. භාරතයේ සංස්කෘත භාෂාව ව්‍යවහාර භාෂාව වශයෙන් භාවිත කරන ප්‍රදේශ අදටත් දැකගත හැකි ය. ගුවන්විදුලි, රූපවාහිනී නාළිකාවල සංස්කෘතයෙන් ප්‍රවෘත්ති ප්‍රකාශයට පත් වේ. වේදිකා නාට්‍ය, ටෙලි නාට්‍ය, චිත්‍රපට, වාර්තා වැඩසටහන් ආදිය සංස්කෘතයෙන් ඉදිරිපත් වේ. සජීව භාෂාවක සියලු ලක්ෂණ සංස්කෘතය සතු බව මේ අනුව අවබෝධ කළ හැකි ය. අන්තර්ජාලය භාවිතයෙන් සංස්කෘත භාෂාවෙන් රචිත බොහෝ වැඩසටහන් නිරීක්ෂණය කළ හැකි ය.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- අන්තර්ජාලය (WWW.youtube.com ඇසුරින්) පරිශීලනය කිරීමෙන් ශ්‍රව්‍ය හා දෘශ්‍ය නිර්මාණ එකතු කරගත හැකි බව
- එම නිර්මාණ සාවධාන ව ඇසීමටත් අර්ථාවබෝධය කිරීමටත් සැලැස්විය යුතු බව
- එබඳු නිර්මාණ කිරීමට උනන්දුවක් ඇති කළ යුතු බව

**යෝජිත ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- අන්තර්ජාලයට පිවිස සංස්කෘත ගීත ඇතුළු විවිධ නිර්මාණ එකතුවක් පිළියෙළ කිරීමට උපදෙස් දෙන්න.
- එම නිර්මාණ රස වින්දනයට හා අර්ථාවබෝධයට අවස්ථාවක් ලබා දෙන්න.
- නරඹන ලද නිර්මාණයක් පන්ති කාමරය තුළ ප්‍රතිනිර්මාණය කිරීමට සලස්වන්න.
- එම නිර්මාණ නැරඹීමෙන් පසු සංස්කෘත භාෂාධ්‍යයනයට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ ව සිසුන් ලවා අදහස් ප්‍රකාශ කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- ශ්‍රව්‍ය-දෘශ්‍ය නිර්මාණ මැනවින් ශ්‍රවණය කරයි.
- ශ්‍රවණය කොට අර්ථාවබෝධය ලබා අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.
- මතකයෙහි රඳවාගත් පාඨ නිරවද්‍ය ව ප්‍රතිවාචනය කරයි.
- සිත් ගත් සිද්ධියක් රංගනයෙන් ඉදිරිපත් කරයි.

- සංස්කෘතයෙහි අඩංගු ශ්‍රව්‍ය හා දෘශ්‍ය නිර්මාණ සෙවීමට කැමැත්ත පළ කරයි.
- සොයන ලද ශ්‍රව්‍ය හා දෘශ්‍ය පට සාමූහික ව බෙදාගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- පරිගණකය / රූපවාහිනිය
- Video දර්ශන ඇතුළත් තැටි
- Multimedia

**වැඩි දුර ගවේෂණය**

- www.youtube.com

## 22. ඒකකය - ස්වාභාවික පරිසරය

**8.0 නිපුණතාව**

අදාළ සංස්කෘතික පරිසරය හඳුනාගනියි.

**නිපුණතා මට්ටම**

8.1 ස්වාභාවික පරිසරය හඳුනාගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 15

**ඉගෙනුම් පල**

- සංස්කෘත සාහිත්‍ය මූලාශ්‍රය ඔස්සේ සම්භාවිත පරිසරය හඳුනාගැනීමේ පරිචය ලබයි.
- දයාපන්න ඇසකින් ලෝකය අවලෝකනය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

ඍතු, නදී, සාගර, උදය, සන්ධ්‍යා, රාත්‍රි, ස්ත්‍රී, පුරුෂ ආදි වර්ණනා සංස්කෘත සාහිත්‍යයේ දැකිය හැකි ය. ඒවා අධ්‍යයනය කිරීමෙන් භාෂාවබෝධය ලබන අතර ම තමා ජීවත් වන පරිසරය දෙස දයාපන්න දෘෂ්ටියකින් බැලීමට ද යොමු වේ.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ගස්, මල්, ජලය, පියුම්, ගැහැනිය, සුළඟ, සන්ධ්‍යා ආදිය පිළිබඳ වර්ණිත උද්ධෘත අදාළ විෂය ක්ෂේත්‍රයෙන් ම තෝරාගත යුතු බව

  උදා:

  द्रुमाः सपुष्पाः सलिलं सपद्मं स्त्रियः सकामाः पवनः सुगन्धिः ।
  सुखाः प्रदोषाः दिवसाश्च रम्याः सर्वं प्रिये चारुतरं वसन्ते ॥

- අදාළ සාහිත්‍ය ග්‍රන්ථවල විස්තර කෙරෙන ස්වාභාවික පරිසරය පිළිබඳ අවබෝධයක් ලැබිය යුතු බව
- එක් එක් පාරිසරික වෙනස්කම් පිළිබඳ ව වෙන වෙන ම බෙදා සාකච්ඡා කළ යුතු බව
- සොබාදහම හා මිනිසා අතර ඇති අවියෝජනීය සම්බන්ධතාව සංස්කෘත සාහිත්‍යය මඟින් දැකිය හැකි බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- සංස්කෘත සාහිත්‍යය ඇසුරෙන් සම්භාවිත පරිසරය සම්බන්ධ සංස්කෘත - සිංහල නාමාවලියක් පහත සඳහන් පරිදි වගුගත කරන්න.

| ගස් | මල් | නදී | කඳු | ඍතු |
|---|---|---|---|---|
| नीप<br>බක්මී | पद्म<br>පියුම | यमुना<br>යමුනා | हिमालय<br>හිමාලය | वसन्त<br>වසත් |

- ශිෂ්‍යයන් කණ්ඩායම් කිහිපයකට බෙදා ඒ ඒ කණ්ඩායම් ලවා සංස්කෘත ග්‍රන්ථවල එන ඍතු, නදී, සන්ධ්‍යා ආදි වර්ණනා පිළිබඳ පද්‍ය එකතු කරවන්න.
- පරිසරය හා මිනිසා අතර ඇති සබඳතා පිළිබඳ කෙටි දෙසුමක් පවත්වන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සංස්කෘත සාහිත්‍ය මූලාශ්‍රය ඔස්සේ සම්භාවිත පරිසරය හඳුනාගෙන ලියයි.

- ස්වාභාවික පරිසරය කෙරෙහි දයාපන්න ඇසකින්  බලා ප්‍රතිචාර දක්වයි.
- ස්වාභාවික පරිසරයේ ජීවත් වන සත්ත්වයන් හා පවතින වස්තු ආරක්ෂා කිරීම පිළිබඳ ආකල්ප ඇති කරගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- අදාළ සාහිත්‍ය ග්‍රන්ථවලින් පාරිසරික ලක්ෂණ ඉස්මතු වන අවස්ථා දැක්වෙන සටහනක්
- ඍතුවල වෙනස්කම් දැක්වෙන වීඩියෝ දර්ශන තලයක්
- පරිගණකයක්

**වැඩි දුර ගවේෂණය**

- අන්තර්ජාලය

## 23. ඒකකය - සංස්කෘතික පරිසරය

**8.0 නිපුණතාව**

අදාළ සංස්කෘතික පරිසරය හඳුනාගනියි.

**නිපුණතා මට්ටම**

8.2 භාෂාව හා සාහිත්‍යාගත චරිත හඳුනාගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව 15**

**ඉගෙනුම් පල**

- සංස්කෘත සාහිත්‍ය මූලාශ්‍රය ඔස්සේ භාෂාව භාවිත කිරීමේ ශක්‍යතාව ද සාහිත්‍යාගත චරිත හඳුනාගැනීමේ ශක්‍යතාව ද ලබයි.
- සාහිත්‍ය මූලාශ්‍රය ඔස්සේ ඒ ඒ චරිතවලට ආවේණික ලක්‍ෂණ හඳුනාගනිමින් තමා ජීවත් වන සමාජයේ ඇති චරිත හොඳින් අවබෝධ කරගැනීමට හැකියාව ලබයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සාහිත්‍ය මූලාශ්‍රයයන්හි එන භාෂා ශෛලීන් පිළිබඳ අධ්‍යයනය කර එම ශෛලීන් හැදෑරීම වැදගත් වේ. සංස්කෘත සාහිත්‍යයික සමාජය දෙස සානුකම්පික දෘෂ්ටියකින් බලා යහපත, අයහපත වෙන් වෙන් ව හඳුනාගෙන නිවැරැදි ව කටයුතු කරන සම්පූර්ණ මනුෂ්‍යයකු බිහි කිරීමට උපකාර කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පුද්ගල චරිත සංවර්ධනයෙහි ලා සංස්කෘත සාහිත්‍යාගත සංකල්ප අතිශයින් වැදගත් බව
- සාහිත්‍යාගත සංස්කෘතික පරිසරයට අදාළ මූලාශ්‍රයයන් සහ පහත සඳහන් පරිදි එවැනි වෙනත් පාඨ තෝරාගැනීම කළ යුතු බව

උදා:

- चञ्चन् मनोज्ञशफरीरसनाकलापाः पर्यन्तसंस्थितसिताण्डजपङ्क्तिहाराः ।<br>नद्यो विशालपुलिनान्तनितम्बबिम्बाः मन्दं प्रयान्ति प्रमदाः समदा इवाद्य ॥<br>.ऋतुसंहार॰
- याञ्ञा मोघा वरमधिगुणे नाधमे लब्धकामा । .मेघदूत ॰
- इत्येषा व्युपशान्तये न रतये मोक्षार्थगर्भाकृतिः । .सौन्दरनन्द॰ ।
- संयोगो हि वियोगस्य संसूचयति सम्भवम् । .हितोपदेश॰
- यत्र मित्र न वस्तव्यं यत्र नास्ति चतुष्टयम् ।<br>ऋणदाता वैद्यश्च शोत्रियः सजला नदी । .हितोपदेश॰
- आर्तत्राणाय वः शस्त्रं न प्रहर्तुमनागसि । .अभिज्ञानशाकुन्तल ॰

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- සාහිත්‍යාගත පාඨයන්හි අන්තර්ගත උදාර චරිත පිළිබඳ ඉදිරිපත් කර ඇති භාෂා ව්‍යවහාරය පහදාදෙන්න.
- සංස්කෘත සාහිත්‍යාගත චරිත පිළිබඳ ව නිර්මාණාත්මක ලෙස කරුණු ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.
- සමූහ වශයෙන් සාහිත්‍යාගත චරිත පිළිබඳ අධ්‍යයනයක නියැළෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- සාහිත්‍ය මූලාශ්‍රයයන්හි අන්තර්ගත භාෂා ශෛලීන් හඳුනාගෙන ලියා දක්වයි.
- එම භාෂා ශෛලීන් වෙන් වෙන් වශයෙන් වගුගත කරයි.
- නිර්දිෂ්ට කෘතිවල එන අධීත චරිත තුළ ඇති ගුණාංග චරිතාබද්ධ කරයි.
- ග්‍රන්ථාගත වැදගත් තොරතුරු ඇසුරින් ලිපි සම්පාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- විවිධ භාෂා ශෛලීන් වෙන් කරන ලද වගුවක්
- සාහිත්‍යාගත චරිත ආශ්‍රයෙන් අඳින ලද සිතුවම් කිහිපයක්
- සාහිත්‍යාගත චරිත විස්තර කෙරෙන ලිපි කිහිපයක්

**වැඩි දුර ගවේෂණය :**

- අන්තර්ජාලය

## 24. ඒකකය - නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය

**9.0 නිපුණතාව**

නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය කරයි.

**නිපුණතා මට්ටම**

9.1 නිවැරැදි අර්ථය ලැබෙන සේ සංස්කෘත භාෂාවෙන් මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** - 15

**ඉගැනුම් පල**

- නිර්දිෂ්ට කෘතිවලින් උපුටාගත් ගද්‍ය-පද්‍ය පාඨ නිවැරැදි ලෙස මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.
- අනිර්දිෂ්ට කෘතිවලින් උපුටා ගත් ගද්‍ය-පද්‍ය පාඨ නිවැරැදි ලෙස මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.
- උපුටාගත් පාඨවල දුරවබෝධ වචන ලැයිස්තු ගත කරයි.
- ලැයිස්තු ගත කළ දුරවබෝධ වචනවලට අර්ථ සපයයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

භාෂාවක ප්‍රවීණතාව මැනීම සඳහා පරිවර්තන කාර්යය මහගු මිනුම් දණ්ඩක් වනු ඇත. එම නිසා නිර්දිෂ්ට-අනිර්දිෂ්ට භේදයකින් තොර ව පරිවර්තන කාර්යයෙහි හැකියාව උපදවාගැනීමට මෙය මහගු පිටිවහලක් වනු ඇත.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සංකීර්ණ සංස්කෘත වාක්‍ය මාධ්‍ය භාෂාවට පරිවර්තනය කිරීමේ දී පැන නැගිය හැකි ගැටලු හඳුනාගැනීමට මඟ පෑදිය යුතු බව
- මේ සඳහා නිර්දිෂ්ට හෝ අනිර්දිෂ්ට හෝ කෘතිවලින් විවිධ සංකීර්ණ වාක්‍ය කිහිපයක් නිදසුන් වශයෙන් පරිවර්තනය කර පෙන්විය යුතු බව
- එහි දී පැන නගින ගැටලු විසඳීමේ ක්‍රමෝපායයන් දැක්වීම සඳහා එබඳු ම සංකීර්ණ වාක්‍ය පරිවර්තනය කිරීමට අභ්‍යාස දිය යුතු බව
- විභක්ති ප්‍රයෝග හා කාරක ප්‍රයෝග විශ්ලේෂණය කරමින් වාක්‍ය රටා අවබෝධ කරගැනීමට මඟ පෑදිය යුතු බව
- හ්‍රස්ව හෝ දීර්ඝ හෝ සමාසෝපයුක්ත රචනා ප්‍රයෝග මඟින් සංකීර්ණ වාක්‍ය ගොඩනැඟෙන අයුරු ප්‍රකට කළ යුතු බව
- සම්බන්ධීකාරක හෝ සාපේක්ෂක හෝ පද භාවිතය සංකීර්ණ වාක්‍ය නිර්මාණය සඳහා උපකාර වන බව තේරුම් ගැනීමට මඟ පෑදිය යුතු බව
- ගද්‍යයෙන් හා පද්‍යයෙන් ඉදිරිපත් කෙරෙන සංකීර්ණ ප්‍රකාශවල උක්තාඛ්‍යාත පද සම්බන්ධයත් විශේෂණ-විශේෂ්‍ය සමවායයත් ග්‍රහණය කරගනිමින් පරිවර්තනය කිරීමේ හැකියාව වර්ධනය කළ යුතු බව
- තෝරාගත් එවැනි පාඨ පරිවර්තනය සිසුන් සමඟ එක් ව සිදු කළ යුතු බව
- සංස්කෘත භාෂාවේ ව්‍යාකරණ රීති හා සම්ප්‍රදායයන් මනා කොට හඳුනාගනිමින් මාධ්‍ය භාෂාවේ ද එම අංග උල්ලංඝනය නොවන පරිදි පරිවර්තනය කිරීමේ හැකියාව ලබාගැනීමට මඟ පෑදිය යුතු බව

**යෝජිත ඉගැනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- පරිවර්තනය සඳහා සුදුසු පාඨ කිහිපයක් තෝරා දී ශිෂ්‍යයන් පරිවර්තන කාර්යයෙහි යොදවන්න.
- පරිවර්තනය සඳහා සුදුසු පාඨ පහක් තෝරාගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දී එම පාඨ පරිවර්තනයෙහි ලා ශිෂ්‍යයන් යොදවන්න.
- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම් කොට පරිවර්තන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පූර්වෝක්ත ක්‍රියාකාරකම් ආශ්‍රයයෙන් පොදු ගුණදොස් විවේචනයක යෙදෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- උද්ධෘත පාඨයක් ශබ්ද නගා කියවයි.
- ගද්‍ය හෝ පද්‍ය හෝ කොටසක අන්වය ලියා දක්වයි.
- උපුටාගත් පාඨයේ වචන තුළ ඇති විභක්ති ප්‍රයෝග වෙන් කරයි.
- දෙන ලද ඡේදයක දුරවබෝධ වචන වෙන් කර දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ
- රූප සටහන් / වගු / විභාග ප්‍රශ්න පත්‍ර
- අන්තර්ජාල පහසුකම්

වැඩි දුර ගවේෂණය


- කරුණාතිලක, ඩබ්.එස්.: සුරභාරතී, ගොඩගේ ප්‍රකාශන, 2005.
- සංස්කෘත ශික්‍ෂකය 1, 2, 3, පූජ්‍ය ආනන්ද මෛත්‍රෙය නාහිමි, බළන්ගොඩ.ඃනුගේගොඩ, 2002.

## 25. ඒකකය - මාධ්‍ය භාෂාගත නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය

**9.0 නිපුණතාව**

නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨ පරිවර්තනය කරයි.

**නිපුණතා මට්ටම**

9.2 මාධ්‍ය භාෂාවෙන් සංස්කෘත භාෂාවට ව්‍යාකරණානුකූල ව පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** - 15

**ඉගෙනුම් පල**

- මාධ්‍ය භාෂාවෙන් දෙනු ලබන සරල ඡේදයක් නිවැරැදි ව සංස්කෘත භාෂාවට පරිවර්තනය කරයි.
- පරිවර්තන කාර්යයෙහි දී සංස්කෘතයට ආවේණික පද ප්‍රයෝග, වාක්‍ය ප්‍රයෝග හා භාෂා ප්‍රයෝග භාවිත කරයි.
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාඨවල එන දුරවබෝධ වචනවලට ව්‍යාකරණ විභාග සපයයි.
- උපුටාගත් ගද්‍ය-පද්‍ය පාඨ ව්‍යාකරණානුකූල ව සංස්කෘත භාෂාවට පරිවර්තනය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

සිසුන්ගේ භාෂා ප්‍රවීණතාව දැනගත හැකි වන සේ මාධ්‍ය භාෂාවෙන් සංස්කෘත භාෂාවට පරිවර්තනය කිරීම මෙහි දී සිදු විය යුතු ය. එහි දී කෙටි වාක්‍ය භාවිත කොට උක්තාඛ්‍යාත පද සම්බන්ධයට අවධානය යොමු කරමින් එම කාර්යය සිදු කිරීම වැදගත් ය. අනතුරු ව ඉහත ආකාරයට නිරන්තර අභ්‍යාසවලට සිසුන් උනන්දු කරවන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- මාධ්‍ය භාෂාවෙන් ඇති සංකීර්ණ වාක්‍ය සංස්කෘත භාෂාවට පරිවර්තනය කිරීම (මාධ්‍ය භාෂාවෙන් කියැවෙන අදහස සංස්කෘත භාෂා සම්ප්‍රදායයට ගැළපෙන පරිදි පරිවර්තනය කළ යුතු බව
- සංස්කෘතයෙහි ප්‍රචලිත සදුක්ති ආශ්‍රයෙන් මාධ්‍ය භාෂාවෙන් වගන්ති සකස් කොට ඒවා සංස්කෘතයට පරිවර්තනය කිරීම සඳහා ශිෂ්‍යයන් යෙදවිය යුතු බව
- මාධ්‍ය භාෂාවේ ඇති සරල කතන්දර සංස්කෘතයට පරිවර්තනය කිරීමට පෙලඹවිය යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- මාධ්‍ය භාෂාවෙන් සංකීර්ණ වාක්‍ය 10ක් ශිෂ්‍යයන් ලවා නිර්මාණය කරවන්න.
- මාධ්‍ය භාෂාවෙන් සරල කතන්දරයක් ශිෂ්‍යයන් ලවා නිර්මාණය කරවන්න.
- (ශිෂ්‍ය නිර්මිත) ඒවා ඔවුන් ලවා ම සංස්කෘතයට නැඟීමට සලස්වන්න.
- කණ්ඩායම් වශයෙන් පරිවර්තනය කරන ලද පාඨ ඉදිරිපත් කරවන්න.
- එසේ ඉදිරිපත් කරන ලද පරිවර්තිත පාඨවල ගුණදොස් සාකච්ඡා කරන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- මාධ්‍ය භාෂාගත ඡේදයක් සංස්කෘතයට ආවේණික ශෛලියකින් පරිවර්තනය කරයි.
- දෙනු ලබන දුරවබෝධ වචන සඳහා ව්‍යාකරණ විභාග සපයයි.
- පද ප්‍රයෝග, වාක්‍ය ප්‍රයෝග හා භාෂා ප්‍රයෝග විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථ
- විභාග ප්‍රශ්න පත්‍ර
- අන්තර්ජාල පහසුකම්

**වැඩිදුර ගවේෂණය**

- සංස්කෘත ශික්‍ෂකය 1, 2, 3, පූජ්‍ය ආනන්ද මෛත්‍රෙය නාහිමි, බළන්ගොඩ:නුගේගොඩ, 2002

## 26. ඒකකය සංස්කෘත මහාකාව්‍ය සාහිත්‍යය

**10.0 නිපුණතාව**

සංස්කෘත සාහිත්‍යාගත කෘති හා කතුවරුන් පිළිබඳ අවබෝධයක් ලබයි.

**නිපුණතා මට්ටම**

10.1 අශ්වඝෝෂ හිමි, කාලිදාස සහ කුමාරදාස යන කවීන්ගේ මහාකාව්‍ය කෘති හඳුනාගනියි.

**කාලච්ඡේද 07**

**ඉගෙනුම් පල**

- අශ්වඝෝෂ හිමි, කාලිදාස හා කුමාරදාස යන මහාකාව්‍ය රචකයන් හඳුනාගනියි.
- ඔවුන්ගේ මහාකාව්‍ය කෘති හඳුනාගනියි.
- අන්තර්ගතය, රචනා ශෛලිය හා මහාකාව්‍ය ලක්ෂණ භාවිතය ආදිය ඇසුරින් ඔවුනොවුන් අතර පවතින සම-විෂමතා හඳුනාගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

භාරතීය වශයෙන් ද ශ්‍රී ලාංකේය වශයෙන් ද මහාකාව්‍ය රචනයෙහි අනන්‍යතාව හඳුනාගැනීමෙහි ලා අශ්වඝෝෂ, කාලිදාස හා කුමාරදාස යන රචකයන්ගේ මහාකාව්‍ය නිර්මාණ විෂයයෙහි ඇති කරගන්නා නිපුණත්වය බෙහෙවින් අත්‍යවශ්‍ය වෙයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- රචකයන් තිදෙනා පිළිබඳ කාලය හා ජීවන තොරතුරු සැකෙවින් සාකච්ඡා කළ යුතු බව
- නිර්දිෂ්ට මහාකාව්‍යයන්හි වස්තුවිෂය සැකෙවින් දැනගත යුතු බව
- මහාකාව්‍ය ලක්ෂණ හා ඒවා භාවිත කොට ඇති ආකාරය සාකච්ඡා කළ යුතු බව
- රචකයන් තිදෙනා අතර පවත්නා සමානතා හා අසමානතා පිළිබඳ ව හැඳින්විය යුතු බව
- සංස්කෘත මහාකාව්‍ය ක්ෂේත්‍රය විෂයයෙහි රචකයන් තිදෙනාගේ දායකත්වය ප්‍රමාණ කළ යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- අශ්වඝෝෂ, කාලිදාස, කුමාරදාස යන මහාකාව්‍ය රචකයන්ගේ වැදගත්කම, ඔවුන්ගේ නිර්මාණ ආශ්‍රයයෙන් සාකච්ඡා කරන්න.
- මේ රචකයන් තිදෙනාගේ මහාකාව්‍ය මඟින් සංස්කෘත මහාකාව්‍ය සාහිත්‍යයෙහි එකිනෙකට වෙනස් යුග තුනක් ප්‍රකට කරන බව විස්තර කරන්න.
- ඉහත රචකයන් තිදෙනාගේ මහාකාව්‍ය ආශ්‍රයයෙන් මහාකාව්‍ය ලක්ෂණ හා ඒවාට උදාහරණ සහිත ව වාර්තාවක් පිළියෙළ කරවන්න.

**තක්සේරුව හා ඇගයීම**

- අශ්වඝෝෂ ආදි මහාකාව්‍ය කතුවරුන් පිළිබඳ තොරතුරු සොයා වෙන වෙන ම ලියා දක්වයි.
- මෙම කෘතිවල මහාකාව්‍ය ලක්ෂණ අන්තර්ගත බව කියයි; ලියා දක්වයි.

**වැඩි දුර ගවේෂණය**

- මහාචාර්ය ජයදේව තිලකසිරි, සංස්කෘත කාව්‍ය සාහිත්‍යය

## 27. ඒකකය - ඛණ්ඩකාව්‍ය සාහිත්‍යය

**10.0 නිපුණතාව**

සංස්කෘත සාහිත්‍යාගත කෘති හා කතුවරුන් පිළිබඳ අවබෝධයක් ලබයි.

**නිපුණතා මට්ටම**

10.2 කාලිදාසයන්ගේ හා ජයදේවයන්ගේ ඛණ්ඩකාව්‍ය හඳුනාගනියි

**කාලච්ඡේද 07**

**ඉගෙනුම් පල**

- ඍතුසංහාර, මේඝදූත, ගීතගෝවින්ද යන ඛණ්ඩකාව්‍ය කෘති හා ඒවායේ කර්තෘ, කාලය හා අන්තර්ගතය පිළිබඳ ව සැකෙවින් හඳුනාගනියි.
- සංස්කෘත සාහිත්‍යයේ ඒවාට හිමි ස්ථානය පිළිබඳ ව හඳුන්වා දීමට සමත් වෙයි.
- ඛණ්ඩකාව්‍ය රචකයන් වශයෙන් කාලිදාස, ජයදේව යන දෙදෙනාගේ කවිත්වය සැකෙවින් හඳුනාගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

ඛණ්ඩකාව්‍ය ප්‍රභේදය සංස්කෘත සාහිත්‍ය වෘක්ෂයෙහි එක් ශාඛාවකි. ඛණ්ඩකාව්‍යයක ලක්ෂණ සමග එම සාහිත්‍ය ප්‍රභේදය හඳුනාගැනීම සංස්කෘත සාහිත්‍යයෙහි අනන්‍යතා ලක්ෂණ අවබෝධ කරගැනීමෙහි ලා මහත් සේ උපකාර වෙයි. කාව්‍ය විලාස වශයෙන් මෙන් ම රස විලාස වශයෙන් ද ඛණ්ඩකාව්‍ය විශේෂාංගය ප්‍රමුඛ ස්ථානයක පැවතීම එහි ලා එක් හේතුවකි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ඍතුසංහාරය හා මේඝදූතය කාලිදාස විසින් නිර්මාණය කරන ලද ඛණ්ඩකාව්‍ය දෙකක් බව
- ඍතුසංහාරය භාරතීය පරිසරයට නොහොත් පෙරදිග ව්‍යවහාරයට ආවේණික වර්ෂා, ශරත්, හේමන්ත, ශිශිර, වසන්ත හා ග්‍රීෂ්ම යන ඍතු පිළිබඳ තත්ත්වඥානය ලබා දෙන රසභාවපූර්ණ කෘතියක් බව
- ලෝකයේ ප්‍රථම සන්දේශකාව්‍යය වශයෙන් සම්භාවිත මේඝදූතය පූර්වමේඝ, අපරමේඝ යැ යි කාණ්ඩ ද්වයයකින් ද පිළිවෙළින් 66, 55ක් වශයෙන් වන පද්‍ය 121කින් ද සමුපේත වන බව
- සාහිත්‍ය ලෝකයේ ගීතමය කාව්‍යය වශයෙන් සම්භාවනාවට පත් ගීතගෝවින්දය සර්ග 12කින් සමන්විත වන බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- ඍතුසංහාරයෙහි ඍතු සයෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ පහ බැගින් වන වාර්තාවක් සූදානම් කරවන්න.
- මේඝයෙහි ගමන් මග පිළිබඳ සිතියමක් සකස් කරවන්න.
- 'ජයදේව කවියා සතු සංගීත රසිකත්වය' යන මැයෙන් නිර්මාණ එකතුවක් කරවන්න.

**තක්සේරුව හා ඇගයීම**

- ඛණ්ඩකාව්‍ය කෘතිවල කර්තෘ, කාලය හා අන්තර්ගතය පිළිබඳ කෙටි සටහනක් ලියයි.
- කාලිදාසයන්ගේ හා ජයදේවයන්ගේ ඛණ්ඩ කාව්‍ය කෘති පිළිබඳ පුවත්පත් ලිපි සපයයි.
- අධීත ඛණ්ඩකාව්‍ය පිළිබඳ කෙටි විස්තර කිරීමක් සිදු කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- අනතර්ගත කරුණු සහිත ව සකසන ලද පොත් පිංචක්
- ගායනය කර සකසන ලද ශ්‍රව්‍ය සංයුක්ත තැටියක්

**වැඩිදුර ගවේෂණය**

- වාල්මීකි රාමයණය, අනු - ඩබ්. ඒ. සිල්වා, මාතර, 1961

## 28. ඒකකය - සංස්කෘත ශතකකාව්‍ය සාහිත්‍යය

**10.0 නිපුණතාව**

සංස්කෘත සාහිත්‍යාගත කෘති හා කතුවරුන් පිළිබඳ අවබෝධයක් ලබයි.

**නිපුණතා මට්ටම**

10.3 ශතක සාහිත්‍යය පිළිබඳ ව දැනුමක් ලබාගනියි

**කාලච්ඡේද :** 06

**ඉගෙනුම් පල**

- ශතක සාහිත්‍යය පිළිබඳ ව හැඳින්වීමට සමත් වෙයි.
- ශතකකාව්‍ය ආකෘතිය පිළිබඳ ව හැඳින්වීමට සමත් වෙයි.
- ශතකකාව්‍යයක විවිධ තේමා යටතේ සංග්‍රහ වන ආප්ත ගෙනහැර පෑමෙහි සමත් වෙයි.
- ශතකකාව්‍යවල සදුපදේශ ප්‍රායෝගික ජීවිතය සමඟ සම්බන්ධ කරගැනීමට සමත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

උපදේශකාව්‍ය සාහිත්‍යය හැරුණු විට පාඨක ලෝකයා වෙත සදුක්ති හෙවත් ආප්තදානය කරන සාහිත්‍යය වන්නේ ශතකකාව්‍ය සාහිත්‍යය යි. රචනා ආකෘතික අනන්‍යතාවකින් ශෝභමාන වන ශතකකාව්‍ය සාහිත්‍යය පුද්ගල ධර්ම, සමාජ ධර්ම හා ලෝක ධර්ම හා බැඳි විවිධ විෂයයන් පිළිබඳ දැනුම සම්ප්‍රේෂණය කරන ඥානමාර්ගයක් වශයෙන් ද සමාජ සංස්ථිතිය, යහ පැවැත්ම පිළිබඳ ව්‍යවස්ථා මාලාවක් වශයෙන් ද හැඳින්විය හැකි ය. ශතකකාව්‍ය සාහිත්‍යය හැදෑරීමෙන් දෛනික ජීවිතයට ලැබෙන වටිනාකම් පිළිබඳ ව කරුණු පැහැදිලි කරදීම වැදගත් වේ.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ශතකකාව්‍ය ලක්ෂණ හඳුනාගත යුතු බව
- ශතකකාව්‍යයන්හි අන්තර්ගත තේමා පැහැදිලි කරගත යුතු බව
- භාරතීය ශතකකාව්‍යයන් හා ශ්‍රී ලාංකික ශතකකාව්‍යයන් අතර පවත්නා සම-විෂමතා සමාලෝචනය කළ යුතු බව
- පුද්ගල හා සමාජ සංවර්ධනය විෂයයෙහි ශතකකාව්‍යයන්හි උපයෝගිත්වය අවබෝධ කරගැනීමට ඉඩ සැලසිය යුතු බව
- රසාස්වාදය සම්බන්ධයෙන් ශතකකාව්‍යවල දායකත්වය විමර්ශනය කළ යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- ශතකකාව්‍ය ලක්ෂණ සැකෙවින් දැක්වෙන වාර්තාවක් පිළියෙළ කරවන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට බෙදා භාරතීය හා ශ්‍රී ලාංකික ශතකකාව්‍යයන්හි සම-විෂමතා ලැයිස්තුවක් සූදානම් කරවන්න.
- ශතකකාව්‍යයන්හි විෂය විවිධත්වය පිළිබඳ රචනයක් ලියවන්න.
- ශතකකාව්‍යයන්හි සමාජ උපයෝගිත්වය යන මැයෙන් කණ්ඩායම් වාර්තාවක් සම්පාදනය කරවන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- ශතකකාව්‍ය යනු කුමක් දැයි පැහැදිලි කරයි.
- ශතකකාව්‍ය ආකෘතිය පිළිබඳ දැන ඉදිරිපත් කරයි.

- ශතකකාව්‍යයක විවිධ තේමා යටතේ සංග්‍රහ වන ආප්ත ගෙනහැරපාමින් කථාවක් කියයි.
- විවිධ ශතකකාව්‍ය සොයා කියවයි.
- දෛනික ජීවිතයට අදාළ ශතක කාව්‍යයන්හි අන්තර්ගත ශ්ලෝක කියවයි; ලියයි; ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- ශතකකාව්‍ය සම්බන්ධ ව ඇති ශ්‍රව්‍ය - දෘශ්‍ය සංයුක්ත තැටි

**වැඩි දුර ගවේෂණය**

- සංස්කෘත කාව්‍ය සාහිත්‍යය, තිලකසිරි, ජේ.ඃ ගොඩගේ, 1999.

## 29. ඒකකය - සංස්කෘත උපදේශ කථා සාහිත්‍යය සහ නාට්‍ය සාහිත්‍යය

**10.0 නිපුණතාව**

සංස්කෘත සාහිත්‍යාගත කෘති හා කතුවරුන් පිළිබඳ අවබෝධයක් ලබයි.

**නිපුණතා මට්ටම**

10.4 උපදේශ කථා සාහිත්‍යය පිළිබඳ ව අවබෝධයක් ලබාගනියි.

10.5 සංස්කෘත නාට්‍ය සාහිත්‍යය පිළිබඳ සාමාන්‍ය දැනුමක් ලබාගනියි.

**කාලච්ඡේද :** 10

**ඉගෙනුම් පල**

- උපදේශ කාව්‍ය සාහිත්‍යය හඳුනාගනියි.
- උපදේශ රචනා ආකෘතිය හඳුනාගනියි.
- පඤ්චතන්ත්‍ර, හිතෝපදේශ යන ග්‍රන්ථවල කර්තෘ, කාලය ආදි තොරතුරු සැපයීමට සමත් වෙයි.
- සංස්කෘත සන්දර්භය යටතේ නාට්‍යය යන්න නිර්වචනය කිරීමට සමත් වෙයි.
- සංස්කෘත නාට්‍යයේ අනන්‍යතා ලක්ෂණ හැඳින්වීමට සමත් වෙයි.
- සංස්කෘත ප්‍රධාන නාට්‍ය රචකයන් හා ප්‍රධාන නාට්‍ය නිර්මාණ නම් කිරීමට සමත් වෙයි.
- භාස, කාලිදාස හා ශ්‍රී හර්ෂ යන කවීන් හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ ව සැකෙවින් හැඳින්වීමට සමත් වෙයි.
- සංස්කෘත නාට්‍ය සාහිත්‍යයේ අගය පෙන්වාදීමට සමත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

බෞද්ධ ජාතකකථා කලාව සම්ප්‍රදායගත පුරාවෘත්ත මෙන් ම ගුණාඪ්‍යගේ බෘහත්කථාව, සෝමදේවගේ කථාසරිත්සාගරය ආදි මූලාශ්‍රයයන්ගේ ආභාසය ලබමින් ගොඩනැගෙන සංස්කෘත උපදේශ කාව්‍ය සාහිත්‍යය ලෝකයේ බොහෝ රටවල ප්‍රචලිත ව ජනාදරයට පත් සාහිත්‍යයකි. පුරුෂත්වාරෝපිත වන සතුන් උපයෝගි කොටගනිමින් ඉදිරිපත් කෙරෙන සිද්ධි ද ඒ හා බැඳි සදුපදේශ ද සාර්වකාලීන වශයෙන් වැදගත් වීම ඊට එක් හේතුවකි.

ග්‍රීක නාට්‍යය හැරුණු විට වටිනාකමින් ඉහළ ම නාට්‍ය සාහිත්‍යය වීමේ ගරුත්වය හිමි වන්නේ සංස්කෘත නාට්‍ය සාහිත්‍යයට ය. රචකයන්ගේ පූර්ණත්වය ද නිර්මාණ පිළිබඳ සංඛ්‍යාත්මක ප්‍රමාණය ද සාහිත්‍යාත්මක විශිෂ්ටත්වය ද අතින් සංස්කෘත නාට්‍ය සාහිත්‍යය ලොව කිසි දු සාහිත්‍යයකට නොදෙවැනි වෙයි. නාට්‍යධර්මී සම්ප්‍රදායය ගුරු කොටගනිමින් බිහි වන සංස්කෘත නාට්‍ය නිර්මාණයක රංග ශිල්පීය ලක්ෂණ, භාෂා සාහිත්‍යය, චරිත නිරූපණය, අභිනය සේවනය හා භාවනිරූපණය අතිශයින් දියුණු මට්ටමක පවති. භාස, කාලිදාස හා ශ්‍රී හර්ෂ සංස්කෘත නාට්‍ය සාහිත්‍යයේ ක්‍රම විකාශයේ වැදගත් අවස්ථා නියෝජනය කරති.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- විෂ්ණුශර්මන් හා පඤ්චතන්ත්‍රය හඳුනාගැනීමට මඟ පෑදිය යුතු බව
- නාරායණශර්මන් හා හිතෝපදේශය හඳුනාගැනීමට මඟ පෑදිය යුතු බව
- උපදේශකාව්‍ය ශෛලිය හා ඒවායේ රචනා ශෛලිය හඳුනාගැනීමට මඟ පෑදිය යුතු බව
- චරිත සංවර්ධනයට හා සමාජ සංවර්ධනයට උපදේශකාව්‍යයන්ගේ උපයෝගිත්වය සිදු විය යුතු බව

- උපදේශකාව්‍ය නායකයන් හා සමාජ චරිත අතර ඇති සම්බන්ධය සමාලෝචනය කිරීමට ඉඩ සැලසිය යුතු බව
- නාට්‍යය යන්න නිර්වචනය කරමින් සංස්කෘත නාට්‍ය සාහිත්‍යයෙහි විශේෂ ලක්ෂණ අවබෝධ කරගැනීමට මඟ පෑදිය යුතු බව
- භාස, කාලිදාස හා ශ්‍රී හර්ෂ යන නාට්‍ය රචකයන්ගේ නිර්මාණ හඳුනාගැනීමට හා ඇගයීමට මඟ පෑදිය යුතු බව
- සංස්කෘත නාට්‍ය සාහිත්‍ය ඉතිහාසයේ ක්‍රම විකාශයේ සුවිශේෂ අවස්ථා තුනක් ඉහත රචකයන් තිදෙනා මඟින් නිරූපණය වන බව අවබෝධ වීමට ඉඩ සැලැස්විය යුතු බව

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමය**

- ඉහත සඳහන් උපදේශ කාව්‍ය ද්වයයෙහි කර්තෘ, කාලය, අන්තර්ගතය, ප්‍රධාන තේමාව හා චරිත පිළිබඳ වාර්තාවක් සූදානම් කරවන්න.
- උගත්කම, මිත්‍රත්වය, කෞශල්‍යය, නීතිය හා සදාචාරය යන ශීර්ෂ යටතේ එක් ග්‍රන්ථයකින් උපදේශ පද්‍ය දෙක බැගින් වන සේ ග්‍රන්ථ ද්වයයෙන් එක් ශීර්ෂයකට පද්‍ය 4ක් වන පරිදි පද්‍ය එකතුවක් කරවන්න.
- 'උපදේශ කාව්‍ය හා රාජ්‍ය පාලනය' යන මැයෙන් වාර්තාවක් සපයන්න.
- ඉහත සඳහන් රචකයන් තිදෙනාගේ කාලය හා නාට්‍ය කෘති පිළිබඳ ලේඛනයක් සූදානම් කරවන්න.
- එම රචකයන් තිදෙනාගේ කැමති නාට්‍ය නිර්මාණ තුනක් තෝරාගෙන ඒ ආශ්‍රයයෙන් 'සංස්කෘත නාට්‍ය නිර්මාණයක රචනා ආකෘතිය' යන මැයෙන් දළ සටහනක් පිළියෙළ කරවන්න.
- 'සංස්කෘත නාට්‍ය සාහිත්‍යයේ සුවිශේෂ ලක්ෂණය' යන මැයෙන් රචනයක් ලියවන්න. ඉහත රචකයන්ගේ නාට්‍ය කෘතිවල නායක-නායිකා චරිත වෙන් වෙන් ව නම් කොට දැක්වෙන ලැයිස්තුවක් පිළියෙළ කිරීමට උපදෙස් දෙන්න.

**තක්සේරුව හා ඇගැයීම**

- උපදේශකාව්‍ය සාහිත්‍යය හඳුනාගෙන කියයි**.** ලියයි.
- උපදේශ රචනා ආකෘතිය හඳුනාගෙන ලියයි.
- සංස්කෘත නාට්‍යයේ අනන්‍යතා ලක්ෂණ හඳුන්වාදෙමින් කථාවක් ඉදිරිපත් කරයි.
- ප්‍රකට සංස්කෘත නාට්‍ය රචකයන් හා ප්‍රකට නාට්‍ය නිර්මාණ වෙන් වෙන් වශයෙන් වර්ගීකරණය කර පෙන්වයි.
- භාස, කාලිදාස හා ශ්‍රී හර්ෂ යන කවීන් හා ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ ව සැකෙවින් හැඳින්වීමට සමත් වෙයි.
- සංස්කෘත නාට්‍ය සාහිත්‍යයේ අගය පෙන්වා දීමට ලිපි ලියා ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- උපදේශාත්මක කතා ඇතුළත් සිතුවම් කිහිපයක්
- අන්තර්ජාලය තුළ ඇති පඤ්චතන්ත්‍ර ආදි කතා සහිත වීඩියෝ දර්ශන
- නාට්‍ය කොටස් ඇතුළත් දර්ශන සහිත දෘශ්‍ය සංයුක්ත තැටි
- නිර්දිෂ්ට කෘති

**වැඩි දුර ගවේෂණය**

- සංස්කෘත නාට්‍ය සාහිත්‍යය, තිලකසිරි, ජයදේව.: කොළඹ, 1961.

# පාසල පදනම් කරගත් තක්සේරුකරණය

## පාසල පදනම් කරගත් තක්සේරුකරණය හැඳින්වීම

නිපුණතා පාදක විෂයමාලාව හඳුන්වා දීමේ දී ඔබ අතට පත් කරනු ලැබ මෙතෙක් ඔබ පරිශීලනය කළ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙන් පාසල පදනම් කරගත් තක්සේරුකරණය පිළිබඳ ව මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෝපදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදාගත යුතු බවත් සැම ගුරුවරයකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නො වේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත් ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත්වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීප ව සිටිමින්, ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන, ඒවාට පිළියම් යොදමින්, සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කරගැනීමට යොදාගත හැකි වැඩ පිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් මගින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබාදෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කරගනු ලැබූ ඇත් දැයි තහවුරු කරගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබාදිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ ප්‍රබලතා හා දුබලතා අනාවරණය කොටගෙන ඒවා වැඩි දියුණු කිරීම ඉදිරි පෝෂණයෙන් අපේක්ෂිත ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරින් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් වූයේ දැයි හඳුනාගැනීම අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු ය. මෙ සඳහා යොදාගත හැකි හොඳ ම ක්‍රමය වන්නේ පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමය යි.

යථෝක්ත අරමුණ සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් ක්‍රියාවලියත් සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් කාර්යක්ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම්-ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදාගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදාගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් මනා ව දැනුම්වත් වී ඇතැයි අපේක්ෂා කෙරේ.

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්ෂණ
4. ගවේෂණ
5. නිරීක්ෂණ
6. ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම

7. ක්ෂේත්‍ර චාරිකා
8. කෙටි ලිඛිත පරීක්ෂණ
9. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම් 14. කථනය
15. ස්වනිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම්
18. ද්විත්ව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරත්මක වැඩ සටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ඡා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

සම්බන්ධයෙන් සෑම විෂය ඒකකයකට ම සියලු ඇගයීම් ක්‍රම යොදාගත යුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරාගැනීමට ගුරුවරුන් දැනුම්වත් විය යුතු ය. වග බලාගත යුතු ය. එහි දී පහත වගුවෙහි දැක්වෙන ආකාරයට උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. පාසල් වාරය ඃ- පළමු වාරය
2. ආධාරක අංකය ඃ- 01
3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම ඃ- 01.02
4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය ඃ- වර්ණමාලාවේ ප්‍රභේද
5. ආධාරකයේ ස්වභාවය ඃ- පැවරුම්
6. ආධාරකයේ අරමුණු ඃ-

- දේවනාගරී වර්ණමාලාවේ සියලු ප්‍රභේද ඇතුළත් වන සේ වගුවක් සකස් කිරීම
- සිසුන්ට දේවනාගරී වර්ණමාලාවේ සියලු ප්‍රභේද පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇති කිරීම

7. ආධාරකය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස් ඃ-

- නිර්ණායකවලට අදාළ ව පැවරුම සිදු කිරීමට අවශ්‍ය උපදෙස් පන්තියේ සිසුන්ට ලබා දෙන්න.
- පැවරුම සිදු කිරිමට නිශ්චිත කාල රාමුවක් ලබාදෙන්න.
- අදාළ නිර්ණායකයන්ට ලකුණු ලබා දෙන්න.

සිසු උපදෙස් ඃ-

- මාතෘකාවට අදාළ ව පැවරුම සිදු කරන ආකාරය පිළිබඳ ව ගුරුවරයාගෙන් උපදෙස් ලබාගන්න.
- නිර්ණායක මැනවින් තේරුම්ගෙන උසස් ලෙස පැවරුම නිම කරන්න.

| නිර්ණායකය<br><br>සිසුන්ගේ නම් | මාතෘකාවට අදාළ බව | කරුණුවල නිවැරැදි බව හා පැහැදිලි බව | ප්‍රභේදගත කාරණය | දත්තවල ප්‍රමාණාත්මක බව | නිර්මාණාත්මක බව හා නිමාව | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1<br><br>2<br><br>3 | | | | | | |

**ලකුණු පරාසය**

- ඉතා හොඳ යි 04
- හොඳ යි 03
- මධ්‍යස්ථ යි 02
- සංවර්ධනය විය යුතු යි 01

මුලින් ලකුණු 20ක් ප්‍රදානය කොට දෙවනු ව එය දෙකෙන් බෙදා අවසාන ලකුණු සටහන් කළ යුතු ය. ශිෂ්‍යයා ලබාගත් ලකුණු ඔත්තේ සංඛ්‍යාවක් නම් දෙකෙන් බෙදූ විට ඉතිරියක් වන නිසා එය ධනාත්මක අගයකින් පූර්ණ සංඛ්‍යාවට වටයන්න. මේ ලකුණු ඇසුරෙන් ශිෂ්‍ය නිපුණතා මට්ටම තීරණය කෙරේ.

9-10 විශිෂ්ට මට්ටමේ නිපුණතාව

8- ඉහළ මට්ටමේ නිපුණතාව

6-7 සම්මාන මට්ටමේ නිපුණතාව

4-5 ආසන්න මට්ටමේ නිපුණතාව

---- නිපුණතාවට ළඟා නොවූ

මෙය නිදර්ශක ආධාරකයක් පමණි. ගුරුවරයාට ස්වාධීන ව ආධාරක සැලසුම් සකස් කරගත හැකි ය.